# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## *WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2018 මාර්තු 20 වන අඟහරුවාදා**
2018 தை 20 செவ்வாய்க் கிழமை
Tuesday 20th March 2018

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.39 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.39 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.39 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා / දිවුරුම්
MAKING AFFIRMATION/TAKING OATHS BY NEW MEMBERS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"එස්. කුහවරදන් ගරු මන්ත්‍රීතුමා පළාත් සභා මන්ත්‍රී ධුරයෙන් 2017.12.15 දින සිට ඉල්ලා අස්වීමත්, ඊට අනුප්‍රාප්තිකව පත් වූ ස්ටැන්ලි ඇන්තනී සම්මුගම් ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලා අස්වීමත් හේතු කොට ගෙන කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ඇති වූ මන්ත්‍රී ධුර පුරප්පාඩුව පිරවීම සඳහා නැවත එස්. කුහවරදන් ගරු මන්ත්‍රීතුමා තේරී පත්ව තිබෙනවා.*

*එම එස්. කුහවරදන් ගරු මන්ත්‍රීතුමාගේ තේරීපත්වීම මැතිවරණ කොමිෂන් සභාව විසින් 2018.03.10 දිනැති අංක 2061/52 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර තිබෙනවා.*

*ඒ අනුව එස්. කුහවරදන් ගරු මන්ත්‍රීතුමා 2018.03.14 දින මා ඉදිරිපිටදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව නිල ප්‍රතිඥාව/දිවුරුම දී ඇති බව කාරුණිකව දැනුම් දෙනවා.*

*එම නිසා එස්. කුහවරදන් ගරු මන්ත්‍රීතුමාට ගෞරවයෙන් ආරාධනා කර සිටිනවා මෙම සභාවට පැමිණ අසුන් ගන්නා ලෙසට.*

***අනතුරුව, අභිනව ගරු මන්ත්‍රීතුමා [එස්. කුහවරදන් මහතා] සභා ගර්භයේ අසුන් ගන්නා ලදී.***
*Subsequently, the newly appointed Member [S. Kuhawarthan] took his seat in the Council Chamber*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*අභිනවයෙන් තේරී පත් වූ එකමුතු ප්‍රගතිශීලී සංධානය නැමැති පිළිගත් දේශපාලන පක්ෂයේ මන්ත්‍රීවරයෙකු වූද, හිටපු ගරු පළාත් සභා මන්ත්‍රීවරයෙකුද වූ එස්. කුහවරදන් ගරු මන්ත්‍රීතුමාට සුභාශිංසන පිරිනමනවා."*

# සභාපතිවරයාගේ නිවේදන
ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2018.03.11 දින සිට ක්‍රියාත්මක වන පරිදි සභා ලේකම් හේමන්ත සමරකෝන් මහතා නැවත සේවයට පැමිණෙන තෙක් බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ලේකම් තනතුරෙහි වැඩ බැලීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් ශ්‍රී ලංකා පරිපාලන ශ්‍රේණියේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන එම්.ජී.ඒ. තිලකරත්න මහතාව පත් කර ඇති බව දන්වමින් ආණ්ඩුකාර ලේකම් විසින් එවන ලද අංක COS/ADM/14/3/5 හා 2018.03.16 දිනැති ලිපි පිටපත සභා ලේකම්තුමා වෙත ලැබී තිබෙනවා.*

*ඒ අනුව අද දින මෙම සභා රැස්වීමේදී ලේකම් තනතුරෙහි රාජකාරී කටයුතු වැඩ බලන සභා ලේකම් එම්.ජී.ඒ. තිලකරත්න මහතා විසින් ඉටු කරනු ලබන බවත්, එතුමා දැන් මෙම සභාවේ සභා ලේකම් අසුනේ අසුන් ගෙන සිටින බවත් කාරුණිකව දැනුම් දෙනවා.*

*දැනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තනතුරේ නිත්‍ය රාජකාරී ඉටු කරන එම්.ජී.ඒ. තිලකරත්න මහතා එම නිත්‍ය තනතුරට අමතරව මෙම සභාවේ සභා ලේකම් තනතුරේ වැඩ බැලීම කරනු ලබන බවත්, සභා ලේකම් හේමන්ත සමරකෝන් මහතා නැවත සේවයට පැමිණෙන තෙක් මෙම වැඩ බැලීම සිදු කරනු ලබන බවත්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් එවන ලද ලිපි පිටපත අනුව වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙනවා."*

*ii*

*"පසුගිය සභා රැස්වීම් දිනවල මෙන්ම උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම අනුව, එතුමන්ගේ අසනීප තත්ත්වය සලකා බලා, තාවකාලිකව අද දින තුළදීද එතුමාට පහසු අසුනක් හා අදාළ පහසුකම් ලබා දීමට කටයුතු කර තිබෙනවා.*

*එම ආසන පහසුකම ලබා දීමේ දී ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා ලබා දුන් නොමසුරු සහයෝගය ඉතාමත් අගය කරන බවත් සිහිපත් කරනවා."*

# ලිපි ලේඛන පිළිගැන්වීම
## PAPERS PRESENTED

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)

Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි,

i. 2018 පරිපූරක ඇස්තමේන්තුව - 01 හා ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තියත්,

ii. අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම - 2017 නැමැති ලේඛනයත් මම පිළිගන්නවා.

එම ලේඛනවල පිටපත් අද දිනට නියමිත සභා න්‍යාය පත්‍රය සමගම තැපැල් මගින් ගරු මන්ත්‍රීවරුන් වෙත ලැබෙන්නට සලස්වා තිබෙනවා. ඊට අදාළ යෝජනාවන්, අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයයට එළැඹුණු විට දී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව වැඩිදුර සාකච්ඡාව අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයයට එළැඹුණු විට දී ලබා දෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, පොඩි රීති ප්‍රශ්නයක්. ඔබතුමා දැනුම් දුන්නා අපේ සභාවේ සභා ලේකම් වෙනුවට වැඩ බලන්න මේ ලේකම්තුමාව පත් කරලා ආණ්ඩුකාරතුමා එව්වා කියලා. හැබැයි පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා හැටියට මෙතුමා වැඩ කරනවා. එතකොට පළාත් රාජ්‍ය සේවා කොමිෂම කියන්නේ ස්වාධීන තැනක්. එහෙම වැඩ කරන කොට මේ ලේකම්තුමාව මෙතැන වැඩ බැලීමට දැමීමෙන් මම හිතන්නේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට තිබෙන ගෞරවයේ හැල්ලු වීමක් වෙනවා. මොකද, එතුමා මෙතැන වැඩ බැලීම ක්‍රියාත්මක කරන කොට එක එක මත එනවා අපේ මන්ත්‍රීතුමාන්ලා අතර. මේ පළාත් රාජ්‍ය සේවා කොමිෂම කියන්නේ ස්වාධීන තැනක්. එතැන ලේකම්තුමා තමයි මෙතුමා. මේ පිළිබඳව ලොකු ගැටළුවක් ඇති වෙනවා. මේක පුරුද්දකට ගත්තොත් එහෙම බස්නාහිර පළාත ඉතාමත් හැල්ලු තත්ත්වයකට පත් වන වැඩ පිළිවෙළකට යනවා. මොකද, අපට නිහඬව ඉන්නත් බැහැ. කරුණු කාරණා දැනගත්තාට පස්සේ සාකච්ඡා කරලා හොයා බලන්න වෙයි. අන්න ඒ පිළිබඳව ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, හිටපු විපක්ෂ නායකතුමාත් එක්ක මම එකඟ වෙනවා. දැන් මෙතුමා මගේ කාර්යාලයට ආවාම, මම ඒක මතු කරන්න හැදුව කාරණාව. ඔබතුමාට නොවෙයි. මේ පළාත් සභාවේ අපේ ඕනෑ තරම් නිලධාරීන් ඉන්නවා. ඕනෑ නම් මීට වඩා ජූනියර් කෙනෙක් හරි පත් කරන්න තිබුණා. ගරු සභාපතිතුමනි, මම දකින විධියට ඒක වැරැද්දක්. මම දැනුවත් විධියට ඒක වැරැද්දක්. ඒ වැරැද්ද මින් ඉදිරියට නොවෙන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මගේ ඉල්ලීමක්වත් එහෙම එකක් නොවෙයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපට එතුමා එක්ක කිසිම ප්‍රශ්නයක් නැහැ. මේ ගෞරවය දෙපැත්තටම නැති වෙනවා. සභාවේ ඉන්න මන්ත්‍රීවරු වන අපටත්, එතුමා කොමිසමේ ස්වාධීන ලේකම්වරයෙක් හැටියට ඒකත් නැති වෙලා යන වැඩ පිළිවෙළක් වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එතුමාව අපහසුතාවයට පත් කරන්න අවශ්‍ය නැහැ. එතුමා මෙතැනට බලෙන් ආවේ නැහැ නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ, නැහැ. එතුමාත් එක්ක ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාව පත් කිරීම කළේ ඉහළින් නේ? ආණ්ඩුකාරතුමා තමයි පත් කිරීම කරලා තිබෙන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒ කරපු වැරැද්දට 104 දෙනාම ගොළු වුණොත් මොකද වෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හරි. මෙතුමා මේ සභාවට විතරයි එන්නේ. ඊට පස්සේ ආයෙත් එන්නේ නැහැ. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා, මෙතුමා මේ සභාවේ විතරයි ලේකම් තනතුරේ ඉන්නේ. ඊට පස්සේ ආයෙත් එන්නේ නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක දැනුවත් කරලා, වාර්තා කරලා යවන්න.

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2017.03.07 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්නවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

**01.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/18/06)**

අ. බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන (NADA) ප්‍රධාන රංග ශාලාව නවීකරණය සහ කුඩා රංග ශාලාව අංග සම්පූර්ණ රංග ශාලාවක් බවට පත් කිරීමට සභා සම්මත යෝජනා ඇති බව දන්නේද්?

ආ. අයවැය සඳහා විශේෂ යෝජනා - 2018 ලෙසද, ඒ පිළිබඳව ප්‍රධාන අමාත්‍යවරයා වෙත ලිඛිත ඉල්ලීම් කර ඇති බව දන්නේද?

ඇ. 2018 වසරේ සංවර්ධන කාර්යයක් ලෙස ඒ පිළිබඳව ගෙන ඇති පියවර කවරේද?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

අ. ඔව්.

ආ. නොදනී.

ඇ. i. ප්‍රධාන රංග ශාලාවේ විදුලි ආලෝක පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සුදුසු ස්ථානය සැකසීම.

ii. ප්‍රධාන රංග ශාලාවේ ආසන අලුත්වැඩියා කිරීම.

iii. ප්‍රධාන රංග ශාලාවේ පිවිසුම් දොරටු අලුත්වැඩියා කිරීම.

iv. ප්‍රධාන රංග ශාලාවේ වේදිකාව ප්‍රතිසංස්කරණය.

v. ප්‍රධාන රංග ශාලාවේ විදුලි ආලෝක සවි කර ඇති ස්ථානය අලුත්වැඩියා කිරීම.

vi. ආපන ශාලාව අලුත්වැඩියාව හා වායු සමීකරණය සවි කිරීම.

මේ වනවිට පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ රුපියල් ලක්ෂ 30 ක මුදලක් වෙන් කර ඇත. ඉහත කාර්යයන් සඳහා ඇස්තමේන්තු සකස් කිරීමට ප්‍රාදේශීය ඉංජිනේරු වෙත දන්වා ඇත.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය තමයි ඔබතුමා ඇස්තමේන්තු සකස් කිරීම සම්බන්ධයෙන් කිව්වා. එතකොට ඇස්තමේන්තු සකස් කරලා මේ ව්‍යාපෘතිය 2018 වසරේ කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන කොහෙන්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම ඊයේම මේ සඳහා ඉංජිනේරු කාර්යාංශයට කථා කරලා සිහි ගැන්වීමක් කළා. මම ගරු ප්‍රධාන ඇමැතිතුමාටත් ඊයේ කථා කළා. දැනුත් මතක් කිරීමක් කළා. ගරු මන්ත්‍රීතුමාටත් දුරකථන ඇමතුමක් ගන්න උත්සාහ කළා. අපි සන්තෝෂයෙන් බලාපොරොත්තු වෙනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාත් එක්ක කථා කරලා ලැබෙන ඇස්තමේන්තුවට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පරිපූරකයේ නැහැ. ඔබතුමන්ලා පරිපූරකය වෙනස් කරගෙන -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේ අයවැයේදී ගරු ප්‍රධාන ඇමැතිතුමා එකඟත්වය පළ කළා මුදල් ටිකක් හොයලා දෙමු කියලා. ඉතින් ඔබතුමාත් ඒකට සම්බන්ධ කර ගන්න ඕනෑකම තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අනෙක් එක තමයි ඔබතුමා මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීම ඇතුළේ මට මතු වන ප්‍රශ්නයක් තමයි, ඔබතුමන්ලා අතරේ කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීමක් නැද්ද කියලා. 2018 අවුරුද්දේ අයවැය යෝජනාවලට මම මහ ඇමැතිතුමාට තමයි මගේ යෝජනා දුන්නේ. නමුත් ඒවා කිසිම දෙයක් සාකච්ඡාවට ලක් වෙලා නැහැ. මොකද, ඔබතුමා උත්තර දෙනවා, ඒ සම්බන්ධව දන්නේ නැහැයි කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මෙහෙම එකක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම උත්සාහ කරනවා. මම දන්නේ නැහැ, මට ලැබෙන හැම ප්‍රශ්නයකටම මම උපරිමයෙන් උත්තර දෙන්න උත්සාහ කරන ඇමැතිවරයෙක්. මම කල් ගන්නේ නැහැ. මේ සභාවේ හැමදාම කල් අරගෙන තිබෙන්නේ දෙපාරයි. මම ඊයේත් කථා කරලා, ලලිත් කන්නන්ගර මහත්තයාටත් මේකට උනන්දු වුණා. අපට ලැබෙන ඇස්තමේන්තු ඔබතුමාත් සමග කථා කරලා අවශ්‍ය ප්‍රතිපාදන යොදවලා අපි වැඩ ටික කරගෙන යමු.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

වැඩේ කෙරෙනවා නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔව්. ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද න්‍යාය පත්‍රයේ ප්‍රශ්න එපමණයි තියෙන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මට කලින් මතු වුණු ප්‍රශ්න කිහිපයකට සෞඛ්‍ය ඇමැතිතුමාගෙන් අමාත්‍යාංශ නිවේදන යටතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගන්න පුළුවන්. එතුමා ලැහැස්ති වෙලා නම් අවස්ථාව දෙන්න පුළුවන්.

## නොපැමිණ සිටීමේ අවසරය
## LEAVE OF ABSENCE

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, *"විජිත් ප්‍රියන්ත ගරු මන්ත්‍රීතුමාට මාස 03 ක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, *"ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට මාස 03 ක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## අමාත්‍යාංශ නිවේදන/ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
## MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, අමාත්‍යාංශ ප්‍රකාශ යටතේ පිළියන්දල දිසා රෝහලේ තාවකාලිකව අනුයුක්ත කළ වෛද්‍ය රසායනාගාර කාර්මික නිලධාරීන් නිදහස් කිරීම පිළිබඳව හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා සභා වාර දෙකකදීම ප්‍රශ්න මතු කළා. ඒ පිළිබඳව මම ප්‍රකාශයක් කරන්න තොරතුරු සොයා ගත්තා. ඇත්ත වශයෙන්ම මෙම අනුයුක්ත කිරීම් කරලා තිබෙන්නේ, ඩෙංගු උවදුර පැමිණි මොහොතේ. විශේෂයෙන් එයට අවශ්‍ය කරන උපකරණ පිළියන්දලත්, කිරිබත්ගොඩ රෝහලත් ඒ වාගේම හෝමාගම රෝහලත් සපයලා ඒවා ක්‍රියාත්මක කරන්න තමයි රසායනාගාර ශිල්පීන් මධ්‍යම ආණ්ඩුවෙන් යොදවලා තිබෙන්නේ. ඒක නිසා ඒ කටයුත්ත ඉවර වුණාට පස්සේ නැවත ඒ අය ඒ නිලධාරීන්ව නිදහස් කරලා අරගෙන තිබෙනවා. ඒක නිසා මේක පළාත් සභාවට අයිති කාර්යයක් නොවෙයි. පළාත් සභාවට එහෙන් නිදහස් කරලා තිබෙන නිලධාරීන්. කෙසේ වෙතත් රසායනාගාර ශිල්පීන්ගේ අඩුවක් බස්නාහිර පළාතේ තිබෙනවා. මධ්‍යම රජයෙන් ඒ නිලධාරීන් එවන්නේ නැතුව ඒකට අපට කොහෙත්ම විසඳුමක් දෙන්න බැහැ. අපට පුහුණු කරන ආයතනයක් ඇත්තෙත් නැහැ. ඒක නිසා අපි මධ්‍යම ආණ්ඩුවෙන් ඉල්ලීම් කරලා තිබෙනවා අවශ්‍ය කරන රසායනාගාර ශිල්පීන් ලබා දෙන්න කියලා. ඒ වාගේම සෑම රෝහලකටම එක්ස්රේ යන්ත්‍රයක් ලබා දෙන්න මම දැන් කටයුතු කරගෙන යනවා. නමුත් එක්ස්රේ යන්ත්‍රය ක්‍රියාත්මක කරන කාර්මික ශිල්පියෙක් නැහැ. ඒකත් අපි මධ්‍යම රජයෙන් එනකල් බලාගෙන ඉන්න ඕනෑ. නමුත් මම දැන් තීන්දුවක් අරගෙන තිබෙනවා. අපි ඉදිරියේදී සාකච්ඡා කරගෙන යනවා. ඊට අවශ්‍ය කරන දැනුම මිනුම තිබෙන මේ රටේ උගත් තරුණයෝ ඉන්නවා. ඒ තරුණයින් බඳවාගෙන අවශ්‍ය කරන යන්ත්‍රය පමණක් ක්‍රියාත්මක කරන්න පුළුවන් පුහුණුවක් දීලා, අපි ඒ එක්ස්රේ යන්ත්‍ර ලබා දෙන්න සෑම රෝහලකටම ඒ වැඩ පිළිවෙළ යොදන්න මම කටයුතු කරන බව මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මම විනාඩියක් කථා කරන්න අවසර ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතාම කෙටියෙන් කියන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මම ස්තුතිවන්ත වෙනවා ගරු ඇමැතිතුමාගේ පිළිතුර සම්බන්ධව. ගරු ඇමැතිතුමා මම බලාපොරොත්තු වුණු පිළිතුර මේක නොවෙයි. මම බලාපොරොත්තු වුණේ ඩෙංගු උවදුර නිසා මහ ආණ්ඩුවෙන් අපට මේ ලැබ් එක දුන්නා. ඒක හරි. ඔබතුමා කියපු කථාව සත්‍යයයි. ඔබතුමාට මේ නිලධාරීන් පොඩ්ඩක් වරද්දලා තිබෙනවා. ඒකට හසු වෙන්න එපා. ඔබතුමා හොඳයි. මේකේ මට දැන් තිබෙන ගැටළුව මේ නිලධාරියා දැනුත් කියනවාද පිළියන්දල ඩෙංගු රෝගීන් හම්බ වෙන්නේ නැහැයි කියලා. ඔබතුමාට ඔය වාර්තාව සකස් කරලා දුන්නු නිලධාරියා කියනවාද පිළියන්දල ප්‍රදේශයේ මේ වනකොට ඩෙංගු රෝගීන් හම්බ වෙන්නේ නැහැයි කියලා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

නැහැ, එහෙම කියලා නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

එතකොට මේ රාජ්‍ය නිලධාරියාට යුතුකමක් තිබෙනවා මහ ආණ්ඩුවෙන් දුන්නු එක්කෙනාව එවන්න කියපු ගමන් දෙන්නාවම ගෙදර යවන්නේ නැතුව - මම ඔබතුමාත් එක්ක argue කරනවා නොවෙයි. මේක නිලධාරීන්ට දැන ගන්න කථා කරන්නේ. එතුමාට යුතුකමක් තිබෙනවා මේ දෙදෙනා යවන්නේ නැතුව එක්කෙනෙක් යවලා බලන්න. එක්කෙනෙක් තියා ගෙන. පිළියන්දලට එක්ස්රේ මැෂින් නොවෙයි ඕනෑ. ගරු ඇමැතිතුමනි, පළමුවෙන්ම ඕනෑ ලැබ් එකක්. බොහොම ස්තුතියි.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, මේ වාර්තාවේ තිබෙනවා දෙපාරක් කථා කරලා තමයි ගෙන්නගෙන තිබෙන්නේ. ඒක නිසා මේකේ වාර්තාව මම සභාගත කරනවා. ඔබතුමා වාර්තාව බලන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

පිළිතුර සම්බන්ධව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. නමුත් නිලධාරීන් ඔබතුමාව නොමඟ යවනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

නැහැ, නැහැ. මම කෙහෙත්ම නොමඟ යන්නේ නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපි එකතු වෙලා උපදේශක කාරක සභාවක්වත් තියමු කෝ ගරු ඇමැතිතුමා? අපි මේක කථා කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව අපි විවාදයකට යන්න අවශ්‍ය නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය ඇමැතිතුමාට මේ ප්‍රශ්නයක් යොමු කළා, කලින්. මම කලින් ප්‍රශ්නයක් මතු කළා අවිස්සාවේල්ල රෝහලේ පිට අය දෙන්නෙක් ඒ ගොඩනැගිලිවල නතර වෙලා ඉන්නවා. ඒ සම්බන්ධව එතුමා මට උත්තර දුන්නා පෙබරවාරි 10 වැනිදා එක්කෙනෙක් යනවා. අනෙක් එක්කෙනා යවන්න කටයුතු කරනවා. ඊට පස්සේ මේ සභාවට ඒ සම්බන්ධව ඉදිරිපත් කරන්නම් කියලා. අන්න ඒ සම්බන්ධව දැනගන්න කැමැතියි.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඒ සම්බන්ධව මම ලැහැස්ති වෙලා ආවේ නැහැ. ඊළඟ සභාවේදී මම ඒ සම්බන්ධව දැනුම් දීමක් කරන්නම්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම දන්න විධියට ගරු ඇමැතිතුමා ඔබතුමාට ලැහැස්ති වෙන්න දෙයක් නැහැ. ඔබතුමාගේ හිතවතුන් දෙදෙනෙක් ඕකේ ඉන්නේ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

නැහැ, නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඉතින් ඔබතුමාට පුළුවන් -

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මගේ කිසිම කෙනෙක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

විශ්වාස කටයුතු ආරංචි මාර්ගවලින් මටත් දැනගන්නට ලැබුණා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

බොරු කතන්දරයක් නේ ඔබතුමා කියන්නේ. මම දැකලත් නැහැ. අහලත් නැහැ. මට අවශ්‍යත් නැහැ. එහෙම වැරැදි අවබෝධයක් තියා ගන්න එපා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමාට බලය තිබෙනවා. ඔබතුමාට පුළුවන් නේ ඒ දෙන්නා අයින් කරන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

එහේ ඉන්න එතුමාගේ හිතවතා මම තමයි.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මම නොවෙයි කරන්න ඕනෑ. නිලධාරීන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නිලධාරීන්ව තමුන්නාන්සේ මෙහෙයවන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

නිලධාරීන්ට කියලා තිබෙනවා. ඒ ගැන ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔබතුමා ප්‍රශ්නයක් දාන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ප්‍රශ්නය දාලා නිසා තමයි -

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

දැන් ඔබතුමා සම්පූර්ණයෙන් අයින් කර ගන්න මගේ අය කියන එක. මගේ අය එහේ නැහැ. මගේ කිසිම කෙනෙක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම එහෙම අයින් කර ගන්නේ නැහැ. ඒ දෙන්නා අයින් කරනකල් මම ඒක අයින් කර ගන්නේ නැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ප්‍රකාශය අයින් කර ගන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා ඒ දෙදෙනා අයින් කරන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඔබතුමා කිව්වේ මගේ කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව්.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මගේ කෙනෙක් නොවෙයි. මේ වැරැදි අවබෝධ තියාගන්න එපා මෙතැන.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැත්නම් ඒ දෙන්නා අයින් කරන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මගේ කවුරුවත් ඕකේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙම නොවෙයි නම් අයින් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදවලට යන්න ඕනෑ නැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ජනතා විමුක්ති පෙරමුණේ හැටි ඔහොම තමයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, රීති අනුව කටයුතු කරන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ජනතා විමුක්ති පෙරමුණේ හැටි ඔහොම තමයි. වැරැදි අවබෝධයක්. ඔබතුමාට මට පුද්ගලිකව කථා කරන්න තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එපමණ දුරදිග යන්න ඕනෑ නැහැ. ඒ ප්‍රශ්නය ඉවරයි. කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නීතිය සැමට සමානව ක්‍රියාත්මක කර වෛරී ප්‍රකාශ පිටුදකිමු. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, ගෙවී ගිය සති දෙකක කාලය තුළ මේ රටේ ඉතාම අවාසනාවන්ත සිදුවීම් ගණනාවක් සිදු වුණා. ඒ හේතුකොටගෙන රට ජාත්‍යන්තර වශයෙන් විශාල අපකීර්තියකට පත් වුණා. විශේෂයෙන්ම මේ රටේ බෞද්ධ ජනතාව, මේ රටේ මුස්ලිම් ප්‍රජාවට එරෙහිව ප්‍රචණ්ඩත්වය මුදා හරිනවා කියලා විශාල ප්‍රචාරයක් ජාත්‍යන්තර වශයෙන් ගෙන යනු ලැබුවා BBC සහ අල්ජසීරා කියන මාධ්‍ය හරහා. කෙසේ නමුත් මෙම සිදුවීම් අපි කිසිසේත් අනුමත කරන්නේ නැහැ. ඉතාම අවාසනාවන්ත සිදුවීමක්. මේ පෞද්ගලික ආරවුල් තමයි අවසාන වශයෙන් වාර්ගික ගැටුම්, ආගමික ගැටුම් දක්වා වර්ධනය වෙලා ඉදිරියට යන්නේ. ඉතින් මේ පිටුපස්සේ අපට පැහැදිලිව දැකගන්න පුළුවන්කම තිබෙනවා මේ වෛරී ප්‍රකාශ - විශේෂයෙන්ම අන්තර්ජාලය හරහා, සමාජ මාධ්‍ය ජාල හරහා ක්‍රියාත්මක වන වෛරී ප්‍රකාශ පසුගිය කාලය පුරාම අපට. සෑම පාර්ශවයක් පැත්තෙන්ම දැකගන්න ලැබුණා. බෞද්ධයන් නියෝජනය කරමින් යැයි කියා ගන්නා ඇතැම් සංවිධාන, ඒ වාගේම මුස්ලිම් ජනතාව නියෝජනය කර ගන්නවා යැයි කියා ගන්නා ඇතැම් සංවිධාන විශාල වශයෙන් කරගෙන ගියපු ඒ වෛරී ප්‍රකාශ හේතු පාදක වුණා මේ වාගේ ගැටුම්කාරී තත්ත්වයක් නිර්මාණය වෙන්න.

ඒ නිසා අනිවාර්යයෙන්ම මේ අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය ජාල, ඒ වාගේම Facebook පරිහරණය කිරීමේදී කිසියම් ආකාරයකින් මේක නියාමනයකට ලක් කිරීමට අවශ්‍යයි. මේ කිසිදු ආකාරයක වගකීම් සහගත භාවයක් නැහැයි කියන එක අපට පසුගිය කාලයේ දැකගන්න ලැබුණා. ඒ වාගේම අපි කියන්න ඕනෑ මේ අන්තර්ජාලය තුළ අද කරගෙන යන වගකීම් විරහිත ඒ වාගේම කූට ප්‍රවෘත්ති, ඒ වාගේම නිර්මාණය කරන ලද ප්‍රවෘත්ති නිසා ජන කොටස් අතර අද අසමගිය, වෛරය, ක්‍රෝධය, කෝපය, පිළිකුළ අද නිර්මාණය වෙලා තිබෙනවා. මේකේ පිටුපස යම් යම් කණ්ඩායම් තමන්ගේ දේශපාලන අරමුණු ඉෂ්ට කර ගනිමින් සිටී. ඒ නිසා අපි කියන්නේ මෙවැනි තත්ත්වයක් ඇති වීම සම්බන්ධයෙන් රජයක් විධියට රජය කිසි විටකත් ප්‍රතිපත්තියක් විධියට ජාතිවාදය හෝ ආගම් වාදය පසුගිය වසර තුනක කාලය තුළ තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් පාවිච්චි කළේ නැහැ. රටේ නායකයින් දෙදෙනාම. ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් ඉතා පැහැදිලිව

තමන්ගේ ප්‍රතිපත්තිය බවට පත් වුණේ, මේ රටේ ජාතික සමගිය ඇති කර ගැනීම කියන කාරණය. ඒ නිසා අපි කියන්න ඕනෑ රටක් විධියට, රටේ රාජ්‍ය නායකයින් මේ සම්බන්ධව පැහැදිලි ස්ථාවරයක, ප්‍රතිපත්තියක ඉන්න ඕනෑ. නමුත් පසුගිය කාලය පුරාම අපට දැකගන්නට ලැබුණු ප්‍රශ්නයක් තමයි නීතිය සැමට සමානව ක්‍රියාත්මක නොවීමේ ගැටළුව. උතුරට එක නීතියක්. නැගෙනහිරට තව නීතියක්. මන්නාරමට තව නීතියක්. කොළඹට තව නීතියක් විධියට මේ නීතිය ක්‍රියාත්මක වෙන්න බැහැ. නීතිය බැලූ බැල්මට සියලු දෙනාටම සමානව ක්‍රියාත්මක වෙනවා කියලා පේන්න ඕනෑ.

විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ මේ නීතිය අසමානතාවය නිසා තමයි ජනතාව තුළ අවිශ්වාසය, සැකය නිර්මාණය වුණේ. ඒ නිසා මෙවැනි ප්‍රශ්න ඇති වීම වැළැක්වීමට නම් ජාති, ආගම්, පක්ෂ, පාට භේදයකින් තොරව සියලු දෙනාට නීතිය සමානව ක්‍රියාත්මක විය යුතුයි. ඒ තුළින් පමණයි මෙවැනි ප්‍රශ්න ඇති වීම වළක්වන්න පුළුවන්කම ලැබෙන්නේ ගරු සභාපතිතුමනි. ඒ වාගේම මම කියන්න ඕනෑ මේ ප්‍රශ්නයේදී විශේෂයෙන්ම ඇතැම් කණ්ඩායම් කටයුතු කරපු ආකාරය ඉතාම වගකීම් විරහිතයි. මොකද, මේ තුළින් ජාත්‍යන්තර වශයෙන් අපට ඇති වුණු අපකීර්තිය, විශේෂයෙන්ම මේ රටේ බෞද්ධ ජනතාවට ඇති වුණු අපකීර්තිය විශාලයි. මේක නිවැරදි කර ගැනීම සඳහා ඉදිරි කාලයේදී අපට විශාල ආයෝජනයක් කරන්න වෙනවා. ඒ වාගේම මේ සිදු වුණු අලාභහානිවලින්, ගිනි තැබීම්වලින්, දේපළ හා ජීවිත හානිවලට වන්දි ගෙවන්න සිදු වෙලා තිබෙන්නේත් අවසාන වශයෙන් මේ රටේ ජනතාවගේ බදු මුදල්වලින්. ඒ නිසා මෙවැනි ජාතිවාදී ආගම්වාදී, වර්ගවාදී ගැටුම්, ප්‍රචණ්ඩත්වයන් පිටුදැකීම සඳහා අපි සියලු දෙනාම වගකීම් සහගතව කටයුතු කරන්න ඕනෑ. එහෙම නැත්නම් රටක් විධියට අපි අගාදයට යන එක, විනාශයට යන එක වළක්වන්න පුළුවන්කමක් නැහැ. අපි පැහැදිලිව කියන්න ඕනෑ, මේ කාරණයේදී ඇතැම් දේශපාලන පක්ෂ තමන්ගේ පටු දේශපාලන උවමනාවන් - ඒ වාගේම තමයි අනෙක් පැත්තෙන් තමන්ගේ පටු උවමනාවන් ඉටු කර ගැනීම සඳහා පුද්ගලයින් දෙසට ඇඟිල්ල දික් කරනවා. එක පැත්තකින් ජාතික හෙළ උරුමයට කියනවා, මේ සුළු පක්ෂ සමග එකතු වෙලා ආණ්ඩු හදලා රට පාවාදුන්නා, ජාතිය පාවාදුන්නා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒ වාගේම තමයි අනෙක් පැත්තෙන් ඇවිල්ලා කියනවා මේ වාගේ ප්‍රශ්නයක් ඇති වුණාම මේකට වග කියන්න ඕනෑ ජාතික හෙළ උරුමය. අර බලකාය හැදුවේ අපි, මේ බලකාය හැදුවේ අපි කියලා අපට චෝදනා එල්ල වෙනවා. මේක ඇතුළේ තිබෙන අවස්ථාවාදය මොකක්ද කියන එක ඉතාම පැහැදිලියි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙවැනි තත්ත්වයක් ඇති වීම වැළැක්වීම සඳහා සභාවක් විධියට අපි සියලු දෙනාම වගකීමක් ඇතිව කටයුතු කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් අප අතර සම්මුතියක්, එකඟතාවයක් ඇතිකර ගත යුතුයි කියන එක මේ වෙලාවේදී ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මීට ඉහත වසරේත් මේ වාගේම වසර අවසානයේ අපි සංඛ්‍යා ලේඛන අරගෙන පෙන්නුවා, 2016 වසරට මිලියන කීයක් ඉතුරු වුණාද කියලා. 2016 වසරේ ආයවැයෙන් වෙන් කළ මුදල්වලින් මිලියන 500 කට වැඩි ප්‍රමාණයක් මුදල් ඉතුරු වුණා. මේ පළාත් සභාව තුළ අපි සියලු මන්ත්‍රීවරු එක එක අමාත්‍යාංශවලට ඉල්ලීම් ඉල්ලුවත් සල්ලි නැහැයි කියපු අවස්ථාවල සල්ලි නැහැයි කිව්වා. නමුත් අවුරුද්ද අවසානයේ අපි ප්‍රගතිය අරගෙන බලනකොට අපි දැක්කා මිලියන 500 ක් ඉතුරුයි කියලා. 2018 වසරේත් ඒ වාගේම තමයි. 2018 වසරේත් පළාත් නිශ්චිත ගත්තොත් සංවර්ධන හැටියට මිලියන 53 ක්. පළාත් සංවර්ධන ගත්තොත් මිලියන 244 ක්. විශේෂ ව්‍යාපෘති ගත්තොත් මිලියන 171 ක්. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගත්තොත් මිලියන 6.2 ක්. මුළු එකතුව මිලියන 474 යි. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම පළාත් කඩිනම් සංවර්ධන වැඩ සටහන. අපේ පළාත් සභා අරමුදල්. ඒ මුදලින් ප්‍රධාන ලේකම් කාර්යාලයට මිලියන 1529 ක් වෙන් කරලා තිබුණා. මිලියන 1381 යි වැඩ කරලා තිබෙන්නේ. මිලියන 148 ක් ඉතුරුයි. ඒ මිලියන 148 න් 100 ක් තිබෙන්නේ වෙනත් ආයෝජන. ඒ වාගේම

[ ගරු මෙරිල් පෙරේරා ]

ගොඩනැගිලිවලින් මිලියන 34 ක් ඉතුරුයි. ඒ වාගේම ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලියන 7 ක් ඉතුරුයි. ගියවර අයවැයේදී මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ප්‍රධාන ලේකම්තුමාගෙන් විශේෂ ඉල්ලීමක් කළා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අපේ පළාත් සභා නිලධාරීන් ඉන්නවා. ඒ නිලධාරීන්ට තමන්ගේ වැඩ කටයුතු කරගෙන යන්න කාර්යාල උපකරණ ලබා දෙන්න කියලා. ඒ ඉල්ලීම අයවැයට ඉදිරිපත් කළා. ඒක මෙතැන සම්මත වුණා. නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ නිලධාරීන්ගෙන් ලේඛන අරගෙන, ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් අනුමත කරගෙන, ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් ලිපියක් ඉදිරිපත් කළා, ප්‍රධාන ලේකම්තුමාට. ගිය අවුරුද්දේම ඒ අවශ්‍ය උපකරණ ටික ලබා දුන්නේ නැහැ. මෙතැන පැහැදිලිව ප්‍රධාන ලේකම් කාර්යාලයේ මිලියන 148 ක් ඉතුරුයි. ලක්ෂ 1480 ක්. බස්නාහිර පළාතටම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 40 යි තිබෙන්නේ. 40 ටම මුදල් ටික වෙන් කරලා දුන්නා නම් මේ උපරකණ ටික ලබා දෙන්න තිබුණා. ගරු සභාපතිතුමනි, මේ මන්ත්‍රීවරු ඉදිරිපත් කරන යෝජනාවලට ඇහුම්කන් නොදී, ඒ වාගේම ඉදිරිපත් කරන යෝජනාවලට මුදල් වෙන් නොකර අවුරුද්ද පුරාම මුදල් නැහැ කියන අයට පැහැදිලිව ඔප්පු වෙලා තිබෙනවා මේ මුදල් ටික හැම අවුරුද්දේම ඉතුරු කරනවා කියලා.

ඒ වාගේම තමයි විශේෂ ව්‍යාපෘති. විශේෂ ව්‍යාපෘති යටතේ විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය. මිලියන 270 ක් වෙන් වුණා. අවුරුද්ද පුරාම වැඩ කරලා තිබෙන්නේ මිලියන 135 යි. මිලියන 135 ක් ඉතුරු කරලා තිබෙනවා. මිලියන 135 ක් කියන්නේ ලක්ෂ 1350 ක්. පුහුණු හා ධාරිතා සංවර්ධනය යටතේ මිලියන 50 ක් වෙන් කළා. එක රුපියලක් මුදලින් වියදම් කරලා නැහැ. එක රුපියලක්. ඒ වාගේම තමයි ගොඩනැගිලි සහ ඉදි කිරීම්. යන්ත්‍රෝපකරණ ගන්න ඒවා. ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණවලට. අපි හැම අවුරුද්දේම ව්‍යුහ කමිටුව හරහා ඒ වාගේම කලාප කාර්යාලය හරහා ඉල්ලීම් එවලා තිබෙනවා. මුදල් නැහැ කියලා එවනවා. මෙතැන මිලියන 135 ක් වියදම් නොකර ඉතිරි කරලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි. අපි අහන්න ඕනෑ ඔබතුමාගේ මාර්ගයෙන් අධ්‍යාපන ඇමැතිතුමාගෙන් අපි ඉල්ලන ඉල්ලීම්වලට මුදල් නැහැයි කියලා මේ ඉතුරු කරලා තිබෙන්නේ ඇයි? අපි මේක 2016 වසරේ වාර්තාවක් අරගෙන, 2017 මුල පෙන්නුවා. ඒකෙන් පාඩමක් ඉගෙන ගත්තා නම් අපට 2017 වසරේ මුදල් ටික වියදම් කරන්න තිබුණා. දැන් අද වෙලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි, මිලියන 500 ක් කියන්නේ ලක්ෂ 5000 ක්. මේ මන්ත්‍රීවරු 104 දෙනාගෙන් යම්කිසි මන්ත්‍රීවරයෙක් ඉල්ලීමක් ඉල්ලුවා නම් ඒ ඉල්ලීමට අවුරුද්ද පුරාම මුදල් වෙන්න කරලා දෙන්න බැහැයි කියන්නේ, තමුන්ගේ තිබෙන ඇමැතිකමෙන් වැඩක් නැහැ කියලා තමයි ගරු සභාපතිතුමනි, කියන්න වෙන්නේ. විශේෂයෙන්ම අධ්‍යාපනය. අපි ගිය වසරේත් මේක පෙන්නුවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා ඉල්ලීමක් කරනවා කරුණාකරලා මේ ගැන අවධානය යොමු කරන්න. මිලියන 500 ක් වැඩ නොකර ලක්ෂ 5000 ක් ඉතුරු කරලා අවුරුද්ද පුරාම තමුන්ගේ අමාත්‍යාංශයෙන් මුදල් ටික වෙන් කරලා දෙන්න බැරි නම් ඒක නොහැකියාව කියන එක තමයි අපට තමුන්නානසේට කියන්න තිබෙන්නේ. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, පසුගිය පෙබරවාරි 10 වැනිදා මේ රටේ පැවතුණු පළාත් පාලන මැතිවරණය වෙනුවෙන් විශාල ජයග්‍රහණයක් පොදුජන එක්සත් පෙරමුණ ලබාගෙන ආයතන 241 ක් පමණ දිනාගත්තා. මානප ක්‍රමයට විරුද්ධව කොට්ඨාශ ක්‍රමයට ගේනවා කියලා, කොට්ඨාශයට මන්ත්‍රීවරයෙක් පත් කරනවා කියලා අවුරුදු දෙක්ක කල් දමමින් ගිහිල්ලා මේ මැතිවරණය පසුගිය 10 වැනිදා තිබුණා. මේ මැතිවරණය පවත්වලා අවසන් වනකොට කොට්ඨාශවල මන්ත්‍රීවරු තුන් දෙනෙක් ඉන්නවා. දැන් පැරදුණු කෙනාත් ඉන්නවා. පැරදුණු අය දෙන්නෙක්. එක්කෙනෙක් බැලුවොත් සමහර විට ජනතා විමුක්ති පෙරමුණේ අපේක්ෂකයෙක්. නැත්නම් එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා. නැත්නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයා. කෝ දිනපු පොහොට්ටුවේ අපේක්ෂකයා කොට්ඨාශයට හතරයි. මම ගරු සභාපතිතුමා මගින් අහන්න ඕනෑ. මේ පළාත් පාලන ආයතන පාලනය වෙන්නේ මහ ඇමැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ. දැන් මහ ආණ්ඩුවේ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයත් එක්ක මන්ත්‍රීවරුන්ට, නගරාධිපතිවරයාට මුදල් වෙන් කිරීමේ චක්‍රලේඛය මොකක්ද? විශාල ප්‍රශ්නයක්. මන්ත්‍රීවරයෙකුට කොට්ඨාශයේ වැඩ කරන්න දීලා තිබෙන්නේ පනතින්.

එතකොට මේ මුදල් වෙන් කරලා තිබෙන්නේ පනතින්. පළාත් පාලන ආයතන පනත අනුව මේ මුදල් වෙන් කරන කොට අපි මන්ත්‍රීවරු 104 ට වෙන් කරනවා වාගේ අපේ ප්‍රතිපාදන ඒ අයටත් වෙන් කරන්න වෙනවා. එතකොට මේ පනත අනුව වෙන් කරන්න බැහැ. මේ පනත අනුව, තිබෙන චක්‍රලේඛ අනුව ඒක කරන්න බැහැ. මම ඊයේ පළාත් පාලන ආයතනවල ලේකම්වරුත් එක්ක කථා කළා. ඒ අය කිව්වා විශාල ගැටළුවකට මුහුණ දීලා තිබෙන්නේ කියලා. එතකොට මේ කොට්ඨාශ මැතිවරණ ක්‍රමයේදී පැරදුණු තුන්දෙනාත් කොට්ඨාශයේ. දිනපු කෙනාත් කොට්ඨාශයේ. මන්ත්‍රීවරු හතරක්. දැන් මොකක්ද මේ කොට්ඨාශ ක්‍රමය. මොකක්ද මේකේ ප්‍රජාතන්ත්‍රවාදය? මෛත්‍රීපාල සිරිසේන 2015 ජනවාරි 08 වැනිදා මේ රටේ පත් වෙලා සති දෙකෙන් 29 සැරයක් පරාජය වුණු රනිල් වික්‍රමසිංහව - දී.මු. ජයරත්නව අස් කරලා රනිල් වික්‍රමසිංහව පත් කළා. මේකේම අනෙක් පැත්ත. මෙන්න ප්‍රජාතන්ත්‍රවාදය. මෙන්න යහපාලන ආණ්ඩුව. එතකොට දැන් මේ අනුව පළාත් පාලන ආයතනවලට - ඊට පස්සේ මම ගියවර අයවැයේදී කථා කළා. 2018 මැතිවරණයක් එනවා. එතකොට මේ 2018 මැතිවරණයට මේ පළාත් පාලන අරමුදලෙන් තමයි මේ අයගේ දීමනා ගෙවන්නේ. දීමනා ගෙවන්න මේ පරිපූරක ඇස්තමේන්තුවෙන්වත්, අපේ අයවැයෙන්වත් මම කියන්නේ අයවැය වෙලාවේ හැන්සාඩ් එකේ මේක තිබෙනවා. මම කථා කළා. එතකොට ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා කිව්වා ඒකට ප්‍රතිපාදන වෙන් කරන්නේ Central Government එකෙන් තමයි කියලා. දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් Central Government එකෙන් ප්‍රතිපාදන වෙන් වෙන්නේ නැහැ. පළාත් සභාවෙන් තමයි මේකට දෙන්න ඕනෑ. මේ අයට පඩි ගෙවන්නේ කොහොමද? වාඩි වෙන්න තැනක් නැහැ. මහරගම මන්ත්‍රීවරු 23 දෙනෙක් හිටපු තැනට 46 දෙනෙක් ඉන්නවා. වාඩි වෙන්නේ කොහොමද? බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු 104 දෙනෙකුට හදලා තිබෙන ශාලාවක් තිබෙන්නේ. එතකොට මේ ශාලාව අනුව (බාධා කිරීම්) –

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වාඩි වෙන්නේ පුටුවක.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ලැජ්ජ නැතුව කථා කරන්න -

[සභාවේ ඝෝෂා]

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

කොට්ඨාශයේ නිර්ණායක විතරයි වෙනස් කළේ. ආසන වෙනස් කළේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පැරදුණු මන්ත්‍රී. පැරදුණු එකේ මන්ත්‍රී වෙලා -

[සභාවේ ඝෝෂා]

මෝඩයක් වාගේ කැගහන්න එපා. තමුන්නාන්සේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. මිනිස්සුනට මෝඩකම පෙන්වන්න එපා. මාධ්‍ය කට්ටිය ඉන්නවා. තමුන්නාන්සේ ජ්‍යෙෂ්ඨයෙක්. තමුනාන්සේගේ නෝනාව දිනා ගන්න බැරි වුණු මිනිහා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

දූකේ අඩනවා. මහරගම ගහලා ගියා නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට දැන් මේ මන්ත්‍රීවරුන්ට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න. කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

විනාඩියක්. දැන් කොහොමද ඉන්න තැන් හදන්නේ? කොහොමද සල්ලි දෙන්නේ? දැන් මේ පරිපූරකයක් දාලා යනවා. දැන් මේ ටික හදන්න කොහෙන්ද මුදල් දෙන්නේ කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ ගැන බලලා, තිබෙන අනෙක් සල්ලි කපලා හරි පළාත් පාලන ආයතනවලට දෙන්න. (බාධා කිරීමක්) තමුන්නාන්සේ කට වහගෙන ඉන්න මැට්ටා නොවී. මැට්ටා වෙන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බූරුවෙක් වාගේ හැසිරෙන්න එපා. කාලය ලබා දීම පිළිබඳව බොහොම ස්තුතියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම මේ ප්‍රකාශය කරන්න හේතු වෙන්නේ පසුගිය සතියේ සියලුම මාධ්‍ය තුළින් පෙන්නුවා වත්තල ආසනයේ සහ ජා-ඇළ ආසනයේ මුතුරාජවෙල ගොඩ කරන් යන හැටි. ඒ විතරක් නොවෙයි. මේ වනකොට මුළු ජා-ඇළ ආසනයේම සහ වත්තල ආසනයේම මහ පරිමාණයෙන් කුඹුරු ඒ වාගේම වගුරු බිම්වල අනවසර ගොඩ කිරීම් කරගෙන යනවා. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ, අධිවේගී මාර්ගයෙන් ජා-ඇළ exit එකට එද්දී පේනවා දැන් ඒ ගොඩ කරන්නේ පස් ගෙනැල්ලාත් නොවෙයි. දැන් අලුත් ක්‍රමයක් සොයාගෙන තිබෙනවා. අධිවේගී මාර්ගය අවට තිබෙන ඇළ විශාල යන්ත්‍රෝපකණ දාලා හාරලා ඒ වැලිවලින්ම දැන් ගොඩ කර ගන්නවා. ගරු සභාපතිතුමනි, ඇත්තටම මේක රාජ්‍ය සම්පත් අවභාවිතා කිරීමක්. මේක පොදු පනත යටතේ ඕනෑම වෙලාවක අත්අඩංගුවට ගන්න පුළුවන් වැරැද්දක්. විශාල වශයෙන් අපි දකිනවා වැලි හාර හාර, සමහර වෙලාවට තව ටික කලක් යනකොට මේ හාරන විධියට අධිවේගී මාර්ගයත් කඩා වැටෙන්න පුළුවන්. ඒ තරම් විශාල heavy මැෂින් දාලා තමයි මේවා හාරන්නේ. ගරු සභාපතිතුමනි, ඉතින් මේකට අද වෙද්දී ජනාධිපතිතුමාගේ සහ අගමැතිතුමාගේ ආශිර්වාදයත් එක්ක එහෙම නැත්නම් රාජ්‍ය යාන්ත්‍රණයේ ආශිර්වාදයත් එක්ක මේවා කරගෙන යනවා කියලා තමයි කියන්නේ. ඒක නිසා ගරු සභාපතිතුමනි, අපි ඒ අයගේ අවධානයට යොමු කරන්න ඕනෑ විශේෂයෙන්ම එහෙම නම කියලාම කියනවා මේ අයගේ සම්බන්ධය ඇතුව තමයි මේ ක්‍රියාවලිය කරන්නේ කියලා. ඒකට දේශපාලන නායකත්වය දෙන්නේ වත්තල සහ ජා-ඇළ ඉන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරු. ගරු සභාපතිතුමනි -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ වැරැදි ප්‍රකාශයක් කරන්නේ. මේ පිළිබඳව එතුමා කථා කරන්නේ" පසුගිය දවසක -ජානක සූරිය බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා දන්නවා. ජෝන් අමරතුංග ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබුණු වත්තල ප්‍රගති සමාලෝචන රැස්වීමේදී මේක ඇදලා ගත්තේ. ඒ නිසා ඒකේ ගෞරවය එන්න ඕනෑ මේක පෙන්නපු අයට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කථා කරන්න අයිතියක් නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේකේ වැරැදිකාරයෝ කවුද කියලා හොයා ගන්න. ඔහොම කාටවත් නම් කියන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මම කාගේවත් ගෞරවයක් ඉල්ලුවේ නැහැ. මම කියන්නේ මේ කරගෙන යන මහ පරිමාණ වංචාව, දූෂණය, හොරකම මේ රටේ අද කරගෙන යන විනාශය, මේ රටේ අද නීතිය ක්‍රියාත්මක නොවන එක ගැන තමයි මම මේ කියන්න හදන්නේ. මට මේකෙන් ලකුණු දාගන්න අවශ්‍ය නැහැ. මේ රාජ්‍ය දේපළ. ආණ්ඩුවට අයිති, ජනතාවට අයිති වැලි ගොඩ දාන්නේ. මහ පරිමාණ යන්ත්‍රවලින් මේ හාරන්නේ. අද ගියාම පේනවා. ජා-ඇළ highway එකෙන් එළියට එද්දී හොඳට පේනවා. මේක කරගෙන යන කට්ටියට, ඕනෑ ඕනෑ විධියට

කරගෙන යන්න ඉඩ දීලා, බලාගෙන ඉන්නවා. අද රාජ්‍ය යාන්ත්‍රණයත් බලාගෙන ඉන්නවා. අපි පැමිණිලි කරනවා. පොලීසියට කථා කරනවා. මේ ළඟදී පුරවන්න ටිපර් 50 ක් ගෙනාවා. ජා-ඇළ පොලීසියෙන් 48 ක් ඇරලා, අන්තිම දෙක අල්ලලා උසාවි දානවා. ඉතින් මේකද නීතිය කියන්නේ? මේ රටේ නීතිය කොහාටද ගිහිල්ලා තිබෙන්නේ කියන එක තමයි අපට තිබෙන ප්‍රශ්නය. අපි යහපාලන ආණ්ඩුවක් බිහි කරලා, අපේ ප්‍රදේශවල මේ වාගේ ජරාජීර්ණ වන වැඩ කරනවා නම්, රාජ්‍ය දේපළ අවභාවිතා කරනවා නම්, හොරකම් කරනවා නම්, රජයට අයිති සම්පත් ටික හොරා කනවා නම්, අපි මේක ගිහිල්ලා කාටද කියන්නේ? මේකද අද තිබෙන ප්‍රශ්නය. අපි යහපාලන රජය බිහි කරපු අය හැටියට අපට මේවා ගැන කථා කරන්න අයිතියක් තිබෙනවා. අපි කාටවත් ලකුණු දාගන්න අවශ්‍ය නැහැ. හැබැයි වනජීවී එකේ අය දන්නේ නැහැ. පහත්බිම් එකට ගියාම, ඒ අය දන්නෙත් නැහැ කියනවා. වෙන තැනකට යවනවා. ඒ අයට කිව්වාම කියනවා ජනාධිපතිතුමාගෙන් ඉහළින් ඕඩර් ඇවිල්ලා තියෙනවා කියලා. අගමැති කාර්යාලයෙන් ඕඩර් ඇවිල්ලා තිබෙනවා කියනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේ කථාව අහලාවත් මේ රටේ නායකයින්ගේ ඇස් දෙක ඇරෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. නැත්නම් මේ ප්‍රදේශවලට විශාල හානියක්. විශාල වර්ෂාවක් ආවාම මේ මුළු ප්‍රදේශයම කඩාගෙන යන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, කාලය ලබා දීම සම්බන්ධව ස්තූතිවන්ත වෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, පරිපූරක ඇස්තමේන්තුව - 2018 සම්බන්ධයෙනුත් මම ඔබතුමාට ලිපියක් ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට ලිපියක් ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ලිපියක් ඉදිරිපත් කරලා තිබෙනවා ගරු සභාපතිතුමනි. මම ඊට ආසන්න කාරණා කිහිපයක් මේකේ පැහැදිලි කරන්න හදන්නේ. ගරු සභාපතිතුමනි, මේ පරිපූරකයේ වටිනාකම රුපියල් මිලියන 3035 යි. මගේ විශේෂ අවධානය යොමු වෙන්නේ කාරණා කිහිපයක් පිළිබඳව. අපට මේක බැලුවාම, අමාත්‍යාංශ පහ දිහා බැලුවාම වැඩිම මුදලක් වෙන් වෙලා තිබෙන්නේ අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයට. ගරු සභාපතිතුමනි, අධ්‍යාපන විෂයය මේ පළාත් සභාවේ සෑම මන්ත්‍රීවරයෙකුටම අතිශය වැදගත් විෂයයයි. මොකද, තමන් ජීවත් වන පළාතේ, කොට්ඨාශයේ අධ්‍යාපනය ගැන සෑම මන්ත්‍රීවරයෙක්ම උනන්දුවීම සාධාරණයි. ඒක එක පැත්තකින් ජනතා නියෝජිතයින්ගේ දැවැන්ත වගකීම් අතර සුවිශේෂී එකක් වෙනවා. අනික ඡන්දය කියන පදනමෙන් ගත්තත්, ඒක මන්ත්‍රීවරයෙකුට ඉතාම වැදගත්.

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරු 104 දෙනාම ඉදිරි මාස කිහිපය ඇතුළත අනිවාර්යයෙන් ඡන්දයකට මුහුණ දෙන්න ඕනෑ. ඒ වාගේම දැන් තිබෙන අදහස තමයි අපි සියලු දෙනා ඡන්දයකට මුහුණ දෙන්න හදන්නේ කොට්ඨාශ ක්‍රමය යටතේ. එහෙම නම් මේ පරිපූරක ගෙන එන්නේ - සාම්ප්‍රදායිකව අපේ පළාත් සභාවේ පරිපූරක ගෙනැල්ලා තිබෙන්නේ වර්ෂය අවසානය ආසන්නයේ. උදාහරණයක් හැටියට කියනවා නම් 2015 නොවැම්බර්. 2016 අගෝස්තු. 2017 සැප්තැම්බර්. හැබැයි මෙවර පරිපූරකය එන්නේ 2018 මාර්තු. ඒකේ වැරැද්දක් දකින්නේ නැහැ. ඒකේ වාසි, අවාසි දෙකම තිබෙනවා. හැබැයි ඒක නොවෙයි මම මතු කරන්න හදන කාරණය. අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කරන මිලියන 1996.87 න්, ඒ කියන්නේ මේක සමස්ත පරිපූරක ඇස්තමේන්තුවෙන් 65.8% ක්. ගරු සභාපතිතුමනි, මේක පසුගිය අවුරුද්ද හා සසඳනකොට 1912% ක වැඩි වීමක්. අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී කිව්වා කොහොමද පසුගිය වසරේ මුදල් වියදම් කළේ කියලා. අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කරපු මුදල් ටිකවත් වියදම් කර ගන්න බැරි වුණු පරිසරයක් තුළ මේ 1996.87 ක් වෙන් කරන්නේ කුමක් සඳහාද? කවර අරමුණක් සහිතවද කියලා සාධාරණ සැකයක් පැමිණීම වළක්වන්න බැහැ. බහුතරයක් මන්ත්‍රීවරුන්ට ඒ සාධාරණ සැකය තිබෙනවා. හැබැයි ඒ සැකය දියාරු කරන්න කටයුතු කරන මන්ත්‍රීවරු අතලොස්සක් ඉන්න පුළුවන්. දැන් උදාහරණයක් හැටියට කියනවා නම් අමාත්‍යාංශ ගොඩකට වෙන් වෙලා තිබෙනවා නේ? තමන්ගේ පැත්තේ ඉස්පිරිතාලයකට වියදම් වෙනවා

[ ගරු සුසිල් කිඳෙල්පිටිය ]

නම්, තමන්ගේ පැත්තේ පාරවල් ටික හැදෙනවා නම්, තමන්ගේ පැත්තේ බස් ස්ටෑන්ඩ් ටික හැදෙනවා නම්, තමන්ගේ ළමයි ටික ඉස්කෝලයට දාගන්න පුළුවන් නම් සමහර මන්ත්‍රීවරු ඒකට විරුද්ධ වෙන්නේ නැහැ. එහෙම මන්ත්‍රීවරු ඉන්නවා. එහෙම ධූරධාරීනුත් මේ සභාවේ ඉන්නවා. ඒක නිසා ගරු සභාපතිතුමනි, 2015 දී අපි පරිපූරක ඇස්තමේන්තුවෙන් ශත පහක්වත් වෙන් කරන්නේ නැහැ PDG හැටියට. 2016 දී ශත පහක්වත් වෙන් කරන්නේ නැහැ. 2017 දී, ගිය අවුරුද්දේදී අපි අධ්‍යාපන අමාත්‍යාංශයට පරිපූරකයෙන් මිලියන 99.22 ක් වෙන් කරනවා. මෙවර මිලියන 1996 යි. මේක ගියවර සම්මත කර ගත්තු අයවැයේදී අපි වෙන් කරන්නේ මිලියන 400 යි. ගිය දෙසැම්බර් මාසේ අයවැයෙන් අපි මිලියන 400 යි වෙන් කරන්නේ. හැබැයි, මේ වනකොට පරිපූරකය විතරක් වැඩි වෙලා තිබෙනවා 1516 කින්. ව්‍යාපෘති 241 ක් තිබෙනවා. ඒකෙන් 192 ක් අධ්‍යාපනයට. මේ අධ්‍යාපනයට වෙන් කිරීම නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ වෙන් කිරීමේ සමානාත්මතාවය. ගරු සභාපතිතුමනි, ඒ නිසා මම කියන්නේ සැමදෙනාටම සාධාරණය ඉෂ්ට වන විධියට වෙන් වෙන්න ඕනෑ. අපි දන්නවා ඉස්සර කොට්ඨාශ මට්ටමෙන් බෙදුවේ කොහොමද කියලා. දැන් කොලොන්නාවේ මේ සැරේ මට වෙන් කරලා තිබෙන්නේ මිලියන 19 යි. හැබැයි මහරගම කොට්ඨාශයට මිලියන 342 ක් වෙන් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා හැමෝටම සාධාරණය ඉෂ්ට වන විධියට, සමානාත්මතා පදනමෙන් බෙදී යෑම සැලකිල්ලට අරගෙන මේක සංශෝධනය කරන්නය කියලා මම මගේ ඉල්ලීමක් විධියට ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කලබල වෙන්න ඕනෑ නැහැ. ඉස්සරහාට පරිපූරකය එනවා. එතැනදී කථා කරන්න පුළුවන්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේක කෝකටවත් ඉස්සෙල්ලා කියලා තිබෙන එක හොඳයි කියලා හිතුවා. එතකොට මතය මොකක්ද කියලා දන්නවා නේ?

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ගරු මන්ත්‍රී අමල් සිල්වා මැතිතුමාට 2018 මාර්තු මාසේ 08 වැනිදා රාත්‍රී 8.30 ට පමණ රත්මලාන කල්දෙමුල්ල හන්දියේදී පිස්තෝලකරුවකුගේ ප්‍රහාරයට ලක් වෙන්න සිදු වුණා. ඒ වෙඩි තැබීමෙන් අමල් සිල්වා ගරු මන්ත්‍රීතුමා දින 11 ක් රෝහල්ගත වෙලා ඉඳලා ඊයේ තමයි තමන්ගේ නිවසට යන්නේ. තමුන්නාන්සේලා කවුරුත් දන්නවා පළාත් සභා මන්ත්‍රීවරයෙක් කිව්වාම ඒ තමන්ගේ කටයුතුවලට අමතරව එතුමා රාත්‍රියේ කල්දෙමුල්ල හන්දියේ තිබෙන ෆාමසියකට බෙහෙත් වගයක් ගන්න ගිය අවස්ථාවේ සැලසුම් සහගතව පිටුපසින් පැමිණි මෝටර් රථයක් සහ මෝටර් සයිකලයක් ඇවිල්ලා එතුමාට වෙඩි දෙකක් තබලා ඒ වෙඩි දෙක තැබුවාට පසු පිටුපස හිටපු තවත් පුද්ගලයෙක් ටී 56 කින් වෙඩි ප්‍රහාරය එල්ල කරන්න හදන වෙලාවේදී එතුමාගේ වාසනාවට ටී 56 මැග් එක හිර වෙලා ඒ වෙඩි දෙකෙන් එතුමාට ප්‍රහාරය එල්ල කරලා ගියා. අමල් සිල්වා ගරු මන්ත්‍රීතුමාට මීට අවුරුදු 05 කට කලින් තමන්ගේ නිවස ඉදිරි පිටදීත් ටී 56 තුවක්කු තුනක් සමග පුද්ගලයෝ තුන්දෙනෙක් පැමිණිලා එතුමා ඝාතනය කරන්න උත්සාහ ගත්තා. ඒ වෙලාවේ එතැන තිබුණු බැරැක්කේ හිටපු යුද්ධ හමුදාව ඉදිරිපත් වෙලා, ඒ පැමිණි දෙදෙනෙක්ට වෙඩි තබා ඝාතනය කළා. ඊට පස්සේ තවත් අවුරුදු 05 කට පස්සේ තමයි මේ මාර්තු මාසේ 08 වැනිදා සිද්ධ වුණේ.

ගරු සභාපතිතුමනි, අපි ඒ ප්‍රදේශවාසීන්ට ස්තුතිවන්ත වෙනවා. වහාම එතුමා රෝහලට අරගෙන ගිහිල්ලා ඒ අවශ්‍ය කටයුතු කළා. අපත් රාත්‍රියේම රෝහලට ගියා. නමුත් ශල්‍යකර්මයකට භාජනය කළා. අද වනකොට ඒ පවුලේ උදවියට ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා, අමල් සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ ආරක්ෂාව පිළිබඳව. මම හිතනවා එතුමාගේ පවුලේ සහෝදරියෝ දෙදෙනෙකු ගරු ප්‍රධාන ඇමැතිතුමාට - ලේකම්තුමා පැමිණිලා ආරක්ෂාව ලබා දෙන්න කියලා ඉල්ලීමක් කළා. අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා ක්‍රියාත්මක වෙලා දැන් මේ අවස්ථාව වනවිට එතුමාගේ නිවසටත්, එතුමා රෝහල්ගත වෙලා ඉන්න අවස්ථාවේත් පොලිස් ආරක්ෂාව ලබා දෙන්න එතුමා කටයුතු කළා. හැබැයි ගරු සභාපතිතුමනි, මේ වෙඩි තැබීම සම්බන්ධව පොලීසියෙන් සිදු කරන පරීක්ෂණ පිළිබඳව අපි සෑහීමකට

පත් වෙන්නේ නැහැ. ඉතා මන්දගාමී ස්වභාවයකින් තමයි ඒ පරීක්ෂණ කටයුතු සිදු වෙන්නේ. CCTV කැමරා ඕනෑතරම් කල්දෙමුල්ල හන්දියේ හැම කඩයකම වාගේ තිබෙනවා. පාරට එල්ල වෙලා තිබෙනවා. නමුත් ඒවා තවමත් පරීක්ෂා කරලා නැහැ. පරීක්ෂා කරමින් පවතිනවා කියන එක තමයි කියන්නේ. මේක ක්ෂණිකව ඇති වුණු දෙයක් නොවෙයි. සැලසුම් සහගතව හිතා මතා, එතුමා ඝාතනය කිරීමේ අරමුණින්ම එතුමා පිටුපස පැමිණිලා, වාහන කිහිපයක් යොදවලා වුණු දෙයක්. නමුත් එතුමාගේ වාසනාව හොඳ නිසා ඒ අවස්ථාවේ වෙඩි පහරවල් දෙකක් වැදිලාත් එතුමා හැසිරුණු ආකාරය නිසා තමයි තුන්වැනි වෙඩි පහර එල්ල නොවුණේ. එතුමා ජීවතුන් අතර ඉන්නවා. එතුමාට මාස දෙකක පමණ කාලයක් නිවසේ සිට ප්‍රතිකාර ලබා ගන්න සිද්ධ වෙයි. එතුමාගේ කකුලේ එක්තරා තැනක තිබෙන ආබාධයක් නිසා. ගරු සභාපතිතුමනි, පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපි මේ වෙලාවේ මතක් කරන්නේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව ලබා දිය යුතුයි කියලා අපි අවස්ථා කිහිපයකදී ඉල්ලීම් කළා. අවශ්‍ය අයට. සමහර අයට අවශ්‍ය නොවෙන්න පුළුවන්. නමුත් අමල් සිල්වා ගරු මන්ත්‍රීතුමා වාගේ අය හැසිරෙන පරිසරය තුළ ඒ පළාත්වල තිබෙන පාතාල ක්‍රියාකාරකම්, ඒ පළාත්වල තිබෙන පළිගැනීම් සහ නොයෙකුත් කටයුතු නිසා සමහර මන්ත්‍රීවරුන්ට යම් යම් චෝදනා දාගෙන යම් යම් සිද්ධීන්වලට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා.

ඒ නිසා ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේගේ මාර්ගයෙන් මතක් කරන්න ඕනෑ ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ වනකොට යම් ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවා. අපි හිතනවා ඒක සෑහෙන්නේ නැහැයි කියලා. ඒ අයගේ සැකයක් තිබෙනවා දැනට තිබෙන පොලිස් ආරක්ෂාව ඉදිරි කාලයේ අයින් කරයි කියලා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමාට පොලිස් ආරක්ෂාව දිගටම ලබා දෙන්නත්, ඒ වාගේම එතුමාට තමන්ගේ කටයුතු කරන්න ඉදිරියේ මැතිවරණ කාලයක් එන්නේ. නොයෙක් නොයෙක් කථා තිබෙනවා. අපි කාටවත් චෝදනා කරන්නේ නැහැ. දේශපාලන ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. පෞද්ගලික ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. පාතාලයේ වෙනත් ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. ඒ මොන ප්‍රශ්නය තිබුණත් මන්ත්‍රීවරයාගේ ජීවිත ආරක්ෂාව ලබා දෙන්න තමුන්නාන්සේ සභාපතිවරයා හැටියට, මේ සභාවෙන් අපි ඉල්ලීමක් කරන්නේ මේකට මැදිහත් වෙන්න කියලා. ඒ නිසා අමල් සිල්වා ගරු පළාත් සභා මන්ත්‍රීතුමාට ඒ අවශ්‍ය ආරක්ෂාව ලබා දෙන්න ගරු ප්‍රධාන ඇමැතිතුමා හරහා තමුන්නාන්සේ කටයුතු කරන්න කියන කාරුණික ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එතුමාගේ සිද්ධිය SMS පණිවිඩයෙන් දැනගත්තු වෙලේ ඉඳන් ප්‍රධාන ඇමැතිවරයා හැටියට මට කරන්න පුළුවන් උපරිම දේවල් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් පළාත් සභා මන්ත්‍රීවරයෙකුට පොලිස් ආරක්ෂාවක් ලැබෙන්නේ නැහැ. නමුත් මම පොලිස්පතිතුමාට කථා කරලා, අදාළ පොලිස් ස්ථානයට කථා කරලා ආරක්ෂාව ලබා දීලා තිබෙනවා. මම හිතන්නේ එතුමා වෙනුවෙන් අපි පළාත් සභාව හැටියට, මහ ඇමැතිවරයා හැටියට, ඔබතුමා හැටියට අපි ගන්න ඕනෑ ක්‍රියාමාර්ග ගත්තයි කියලයි විශ්වාස කරන්නේ. ඉදිරියේදී ප්‍රශ්නයක් ඇති වුණොත් අපි ඒක බලමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා බලාපොරොත්තු වෙනවා ඉදිරියටත් පොලිස් ආරක්ෂාව -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ, එහෙම ගැටළුවක් නැහැ. මම කියන්නේ පළාත් සභාව හැටියට අපෙන් වෙන්න ඕනෑ දේ එතුමා වෙනුවෙන් වුණා කියන එක පිළිබඳව මට සෑහීමකට පත් වෙන්න පුළුවන් කියන එක මම කියන්න ඕනෑ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

පොලිස්පතිතුමාටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ අපි කරපු ඉල්ලීමට ක්‍රියා කිරීම පිළිබඳව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ කාරණය සම්බන්ධව විශේෂයෙන්ම මම ගරු ප්‍රධාන ඇමැතිතුමාට ස්තූතිවන්ත වෙනවා. ඔබතුමා ඉදිරියටත් ඒ ගැන අවධානය යොමු කරලා එතුමාට අවශ්‍ය -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් ගෙන එන්නේ. මීට පෙරත් අපේ මන්ත්‍රීවරු මන්ත්‍රී ධූරයේ ඉන්නකොටම මේ වාගේම වෙඩි තියලා නැති වෙලා තිබෙනවා. ෆායිස් මන්ත්‍රීතුමා මට මතක් වෙනවා. එතුමාටත් මේ වාගේම සිද්ධි වුණා. ඒ වෙලාවේත් අපි කථා කළා. එතුමා හැඟීම් බරව කථා කළා. මෙතුමාටත් ඒ වාගේ ගෙදරට ඇවිල්ලා වෙඩි තියලා තිබෙනවා. අමල් සිල්වා කියන්නේ අපේ සාහෝදර මන්ත්‍රීවරයෙක්. ගරු ප්‍රධාන ඇමැතිතුමා ගත්තු පියවර වාගේම ෆායිස් මන්ත්‍රීතුමා ගැනත් ඒ තීන්දුවම අරගෙන ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ෆායිස් ගරු මන්ත්‍රීතුමා අපෙන් ලිඛිතව ඉල්ලීමක් කළොත් - ඒගොල්ලන්ගේ අම්මා ඉල්ලීම කළේ. ෆායිස් මන්ත්‍රීතුමාටත් අපි කියනවා විධිමත්ම ඉල්ලීම කරන්න එතකොට අපි ඒක පොලිස්පතිතුමාට යොමු කරනවා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

මම හිතනවා මේ සභාවේ මහ ඇමැතිතුමාටත්, සභාපතිතුමාටත් අවුරුදු තුනක් තිස්සේ මම ලිඛිතව ඉල්ලීම් කරලා තිබෙනවා. නමුත් ඒ කිසිම ඉල්ලීමකට අද වනතුරු මට පිළිතුරු නැත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව මම කථා කරන්නේ නැහැ. මොකද, මගේ තිබුණු ආරක්ෂාවත් අයින් කරලා තිබෙන්නේ. මටත් දැන් ආරක්ෂාව නැහැ. ඊට වැඩිය මොනවා කථා කරන්නද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

වෙඩි කන, කන විධියට ආරක්ෂාව දෙන්න. වෙඩි කන්න කලින් ආරක්ෂාව දෙන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, සභාපතිතුමාටත්, අමාත්‍යවරුන්ටත් ආරක්ෂාව නොලැබුණු එකයි, ඒ තිබෙන තර්ජනයයි හාත්පසින්ම වෙනස්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෙනස්. ඒක මම පිළිගන්නවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ නිසා මම කියන්නේ මන්ත්‍රීවරුන්ට තර්ජනයක් තිබෙනවා කියලා ඉල්ලීමක් තිබෙනවා නම් ඒ මන්ත්‍රීවරයාට ආරක්ෂාව ලබා දිය යුතුයි. ඒකට මැදිහත් වෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි මැදිහත් වෙලා තිබෙන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම නැත්නම් අපට වෙන්නේ අනතුරු වුණාට පස්සේ කථා කරන්න විතරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොලිස් කොමිසමට ගියා. පොලිස්පතිතුමාට අපි ලිඛිතව දැනුම් දුන්නා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේ සභාව හැටියට, සභාපතිතුමා හැටියට අපි මැදිහත් වෙන්න ඕනෑ විශේෂයෙන්ම අමල් සිල්වා සහ මොහොමඩ් ෆායිස් යන ගරු මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව අරගෙන දෙන්න. ඒක අපට ලැබෙන්නේ නැහැ කියලා අයින් කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම එකක් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාපතිතුමාට, අමත්‍යවරුන්ට ලැබෙන්නේ නැහැ කියලා - මරණීය තර්ජන නැති අයට නිකන් දෙන්නේ නැහැ. නමුත් මරණීය තර්ජන තිබෙන අයට ලබා දෙන්න අපි කටයුතු කරන්න ඕනෑ කියලා කියන්නේ. ඒක අනිවර්යයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, වෙඩි කන කන විධියට ආරක්ෂාව දුන්නාම හරි - වෙඩි කෑවට පස්සේ තමයි ආරක්ෂාව හම්බ වෙන්නේ. එතකොට අශ්වයා පැනලා ගියාට පස්සේ ඉස්තාලය වැසීමක් වාගේ. ඒ නිසා අඩුම තරමේ නෝනාට පිස්තෝලයක් දුන්නා නම් නෝනා මේ වැඩේ හරියට කරනවා. ඒ නිසා බැරි නම් අඩුම තරමේ නෝනාට පිස්තෝලයක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ප්‍රතිපාදන යෝජනා ක්‍රියාත්මක කිරීම හා මුදල් ගෙවීම්වල ප්‍රමාදයක් සම්බන්ධව අදහස් දැක්වීමට රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ස්තුතියි. පසුගිය වසර ගණනාවක අත්දැකීම් එක්ක බැලුවාම අපි මන්ත්‍රීවරු හැටියට නිලධාරීන් සම්බන්ධයෙන් විවිධ විවේචන ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ අපේ සභා ලේකම් කාර්යාලය ඇත්ත වශයෙන්ම අතිවිශිෂ්ට සේවාවක් වසර ගණනාවක ඉඳලා සිද්ධ කරනවා. ඉතාම වගකිව යුතු ආකාරයට සහ කඩිනමින් ඒ වැඩ කරලා දෙනවා. එය මම අගය කරන්න ඕනෑ. අපේ සභා ලේකම් කාර්යාලය. ඒ වාගේම ඉන් පස්සේ අමාත්‍යාංශවල පල්ලෙහාට යනකොට සමහර වැඩ කටයුතුවලට ඉතාම ප්‍රමාදයක් සිද්ධ වෙනවා. ඒ කියන්නේ අපේ ප්‍රාදේශීය කාර්යාලවල වැඩ කටයුතු කරන කොට. අපි ඉංජිනේරු මහත්වරු, ප්‍රධාන නිලධාරීන් කිහිප දෙනෙකුවත් දැනුවත් කිරීම් සිද්ධ කළා. මේ දෙසැම්බර් වනකොට අවසන් කරපු වැඩවලටත් මුදල් ගෙවීම් කරලා නැහැ, සමහර චෙක්පත් ලැබිලා නැහැ කියලා ඒ ඒ සමිති සමාගම්වලින් අපව දැනුවත් කරනවා. ඉතින් සොයා බැලුවාම සමහර විට ඒ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල යම් යම් ප්‍රමාදයන් සිද්ධ වෙලා තිබෙනවා. එහිදී මට දැනගන්න ලැබුණා, සමහර තැන්වල තමන්ට හිතවත් අය ඒ ව්‍යාපෘති භාර අරගෙන කළාම ඉක්මණින් මුදල් ගෙවීම් කරනවා. අලුත් සමිතියක් හරි අලුත් කණ්ඩායමක් ඒ සඳහා ඉදිරිපත් වනකොට හිතා මතා ඒවායේ ප්‍රමාදයක් සිද්ධ කරනවා. බස්නාහිර පළාත් සභාව හැටියට අපි බලාපොරොත්තු වෙනවා ඔබතුමා හරහා මේ සියලුම අමාත්‍යාංශ නිලධාරීන් සම්බන්ධව අමාත්‍යවරුන්ට සොයා බලලා ඒ කටයුතු කඩිනම් කරන්න කියලා. මොකද, මේ සමිති සමාගම්වලින් ව්‍යාපෘති කරන එකේ වාසියක් තිබෙන්නේ කොන්ත්‍රාත්කරුවාට වැඩිය උවමනාවෙන් ඒ ගම ගැන, ඒ ප්‍රදේශය ගැන හිතලා ඔවුන් ඉතා උනන්දුවෙන් ඒ වැඩේ කරනවා. ඒ මුදලින් සියයට සියයක ප්‍රයෝජනයක් ඒ ගමට ලැබෙනවා. ඒ සමිතිවලට ඒ ශක්තිය ධෛර්ය දුන්නේ නැත්නම්, ඒ අය ආපහු කොන්ත්‍රාත් එකක් කරන්න ඉදිරිපත් වෙන්නේ නැහැ. සමහර වෙලාවට ගමේ සමිතිය කොන්ත්‍රාත් එක අරගෙන කඩෙන් බඩු ණයට අරගෙන තමයි ව්‍යාපෘතිය අවසන් කර ගන්නේ. සමහර සමිතිවල සල්ලි ගොඩක් රැඳිලා තිබෙන්නේ නැහැ.

ඉතින් මේ අයට නිසි වෙලාවට මුදල් ලැබුණේ නැත්නම් ආයෙත් ජීවිතේටවත් කොන්ත්‍රාත් එකකට අත තියන්නේ නැහැ. මොකද, මාස 06 ක්, මාස 09 විතර සල්ලි හම්බ වෙන්න ගියොත් එහෙම කඩේකින් නැවත බඩුවක් ගන්න හම්බ වෙන්නේ නැහැ. මම මේ ප්‍රායෝගික තත්ත්වය පැහැදිලි කරන්නේ. ඒ නිසා මේ සියලුම ගෙවීම් කරන කොටත් ඒ ව්‍යාපෘති සම්බන්ධයෙනුත් අමාත්‍යාංශවල මීට වැඩිය සොයා බැලීමක් කරන්නය කියලා ඔබතුමා හරහා සියලුම අමාත්‍යවරුන්ගේ අවධානයට යොමු කරනවා. ඒ වාගේම අපේ සභා ලේකම් කාර්යාලයට විශේෂයෙන්ම මම ප්‍රසංශා කරනවා. ඒ අයට යම් සිද්ධියක් දුරකථනයෙන් හරි දැනුම් දුන්නොත් මෙහෙම අඩුපාඩුවක් තිබෙනවා කියලා

[ ගරු රෝස් ප්‍රනාන්දු ]

සොයා බලලා අපට ප්‍රතිඋත්තරයක් දෙනවා. දූරකථනයෙන් හරි දැනුම් දුන්නොත් මෙහෙම අඩුපාඩුවක් තිබෙනවා කියලා, හොයලා බලලා අපට ප්‍රති උත්තරයක් දෙනවා. ඒ ගැන නිලධාරීන්ට, විශේෂයෙන් සැලසුම් අංශය සංශෝධනයක් කරන්න වුණොත් හදිසියේ හරි ඉතා කඩිනමින් කරලා, ඒවා ලබා දීලා ඒ අවශ්‍ය සහයෝගය ලබා දෙනවා. ඒ පිළිබඳව අපි ස්තුතිය කෘතඥතාව පළ කරමින්, මේ ප්‍රාදේශීය කාර්යාලවල තිබෙන අඩුපාඩු ඉංජිනේරු කාර්යාලවල තිබෙන අඩුපාඩු සොයා බලන්න කියලා අවධානය යොමු කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

## පළාත් සභාවේ කටයුතු - I
PROVINCIAL COUNCIL AFFAIRS - I

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, *"අද දින (2018.30.20 දින) න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ අංක (01) හි සඳහන් වැඩ කටයුතු සඳහා රීති අංක 52(5), 57(1), 57(4) හා 57(5) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය"* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## පළාත් සභාවේ කටයුතු - II
PROVINCIAL COUNCIL AFFAIRS - II

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, *"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය"* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## 2018 පරිපූරක ඇස්තමේන්තුව - 01
SUPPLEMENTARY ESTIMATE - 01 - 2018

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2018 වර්ෂය සඳහා බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශවල මතු දැක්වෙන අවශ්‍යතා වෙනුවෙන් අමතර ප්‍රතිපාදන සලසා දීම සඳහා, එනම්,*

- *පළාත තුළ වැඩ අවසන් නොකළ පාසල් ගොඩනැගිලිවල වැඩ අවසන් කිරීම, අත්‍යවශ්‍ය පාසල් ගොඩනැගිලි ඉදි කිරීම් හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනෙකුත් ඉදි කිරීම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමද,*
- *පළාත් රෝහල්වල අත්‍යවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීම, අලුත්වැඩියාව හා නවීකරණය කිරීම, වෛද්‍ය උපකරණ මිලදී ගැනීම හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වියදම් දැරීම වෙනුවෙන් ප්‍රතිපාදන සැලසීම ද,*
- *අනෙකුත් පළාත් සභා ආයතන ගොඩනැගිලිවල වැඩ අවසන් කිරීම, අත්‍යවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීම් හා අනෙකුත් ඉදි කිරීම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීම ද යන අවශ්‍යතා වෙනුවෙන්,*

*2018 වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින් ඒ සඳහා අවශ්‍ය රුපියල් තුන් බිලියන තිස්පස් මිලියන පනස් පන් දහසක් (රු.3,035,055,000/-) වන මුළු ප්‍රතිපාදනය දැනට භාණ්ඩාගාර රිපෝ යටතේ ආයෝජනය කර ඇති මුදලින් කොටසක් ලබා ගැනීම මගින් පියවා ගැනීමට ද අපේක්ෂිතව පිළියෙල කරන ලද 2018 පරිපූරක ඇස්තමේන්තුව - 01 අනුමත කළ යුතුය"* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2018 පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳ යෝජනාව සම්බන්ධයෙන් වියදම් කිරීමට බලාපොරොත්තු වන

ව්‍යාපෘති සම්බන්ධව අපි ගරු මන්ත්‍රීතුමන්ලාව දැනුවත් කරලා තිබෙනවා. න්‍යාය පත්‍රය සමග එවා තිබෙනවා. මේ පිළිබඳව සභාවේ අවශ්‍යතාවය මත සාකච්ඡාවට යන්න පුළුවන්. සභාව සාකච්ඡාවකට යන්න අවශ්‍යද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, ගරු මහ ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද පරිපූරක ඇස්තමේන්තුවට අදාළ යෝජනාව සම්බන්ධයෙන් බිලියන තුනයි මිලියන තිස් පන්දහසක මුදලක් සම්බන්ධයෙන් වියදම් කරන ආකාරය පිළිබඳව ව්‍යාපෘති යෝජනා 241 ක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ ව්‍යාපෘති යෝජනා 241 ලබා ගැනීමේදී අනුගමනය කළ ක්‍රියා මාර්ගය සහ එහි තිබෙන විෂමතාවයන් සම්බන්ධයෙන් මේ අද සභාව ආරම්භ කරපු මොහොතේ සිට මේ මොහොත දක්වා විටින් විට මතු වුණා. ඒ මතු වුණු කාරණාවල පූර්ව නිමිත්ත තමයි මේ පරිපූරක ඇස්තමේන්තුව මේ සභාවේ අනුමත වීමට තිබෙන ඉඩකඩ අඩුයි කියන එක පිළිබඳව මගේ විශ්වාසයක් තිබෙනවා. ඒ අඩුවීමට විශ්වාසයක් තිබෙන්නේ, මෙහි සාධාරණ සහ නියමයන්වලට අනුකූල වන ආකාරයට බෙදී නොයන ප්‍රතිපත්තියක් තුළ මේ කටයුත්ත කරලා තිබෙනවා. දැන් උදාහරණයක් විධියට කිව්වොත් එහෙම අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් මේ සභාවේ සෑම සියලු කාලවකවානුවකම හැම සභාවකම ගැටලු, ප්‍රශ්න මතු වුණා. අදත් මේ සභාවේ මේ පරිපූරක ඇස්තමේන්තුවට සහාය දෙන්න යම් කෙනෙක් ඉන්නවා නම් සහාය දෙන කෙනාගේ හිතෙත් තිබෙනවා, අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් යම් විවේචනයක්. එහෙම විවේචන තියාගෙන අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා අති විශාල ධනස්කන්දයක් විය පැහැදම් කිරීමේ බලාපොරොත්තුවෙන් මේ පරිපූරකය ගෙනැල්ලා තිබෙනවා. එහෙම නම් මේක ගෙන ඒමේ බලාපොරොත්තුව මොකක්ද කියන එක හැමෝටම ගැටලුවක් වෙනවා. මම දීර්ඝ වශයෙන් විස්තර කියන්න යන්නේ නැහැ. එහෙම අවශ්‍ය වුණොත්, අද දවසේ විවාදයකට යනවා නම් අපි ඒ විවාදයේදී ඒ කාරණා කථා කරන්න පුළුවන්. හැබැයි ඉල්ලීමක් කරනවා. අපි අවංකවම මහ ඇමතිතුමාට හිතවත්. මහ ඇමතිතුමා අපට හිතවත් නැති එක වෙනම දෙයක්. මහ ඇමතිතුමා හිතාගෙන ඉන්නේ, මහ ඇමති වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්, 2014 ගත්තු ඡන්දවලට කියලා. එහෙම නොවන බවට මහ ඇමතිතුමාට විටින් විට මතක් කරලා දෙන්නත් ඕනෑ. ඒ මතක් කරලා දුන්නේ නැත්නම් මහ ඇමතිතුමා කියන්නේ මේකට යහපාලනයක් නැහැයි කියලා. අනික් ඇමතිවරු හතර දෙනාටත් ඒක පොදුයි. අන්න ඒ නිසා මේ කටයුත්ත ගෙනැල්ලා අවසානයේ අමාරුවේ වැටෙන්නේ නැතිව - මොකද, අපට පූර්ව අත්දැකීමක් තිබෙනවා. විපක්ෂ නායකතුමා සම්බන්ධයෙන් ඒ වාගේම ධූරධාරීන් සම්බන්ධයෙන් මේකේ සම්මත කරගත්තු පරිපූරකවලදී ඉන් අනතුරුව ක්‍රියාත්මක කරපු ආකාරය පිළිබඳව. අන්න ඒ නිසා ඉල්ලීමක් කරනවා, විපක්ෂය නියෝජනය කරන සියලු ගරු මන්ත්‍රීවරුන්ගෙන්. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන සියලු ගරු මන්ත්‍රීවරුන්ගෙන්. අදහස්වලට ගැලපෙන පරිපූරකයක් ගෙන්න. නැත්නම් අද දවසේ මේ යෝජනාව ඉදිරියට ගෙනිහිල්ලා, වෙනත් විශේෂ සභාවක් හරි දාලා මේක සියලු දෙනාගේ එකඟත්වයෙන් ගේන්න. අපි විරුද්ධ නැහැ. අපි කියන්නේ, සල්ලි තිබෙනවා නම් වියදම් කරන්න ඕනෑ. ඒවා ප්‍රදේශයේ මහජනතාවට ඵල ප්‍රයෝජන ලැබෙන පරිදි අධ්‍යාපන, සෞඛ්‍ය, කෘෂිකර්ම, ධීවර ආදී විෂයයන්වලට බෙදෙන්න ඕනෑ. වෙන් වෙන්න ඕනෑ.

හැබැයි, ඒවායේ පොඩි විනිවිද භාවයක් පෙනෙන්න ඕනෑ, මේ කරන්න හදන්නේ ඇයි කියන එක. මේක කරන්න හදන්නේ පළාත් පාලන ආයතන සියල්ල මේ පරිපාලනයෙන් ගිලිහිලා වෙනත් කට්ටියගේ බලය අතට ගියාට පස්සේ පළාත් පාලන විෂයයට අඩු මුදලක් දාලා අධ්‍යාපනයට වැඩි මුදලක් දාලා අර දෙන්න බැරි ගෑණි අහලා ගියත් සැපයි කියන තත්ත්වයට ගේන්න නම් හදන්න එපා. ඒ නිසා අපටත් අවසානයේ සතුටු වෙන්න, යහපාලනය හදන්න මහන්සි වුණු මේ විපක්ෂයේ අපි. ඒ යහපාලනයේ ප්‍රතිඵල තමයි ඔබතුමා හැරුණු කොට අනික් සියලු ධූරධාරීන්, ඔබතුමා එදත් සභාපති. මේකේ මහ ඇමති ප්‍රසන්න රණතුංග ඉන්න කොටත්. ඔබතුමා අදත් සභාපති. හැබැයි අනික් සියලු ධූරධාරීන් යහපාලනයේ ප්‍රතිඵල විධියට පත් වුණු අය. ගරු මහ ඇමතිතුමා සැරින් සැරේට කියනවා, මට යහපාලනයක් නැහැ. මම පළාත් සභාවේ මෙහෙමයි කියලා. හැබැයි මතක් කර ගන්න ඕනෑ. යහපාලනය නැත්නම් මහ ඇමතිතුමාට ඕකත් නැහැ. අනික් ඇමතිවරු හතර දෙනාටත් එහෙමයි. හැබැයි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ මේකේ සල්ලි වෙන් කරලා තිබෙනවා. සෞඛ්‍ය ඇමතිතුමා සෞඛ්‍ය ඇමති වෙන්නේ අපේ ප්‍රතිඵලයක් විධියට. අපට මොනවද ලැබුණේ? අපට කිසි දෙයක් ලැබිලා නැහැ. මොනවද ඒ අයට කර ගත්තේ?

[ ගරු කේ.ඩී. අරුණ දීපාල් ]

ඒ අයට කරගත්ත දේවල් අපි දන්නවා. ඒ නිසා අමාරුවේ වැටෙන්නේ නැතිව ඉල්ලීමක් කරනවා. මේ පරිපූරක ඇස්තමේන්තුව කාත් එක්කත් සාකච්ඡා කරලා, සංශෝධන සහිතව ඊළඟ සභාවට ගේන්න. නැත්නම් විශේෂ සභාවකට ගේන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, ගැටලුවක් තිබෙනවා. මේ පරිපූරක ඇස්තමේන්තුව ගෙන එන්නේ, මේ මුදල් වර්ෂය ආරම්භ කරපු අවස්ථාවේදී. මේ වන කොට අයවැයෙන් ඉදිරිපත් කරපු මූල්‍ය යෝජනා පිළිබඳව කිසිම ක්‍රියා මාර්ගයක්වත් - මොන ක්‍රියා මාර්ගයක්වත් ගිවිසුම් අත්සන් කරලාද? ඒවා ක්‍රියාත්මක කරලා, මේවාට කොපමණ මුදලක් වෙන් කරලාද? ඒවා කිසිම දෙයක් නැතිව අයවැය පැත්තකට දාලා විශාල මුදලක් මිලියන 3055 ක විතර මුදලක් දැන් මේ පරිපූරකයක් ගේනවා. වර්ෂයට ඉදිරිපත් කරපු අයවැය කිසිම තේරුමක් නැහැ. අයවැයේ නැති යෝජනාවලට මම අහන්නේ මෙහෙම පරිපූරකයක් ගේන්න - අනික් එක, අපේ තිබෙන තැන්පත් මුදල් මේ හොල්ලලා ගන්නේ. මේවා ඇදලා ගන්න පරිපූරකයක් ගෙන්න තිබෙන නීතිමය හැකියාව මොකක්ද, කියන එක. නීතිමය හැකියාවක් තිබෙනවාද කියන එක අපට දැන ගැනීමේ අවශ්‍යතාවයක් තිබෙනවා. මොකද පස්සේ කාලයක මේවාට විරුද්ධව ඇවිල්ලා අපට පෞද්ගලිව මන්ත්‍රීවරුන්ට Sercharge වලින් ගෙවන්න සිද්ධ වුණොත් කවුද ඒ වගකීම දරන්නේ? අපට මේකේ නීතිමය තත්ත්වය ගැන පැහැදිලි කිරීමක් කරලා දෙන්න. නිලධාරීන්ට කියන්න එහෙම ගැටලුවක් නැත්නම් මුදල් ලේකම්තුමාට හරි එහෙම නැත්නම් ලේකම්තුමාට හරි මේකේ නීතිමය තත්ත්වය මේ සභාවට පැහැදිලි කරන්න කියන්න. මේ තවම වර්ෂයේ මුල. වර්ෂයේ මුල මේ මුදල් ටික අයවැය සම්මත වුණු යෝජනා ක්‍රියාත්මක නොකර හිටි හැටියේ මේ හදිසියේම පරිපූරකයක් ගෙනැල්ලා විශාල යෝජනා ප්‍රමාණයක් මේකට ඇතුළත් කරලා මේ ඉදි කරන්න තිබෙන ගොඩනැගිලි සහ ඒ අවස්ථාවල්වලට ප්‍රධාන දේවල් යොමු කරලා මේ ගෙනැල්ලා තිබෙන පරිපූරකයේ හදිසි අවශ්‍යතාවය මොකක්ද තිබෙන්නේ? මීට වඩා එහෙමනම් පරිපූරකයෙන් අවශ්‍ය කරලා තිබෙනවා, පාසල්වල ඩෙස් බංකු නැහැ. වැසිකිළි කැසිකිළි නැහැ. දරුවන්ට යන්න ඒවායේ අඩුපාඩු තිබෙනවා. නමුත් ඒවා තිබෙද්දී මේ විශාල ගොඩනැගිලි ප්‍රමාණයකට මුදල් වෙන් කරලා තිබෙනවා. මේ ගොඩනැගිලි හදාගෙන යන්න. එහෙමනම් ඒ අවශ්‍යතාවයන් ටිකට යන්න. ප්‍රධාන අවශ්‍යතාවයන් ටිකට. ඒවා නැතිව ඒවා පැත්තකට දාලා වහාම ගෙනැල්ලා දඩබඩ ගාලා සල්ලි ටික වෙන් කරලා, මේ මහා බිලියන ගණන් වෙන් කරලා -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

භාගෙට ඉදිරි කරපුවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

භාගෙට ඉදි කරපු ගොඩනැගිලි නොවෙයි. අලුත් ගොඩනැගිලි, අලුත් ක්‍රීඩා පිටි, අරවා මේවා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරනවා. නමුත් ගමට ගියාම ගමේ මිනිස්සු මුදල් ඉල්ලුවාම, අපි කථා කළාම කියනවා මුදල් නැහැ, මුදල් නැහැ, මුදල් නැහැ. ඒ යෝජනා එකක්වත් මේවාට ඇතුළත් වෙලත් නැහැ. මේක මොකක්ද කියන එක, මේ අවශ්‍යතාවය මොකක්ද කියන එක, මේ කඩිනම මොකක්ද කියන එකයි ගැටළුව. ඉස්සෙල්ලා මුදල් වර්ෂයට යෝජනා කරපු යෝජනා ටික ක්‍රියාත්මක කරලා ඒ අඩුපාඩු සම්බන්ධයෙන් කටයුතු කරලා අපට මේක ක්‍රියාත්මක කරන්න ඉස්සෙල්ලා, මේක ගේන්න තිබෙන මූල්‍යමය හැකියාව, වර්ෂයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කරන්න ඉස්සෙල්ලා මේ වාගේ පරිපූරකයක් ගේන්න හැකියාව මොකක්ද කියන එක පිළිබඳව වගකීමක් ඇති නිලධාරීන් හරහා අපව දැනුවත් කරන්න. වගකීමක් ඇති විධියට. එහෙම නැතිව එක පාරට ගෙනත් දාලා අවසානයේදී කොයි වෙලේ හරි අපට ආවොත් ඔබතුමන්ලා අතින් මේ මුදල් ටික ගෙවන්න කියලා අපට ගෙවන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේ ගැන පැහැදිලි කිරීමක් කරලා දෙන්නය කියලා කරුණාකර ඉල්ලා සිටිනවා, ගරු සභාපතිතුමා. ඔබතුමාගේ වගකීමක් ඒක. ගරු මන්ත්‍රීවරුන්ගේ වගකීම ආරක්ෂා කරන එක.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, එතුමා කිව්ව කථාව ඇත්ත. ඩෙස් බංකු බරපතළ හිඟයක් තිබෙනවා. මේ වන කොට අපේ 2017

වර්ෂයේ ප්‍රතිපාදනවලින් මිලියන 150 ක් අපි වෙන් කරලා තිබෙනවා. ටෙන්ඩර් කරලා ගන්නත් අපි දැන් අවශ්‍ය උපදෙස් දීලා තිබෙනවා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමනි, දැන් මේ පරිපූරකය සම්බන්ධව අපි කණ්ඩායම් රැස්වීමේත් කථා කරපු වෙලාවේ කිව්වා, මෙතැන විෂමතාවයක් තිබෙනවා. ඒ විෂමතාවය අනුව මේ පැහැදිලි කිරීමක් කරන්නය කියලා ගරු මහ ඇමතිතුමාත් අපෙන් ඉල්ලීමක් කළා. ඒ අනුවයි මම මේ පැහැදිලි කිරීම කරන්නේ, සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන්. මොකද, අධ්‍යාපන ඇමතිතුමාගේ දැඩි සම්බන්ධයක් මේකට නැහැ. එතුමාට චෝදනා කරන එකත් එක පැත්තකින් වැරදියි කියන එකත් කියන්න ඕනෑ. එක පැත්තකින් ව්‍යූහ කමිටුවලින් යෝජනා අරන් තිබෙනවා. කලාප 11 න් ඒ වාගේම කොට්ඨාශ 38 න්. ඒ අරන් තිබෙන යෝජනාවලින් තිබෙන්නේ, යෝජනා 158 යි. මිලියන 884 යි . යෝජනාවලින්. ඒ කියන්නේ, කලාප 11 න් කොට්ඨාශ 38 න් මුළු බස්නාහිර පළාතේම ව්‍යූහ කමිටුවෙන් යෝජනා 158 යි. මිලියන 884 යි. ඒ 1996 ක් කියන, පරිපූරකයේ අධ්‍යාපනයට වෙන් වෙලා තිබෙන මුදලෙන්. ඒ වාගේම ව්‍යූහ කමිටුවට එන්නේ නැතිව යෝජනා 32 ක් දාලා තිබෙනවා. ඒකේ වටිනාකම මිලියන 892 ක්. එතකොට මේ ආකාරයෙන් ස්මාට් ක්ලාස්වලට කළුතරට 30 යි. අනික් දිස්ත්‍රික්ක දෙකට මිලියන 40 ගණනේ දාලා තිබෙනවා. මහරගම පොල්වත්ත ක්‍රීඩාංගණයට 100 ක් දාලා තිබෙනවා. මේ විදියට තමයි 1996 හැදෙන්නේ. ඒ වාගේම තමයි මේ කොට්ඨාශ 38. මා ළඟ තිබෙනවා, ව්‍යාපෘති කීයද? වෙන් වුණු ගණන කීයද? කියලා. ඉංගිරිය ගත්තොත් එක ව්‍යාපෘතියයි. මිලියන 04 යි. දැන් එතකොට වලල්ලාවිට ගත්තොත් ව්‍යාපෘති 02 යි. මිලියන 4.7 යි. මහර ගත්තොත් මිලියන 05 යි. ව්‍යාපෘති 01 යි. එතකොට බුලත්සිංහල ගත්තොත් ව්‍යාපෘති 01 යි. මිලියන 07 යි. කටාන ව්‍යාපෘති 02 යි. මිලියන 08 යි.

මම මේ කියන්නේ ගරු සභාපතිතුමනි, කටාන ගත්තොත් මන්ත්‍රීවරු හය දෙනෙක් විතර ඉන්නවා. ඒත් මිලියන 08 යි ව්‍යූහ කමිටුවෙන් ගිහිල්ලා තිබෙන්නේ. හැබැයි, මම පැහැදිලිව කියනවා. එතැන තිබෙන අසාධාරණය තමයි කලාප මට්ටමින් ගත්තාම දැන් කැලණිය කලාපයේ අර මම කිව්ව මිලියන 892 ඒ කියන්නේ,අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යූහ කමිටුවලින් එන්නේ නැතිව ආපු, දාපු ව්‍යාපෘති කැලණිය කලාපයේ ව්‍යාපෘති 01 යි. මිලියන 24 යි. මම ඒවා ඕනෑ නම් කියන්නම්. මේ ටික කියන්න දෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ව්‍යාපෘති ටික මොනවද?

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

අහගන්න. දෙන්නම්, දෙන්නම්. ඔබතුමාට දෙන්නම්. මීගමු කලාපයේ ව්‍යාපෘති 05 යි. මිලියන 131 යි. ඊළඟට මතුගම ව්‍යාපෘති 02 යි. මිලියන 08 යි. කළුතර ව්‍යාපෘති 01 යි. මිලියන 13 යි. කොළඹ කලාපයේ ව්‍යාපෘති 01 යි. මිලියන 16 යි. ජයවර්ධනපුර කලාපයේ ව්‍යාපෘති 11 යි . මිලියන 440 යි. පිළියන්දල කලාපයේ ව්‍යාපෘති 04 යි. මිලියන 99 යි. හෝමාගම කලාපයේ ව්‍යාපෘති 05 යි. මිලියන 161 යි. මෙන්න මේ විදියට තමයි හැදෙන්නේ. ඒ වාගේම තමයි ව්‍යූහ කමිටුවට ඉදිරිපත් වුණු ඒ යෝජනාවල අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ව්‍යාපෘති 02 ක් අතුළත් වෙලා නැහැ. එකක් තමයි, හොරණ කලාපයේ වැලිකල ප්‍රාථමික විද්‍යාලයේ මිලියන 02 ක්. ඒ වාගේම ඊළඟට අල් ගස්සාලි මුස්ලිම් විද්‍යාලයට මිලියන 05 ක්. ඒ කියන්නේ මේ ව්‍යූහ කමිටුවලින් ආපු ඒවායින් දෙකක් ඇතුළත් වෙලත් නැහැ. මේ වාගේ තත්ත්වයක් තිබෙන්නේ.

අනික් එක තමයි අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය. සෞඛ්‍ය අමාත්‍යාංශයේ දාලා තිබෙන මිලියන 719 න් මිලියන 359 ක් විතර දාලා තිබෙන්නේ කළුතරට. එතකොට ගම්පහට දාලා තිබෙන්නේ මිලියන 77 යි. ඇත්තටම කියනවා නම් මේ ඊයේ පෙරෙයිදා මේ ගම්පහ රෝහලේ ලිෆ්ට් එක අබලන් වෙලා එක්කෙනෙක් මැරුණා. අඩුම ගණනේ ඒකටවත් මේ ව්‍යාපෘතියෙන් සල්ලි වෙන් වෙලා නැහැ. මේ වාගේ යම් විෂමතාවයක් මේ තුළ තිබෙනවා. ඒ නිසා ඒ වාගේම -

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මට විනාඩියක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පස්සේ කථා කරන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

පොඩි පැහැදිලි කිරීමක්. ගම්පහ රෝහලට ලිෆ්ට් එකක් ගන්න දැනටමත් කැබිනට් අනුමැතිය දීලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. එතුමා කථා කළාට පස්සේ ඔබතුමා කථා කරන්න.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

එතකොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගම්පහ කරන වැඩ ටික. ගම්පහට ශීතකරණ පද්ධතියක් දාලා තිබෙනවා. ඔබතුමා ඒවා කියන්න.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

එතකොට ගරු සභාපතිතුමනි, මෙන්න මේ වාගේ මට ව්‍යාපෘතියෙන් ව්‍යාපෘතිය දෙන්න පුළුවන්. මම ළඟ සියලු තොරතුරු තිබෙනවා. ඒකට කාලය ගන්නේ නැහැ. අනික් එක තමයි අර මෙතුමා කියපු කථාව. ඒ කියන්නේ අපේ ඩිපොසිට් එකෙන් සල්ලි ගන්න එක. කමක් නැහැ. මිලියන 6500 ක් තිබෙනවා. 3500 ක් ගත්තාට කමක් නැහැ. මීට වැඩිය ගත්තොත් ගැටලුවක් මතු වෙනවා. මොකද PSDG වලින් දෙන මුදල්, මුදල් අමාත්‍යාංශය දෙන්නේ නැති වුණාම අතේ තිබෙන සංචිතයෙන් අරන් තමයි වියදම් කරන්නේ. මම උදාහරණයක් කියන්නම්. 2016 PSDG නම් කරලා තිබුණා. මිලියන 2894 ක් දෙනවා කියලා. ඒකෙන් හම්බ වුණේ මිලියන 1100 යි. එතකොට මිලියන 1794 ක් ලැබුණේ නැහැ. එතකොට අපි 100% ක් නැතිව 90% ක් වැඩ කළත් ඒ මුදල යන්නේ අපේ සංචිතයෙන්. එතකොට ඒක 38% ක ප්‍රතිශතයක් හැටියට මෙහි සටහන් වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි 2017 මිලියන 2045 ක් දෙනවා කියලා තිබෙනවා. නමුත් දුන්නේ මිලියන 500 යි. එතකොට මිලියන 1545 ක් දීලා නැහැ. අපි හිතමු 80% ක්, 90% ක් වැඩ කළත් අඩු ගණනේ මිලියන 1000 කට වඩා අපට සංචිතයෙන් ගන්න වෙනවා. එතකොට මේකේ ප්‍රතිශතය 24% යි. මෙන්න මේ විධියට සංචිතය ආරක්ෂා කිරීමේ වගකීමත් ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරීන්ට තිබෙනවා. සංචිතයේ නැති වුණොත් PSDG වලින් දෙන මුදල් මහා භාණ්ඩාගාරයෙන් දුන්නේ නැත්නම් අපි ව්‍යාපෘති කරයි. අන්තිමට ගෙවා ගන්න බැරිව යයි. මෙන්න මේ කාරණා සහ මේ විෂමතා - හැබැයි අපේ ගරු මහ ඇමතිතුමා කිව්වා, නිලධාරීන් මේක සකස් කරද්දී. යම් අසාධාරණයක් වෙලා තිබෙනවා. ඒ නිසා එතුමා කිව්වා, අපි සියලු දෙනාට සාධාරණයක් කරන්න මේ බ්‍රේක් ඩවුන් එක, නැත්නම් මේ විශ්ලේෂණය කරන්න කියලා. ඒ අනුව දැන් අපි කළා. ඉතින් ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ. ඒ හැම දෙනාටම සාධාරණයක් වන හැම කොට්ඨාශයෙන් කොට්ඨාශයේ ඉන්න හැම මන්ත්‍රීවරයෙකුට සාධාරණයක් වන විධියට සංශෝධනයක් කරලා මේ සාධාරණය අපේ සියලු ගරු මන්ත්‍රීවරුන්ට ඉෂ්ට කරන්නය කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේ මුදල් වෙන් කරන්න ඉස්සෙල්ලාම මේ සභාවේම 2016 වසරේ ළඟම පාසල හොඳම පාසල කියන එකේ ව්‍යාපෘති තෝරා ගත්තා. ඒ සියලුම ව්‍යාපෘති තෝරා ගත්තේ කලාප කාර්යාල සහ කොට්ඨාශ කාර්යාල හරහා. ඒ මුළු එකතුව නව ව්‍යාපෘති සහ අලුත්වැඩියා කිරීම් කියලා වෙන් කරපු ව්‍යාපෘති සංඛ්‍යාව 3351 යි. නව ව්‍යාපෘති 466 යි. අලුත්වැඩියා කිරීම් 2885 යි. ගරු සභාපතිතුමනි, මේ වාගේම පරිපූරක ඇස්තමේන්තුවට ඉදිරිපත් කළා, මිලියන 7057 ක් ලැබෙනවා කියලා. මධ්‍යම ආණ්ඩුවෙන්. ඒකට මේ පළාත් සභාවේ එදා හිටපු ප්‍රධාන ලේකම් ජයන්ති විජේතුංග මහත්මිය ඉසුරුපායේ අධ්‍යාපන අමාත්‍යාංශය එක්ක අවබෝධ ගිවිසුමක් අත්සන් කළා. ඒ අත්සන් කරලා තමයි මේ ව්‍යාපෘති 3351 ට මිලියන 7057 ක් අවුරුදු ගණනාවක් තුළ ලැබෙනවා කියලා මේක සභාවට ඉදිරිපත් කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මම පොඩි ප්‍රකාශයක් කරන්නම්. ඒ ළපාහොපා ව්‍යාපෘතිය කවදාවක්වත් ව්‍යූහ කමිටුවට ආවේ නැහැ. වෙනම ගියේ ඒවා. ඒවා කවුරුත් දන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හරි. ගරු සභාපතිතුමනි, ඒකට තෝරාගත්ත ව්‍යාපෘති සංඛ්‍යාව ව්‍යූහ කමිටුවට ආවේ නැහැ. නමුත් කලාප කාර්යාලවලින් තමයි හදලා ඇරියේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරු දන්නෙත් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

3351 යි. මේ වන කොට හදලා තිබෙන්නේ, නව ව්‍යාපෘති 147 යි. අලුත්වැඩියා 1332 යි. 1479 යි හදලා තිබෙන්නේ. තව 1872 කට ගිවිසුම්ගත වෙලත් නැහැ. 1872 කට ගිවිසුම්ගත වෙලත් නැහැ. ඉතින් අපි අහන්නේ, ළඟම පාසල හොඳම පාසලෙන් හඳුනාගත්ත නව ව්‍යාපෘති සහ අලුත්වැඩියා කිරීම් 1872 ට ගිවිසුම්ගත වෙන්නේ නැතිව මිලියන 7000 න් දැනට ලැබිලා තිබෙන්නේ, මිලියන 2656 යි. දැනට ගිවිසුම්ගත වුණු ඒවාට ලැබෙන්න ඕනෑ, මිලියන 5380 ක්. ඒකෙන් භාගයයි ලැබිලා තිබෙන්නේ. අද ගිවිසුම්ගත වෙලා, වැඩ කරලා මුදල් නොලැබී තිබෙන කොට මේ ව්‍යාපෘති තිබෙන කොට තවත් ව්‍යාපෘති 241 ක් අනුමත කරන්නේ කොහොමද? එතකොට අර ව්‍යාපෘතිවලට වග කියන්නේ කවුද? ළඟම පාසල හොඳම පාසල අවුරුදු ගණනාවකට ව්‍යාපෘති හැදුවා නම්, ඒ ව්‍යාපෘතියෙන් භාගයට භාගයක් දැන් හදලා ඒකට මුදල් ලැබිලාත් නැත්නම්, ඒ වාගේම භාගයක් තවමත් ගිවිසුම්ගත වෙලත් නැත්නම් තවත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘතිවලට සල්ලි වෙන් කරන්න කොහොමද? ඉස්සෙල්ලා එහෙම නම් වෙන් කරන්න ඕනෑ මේ ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතියට. මොකද, අවබෝධතා ගිවිසුමක් අත්සන් කරලා තිබෙන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ළඟම පාසල හොඳම පාසල මධ්‍යම ආණ්ඩුවේ එකක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මධ්‍යම ආණ්ඩුවේ වුණත් සල්ලි එනකන් වැඩ කරන්න එපැයි. තෝරාගත්තු තැන්. ගරු සභාපතිතුමනි, අනික් එක තමයි අර සහන් ගරු මන්ත්‍රීතුමා කිව්ව විධියට අපට මේ රජය හැමදාම පොරොන්දු වෙනවා, රජයේ ඇස්තමේන්තුවක් දුන්නාම පොරොන්දු වෙනවා, එකඟ වෙනවා ප්‍රදාන ලබා දෙන්නම් කියලා. ලැබුණු ප්‍රදාන හැටියට අපට මුදල් හැමදාම අඩු වෙලා. අපට ඉල්ලන ප්‍රමාණය කවදාවක්වත් ලැබිලා නැහැ. අඩුවෙන් තමයි ලැබිලා තිබෙන්නේ. එතකොට පැහැදිලිව අපි කියන්න ඕනෑ, මෙතැන මෙදාපාර මේ ආයෝජන රිපෝ එකේ එකඟ වෙලා තිබෙන මුදල් ටික 2015 තිබුණා මිලියන 7250 ක්. ඒ මිලියන 7250 ට ඒ වසරේ පොළී මුදල් ලැබුණා, මිලියන 405 ක්. 2016 තිබුණා, 6750 ක්. ඒ 6750 ට පොළී මුදල් ලැබුණා, මිලියන 578 ක්. 2017 වසරේ 6750 ට පොළී මුදල් ලැබුණා, මිලියන 670 ක්. ඉතිහාසයේ හැමදාම මේ පරිපූරකයක් ඉදිරිපත් කළා නම් ඉදිරිපත් කළේ අපේ මේ රිපෝ ආයෝජනවලින් ලැබෙන පොළී මුදල්වලටයි, අපට අවුරුද්ද පුරා ලැබෙන ආදායම්වලින් ලැබෙන මුදල් වලටයි. ඒ දෙකම එකතු කරලා තමයි මේකට පරිපූරක ඉදිරිපත් කරන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මෙරිල් ගරු මන්ත්‍රීතුමා බොරු කියනවා කියලා මහේෂ් ගරු මන්ත්‍රීතුමා කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මයික් ඕෆ් කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමාට පස්සේ කථා කරන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් මයික් එක ඕෆ් කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ නිසා අපි පැහැදිලිව කියනවා. පරිපූරක ඇස්තමේන්තු ඉතිහාසයේ හැමදාම ඉදිරිපත් කළේ, ලැබුණු පොළී මුදල සහ ආදායම වැඩි වෙන කොට. කවදාවත් මේ ෆික්ස් ඩිපොසිට් එකේ සල්ලි අරගෙන අපි මෙතැනට වියදම් කරලා නැහැ. ඒකට හේතුවක් තිබෙනවා. අර සහන් ගරු මන්ත්‍රීතුමා කියන විධියට රජයේ ප්‍රදාන අඩු වෙන කොට, රජයේ ප්‍රදාන පරක්කු වෙන කොට මේ මුදල් වලින් තමයි මේ පළාත් සභාව පවත්වාගෙන ගියේ. අද තිබෙන්නේ 6750 යි. මේ 3035 අඩු කළාම තව තුන්දහස් හත්සිය ගණනයි අපට තිබෙන්නේ. ඒ තුන් දහස් හත්සිය ගණන තියාගෙන කොහොමද මේ පළාත් සභාව ඉදිරියට ගෙනි යන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ ඇති.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගෙනියන්න පුළුවන්. මෙහෙමයි. නමුත් රජයේ මුදල් ලැබෙනතුරු මේ මුදල්වලින් තමයි හැමදාම පවත්වාගෙන ගියේ. රජයේ මුදල් ලැබුණේ නැත්නම් අපට ඉතිරි වෙන්නේ මේ මුදල් ටික. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි කියන්න ඕනෑ. ගියපාර පරිපූරක ඇස්තමේන්තුවක් දැම්මා. ඒ පරිපූරක ඇස්තමේන්තුවේ ගියපාර ලැබුණු මුදල්වලින් කොළඹ දිස්ත්‍රික්කයට විතරක් මිලියන 450 ක් වියදම් කළා. ගම්පහ දිස්ත්‍රික්කයට මිලියන 200 යි. ඒ වාගේම කළුතරට මිලියන 117 යි. ඒ වාගේ තමයි බෙදිලා ගියේ. ඒ වාගේම තමයි මෙදාපාරත් බෙදලා තිබෙන්නේ. පැහැදිලිව කියන්න ඕනෑ. මේ තිබෙන මුදල් හැටියට 58% ක් වෙන් කරලා තිබෙන්නේ කොළඹ දිස්ත්‍රික්කයට. 26% ක් වෙන් කරලා තිබෙන්නේ, ගම්පහ දිස්ත්‍රික්කයට. 16% යි වෙන් කරලා තිබෙන්නේ, කළුතර දිස්ත්‍රික්කයට. අධ්‍යාපනය හැටියට සමස්තයක් හැටියට අපට මතකයි ඉස්සර අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉන්න කොට උපදේශක කාරක සභාවේ තීන්දුවක් අරගෙන කලාප 11 ට සිසු අනුපාතය අනුව තමයි මුදල් බෙදුවේ. කලාපෙන් කොට්ඨාශයට බෙදුවේ සිසු අනුපාතය අනුව. එතකොට සිසු අනුපාතය අනුව බෙදපුවාම, තමන්ගේ කොට්ඨාශයේ ඉන්න මන්ත්‍රීවරයා, මහජන නියෝජිතයා එතුමා තමයි දන්නේ පාසල් ටික හදන්න ඕනෑ. ප්‍රමුඛතා ලැයිස්තුව හදන්න ඕනෑ කියලා. එතුමා තමයි ව්‍යුහ කමිටුවට අරගෙන යන්නේ. එතැන සංවර්ධන යෝජනා ටික හදන්නේ. ඒ යෝජනා ටික හදලා තමයි කෙලින්ම අමාත්‍යාංශයට එවන්නේ. අද එහෙම එකක් නැහැ. දැන් සහන් ගරු මන්ත්‍රීතුමාම කිව්වා, මිලියන අටසිය ගණනක් ව්‍යුහ කමිටුවලින් අරගෙන තිබෙනවා. තවත් මිලියන අටසිය ගණනක් අරගෙන තිබෙන්නේ, කිසිම ව්‍යුහ කමිටුවක් නැතිව. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. මේ පළාත් පාලනය සහ අධ්‍යාපනයට වෙන් කරලා තිබෙනවා, මිලියන 2117 ක්. 2117 න් 1228 ක් වෙන් කරලා තිබෙන්නේ, කොළඹට. ඒක තනිකරම අසාධාරණයක්. ගියවර පරිපූරකයෙන් වෙන් කළා වාගේම මේ පරිපූරකයෙනුත් අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙන්නේ කොළඹ දිස්ත්‍රික්කයට කියලා කියනවා. මොකද, අපි හොඳාකාරවම දන්නවා මේ ඉදිරියේ එන මැතිවරණය එන්නේ කොට්ඨාශ ක්‍රමයට. කොට්ඨාශ ක්‍රමයට එන කොට මේකට අවශ්‍ය කරන මුදල් ටික කොට්ඨාශයට දා ගන්න වැඩ පිළිවෙළ තමයි හදලා තිබෙන්නේ. ගියවර පළාත් පාලනයේ ඉදිරිපත් වුණ අයට දිනාගන්න බැරි වුණාම ලබන පාර එන මැතිවරණයට ඒ මැතිවරණය දිනාගන්න පසුබිම හදාගෙන යනවා. සමහර අය ඉල්ලන්න බැහැයි කියලා ගෙදර යන කොට ගෙදර යන්න ඕනෑ පසුබිම හදාගෙන තිබෙනවා.

ඒ නිසා ගරු සභාපතිතුමනි ඉල්ලීමක් කරනවා. මේ පරිපූරකය සම්පූර්ණයෙන්ම මෙතැනින් ඉවත් කරන්න ඕනෑ. ඉවත් කරලා පරිපූරකයක් හදනවා නම් සියලු මන්ත්‍රීවරු ඒකරාශි කරගෙන, සියලු කලාප ඒකරාශී කරගෙන, සියලු කොට්ඨාශ ඒකරාශී කරගෙන මහජන නියෝජිතයන් හැටියට අපි ඉන්නේ මෙතැන පරිපූරකයට අත උස්සන්න විතරක් නොවෙයි. තමුනගේ ප්‍රදේශයට, තමුන්ගේ ප්‍රදේශයේ යම්කිසි ව්‍යාපාතියක් කරනවා නම් ඒ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දැනුවත් කරලා මහජන නියෝජිතයාගෙන් යන්න ඕනෑ. මම උදාහරණයක් කියන්නම්. මෙතැන ශිරන්ත මන්ත්‍රීතුමා, ශ්‍රීනාත් මන්ත්‍රීතුමා සිටියා. අපේ කොට්ඨාශයේ කොට්ඨාශ කාර්යාලය තිබෙන්නේ පාසලක පන්ති කාමරයක. මේ පළාත් සභාවට මම ඇවිල්ලා අවුරුදු 14 ක්. 14 ම කොට්ඨාශ කාර්යාලයක් හදන්න කියලා ඉල්ලනවා. කොට්ඨාශ කාර්යාලයකට මුදල් ටික අද වනතුරු වෙන් කරලා නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාතෘ සායනයක් තිබෙනවා ජයශ්‍රීගම. රාගම. කඩා වැටිලා තිබෙන්නේ. අවුරුදු පහක් තිස්සේ ඉල්ලනවා, මාතෘ සායනය

හදන්න කියලා. මේ කිසිම එහෙකට මුදල් වෙන් කරලා නැහැ. මෙතැන වැඩිපුර මුදල් වෙන් කරලා තිබෙන්නේ තමුන් තෝරා ගත්ත ව්‍යාපෘති සහ උපකරණ ලබා දීමට. ඒ නිසා අනිවාර්යයෙන්ම මේ පරිපූරක ඇස්තමේන්තුව නවත්තලා, නැවත මේ පරිපූරක ඇස්තමේන්තුව හදනවා නම් හරි ක්‍රමයට හදලා ඉදිරිපත් කරන්නය කියන එක ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි,-

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. මෙතුමා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ පරිපූරකය එන්නේ අයවැයෙන් පස්සේ. දැන් අපි කණ්ඩායමක් හැටියට බැලුවොත් එහෙම ඒ අයවැයට විරුද්ධව ඡන්දය දීපු අය. එතකොට ඒ අයවැයේ තිබුණු මුදල්වලට අමතරව රුපියල් මිලියන 3035 ක් තමයි මේ ආපසු ගන්නේ. සංවර්ධන කටයුතු සිදු කිරීම වෙනුවෙන්. එතකොට මේ මුදල් ආයෝජනය කරපු මුදලක්. එතකොට මේ මුදල් ආපසු ගැනීම නිසා මම විශ්වාස කරන විධියට පළාත් සභාවට අහිමි වන වාර්ෂික ආදායම රුපියල් මිලියන 300 ක්. නමුත් ගරු සභාපතිතුමා අපි කරන්න ඕනෑ පළාත් සභාව හැටියට මුදල් පොළී කරන කියන එක නොවෙයි. අපි පළාත් සභාව හැටියට කටයුතු කරන්න ඕනෑ, ප්‍රදේශයේ ජනතාවගේ අධ්‍යාපනය වෙන්න පුළුවන්. සෞඛ්‍ය පැත්ත වෙන්න පුළුවන්. ඒ සංවර්ධනීය කාර්යයන් සඳහා මුදල් යෙදවීමට තමයි අපි මූලිකව කටයුතු කරන්න ඕනෑ. නමුත් මිලියන 300 ක් අහිමි වීමම කියන එක සමහරක් වෙලාවට අපට හිතෙනවා එක පැත්තකින් ආදායම් අවම වූ තත්ත්වයක් යටතේ ඒ 300 වුණත් අපට අහිමි වීම පාඩුවක් තමයි. නමුත් ඒ පාඩුව වුණත් අපි ඒක දරාගෙන හරි සංවර්ධන කටයුතු කරන්න ඕනෑ. දැන් අපි දන්නවා මේකේ විශාල ප්‍රමාණයක් තිබෙනවා පාසල්වල ගොඩනැගිලිවල ඉතිරි වැඩ නිම කිරීම සඳහා කියලා. අපිත් දන්න කාරණයක් තමයි අපි කොහේ හරි පළාත් සභා පාසලකට ගියොත් වැඩිපුර තිබෙන්නේ නටඹුන්. නටඹුන් වුණු ගොඩනැගිලි තිබෙන්නේ. කවුරු හරි හදන්න අරගෙන, කොයි මොහොතේ හරි හදන්න අරගෙන නමුත් වැඩ නිම නොකරපු නටඹුන් ලෙස පවතින ගොඩනැගිලි තිබෙනවා. ඒවා දැක්කාම ඇත්තටම අපටත් බඩ පපුව දාලා යනවා. ඒ හදපු එකේ වටිනාකමකුත් නැහැ. ඒ මුදලුත් ඇත්තටම අපේ ආර්ථිකයට අහිමි වුණු මුදල් හැටියට තමයි ඒවා තිබෙන්නේ. ඒකෙන් ඵල ප්‍රයෝජනයක් නැහැයි කියලා කියන්නේ. ඒක නිසා මේක ඇත්තටම අපට නම් ප්‍රශ්නයක් නැහැ. මේ බෙදුණු ආකාරය, දිස්ත්‍රික්කයට කොපමණද කියන ඒක අපට ගැටලුවක් නැහැ. හරියට බෙදනවා නම් මේක බෙදන්න ඕනෑ නටඹුන්වල ප්‍රතිශතයට බෙදන්න ඕනෑ. එහෙම බැලුවොත් දිස්ත්‍රික්ක අනුව නොවෙයි මේක බෙදන්න ඕනෑ. ඇත්තටම අපි මේකේ උත්තරය සොයන්නේ ඒ වැඩ නිම කරගන්න බැරි වුණු ඒ ගොඩනැගිලි සංවර්ධනය කිරීම නම් අපි ඇත්තෙන්ම කරන්න ඕනෑ එවැනි තත්ත්වයන් තිබෙන තැන්වලට තමයි මේ මුදල් යොදවන්න ඕනෑ. ඒ වාගේම තමයි ඊළඟ කාරණය. මේ මිලියන 3335 ක් ගන්නේ. එහෙමනම් ඉතුරු ටිකටත් මේ මුදල් ගන්න පුළුවන් තැනකින් ගන්න ඕනෑ, අපි කියන්නේ ඒකයි. ඉතුරු ටිකත් හදන්න ඕනෑ. අපි මොකදට මේ මිලියන 3035 ට සීමා වෙන්නේ. ඒකයි අපි කියන්නේ. එහෙමනම් ඒ ඉතුරු ටිකත් ගන්න. ඒ ඉතුරු ගණනත් අරගෙන ඒ මන්ත්‍රීවරු කියන ඒ ආකාරයේ සංවර්ධන කටයුතුවලට ඒ මුදල් යොදවන්න. අපි කියන්නේ ඒකයි. ඒ නිසා කරන්න ඕනෑ ඒවායි.

ඒ වාගේම තමයි මේකේ ඊළඟ කාරණය තමයි මේක අතරේ තව අලුතෙන් ආරම්භ කරන දේවල් කිහිපයකුත් මේක ඇතුළේ තිබෙනවා. ඒක නිසා ඇත්තටම දැන් දේශපාලන වශයෙන් ගත්තොත් එහෙම දැන් මෙතැන කියවන දේවල් එක්ක තේරෙනවා මහරගමට මුදල් වැඩි කරගත්තාය කියන්නේ මහ ඇමතිතුමාගේ ප්‍රතිරූපය වැඩි කර ගැනීම සඳහා මේකට යම් කොටසක් මුදල් යොදවා ගන්නවා කියන එකයි. හැබැයි මම හිතන්නේ මහ ඇමතිතුමාගේ මේ තිබෙන ප්‍රමාණයෙන් තව එක අහලක්වත් මහ ඇමතිතුමාට ඉස්සෙන්න බැහැ. අලුතෙන් යමක් කරයි කියලා. මහරගම මම දන්න විධියට පාරවල් ඉතුරු කරලා නැහැ. නමුත් ඒ පාරවල් ඉතුරු කරලා නැති වුණාට මහ ඇමතිතුමාට මේ තිබෙන උසෙන් අහලක්වත් උස්සන්න බැරි

[ ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි ]

වුණා. කොහේ උස්සන්නද? ඕතැනින් එහාට ඉස්සෙන්න බැහැ. ඒ නිසා අපි විශ්වාස කරන්නේ මේක -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉස්සෙන විධිය ෆේස් බුක් එකෙන් දැක්කා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඉසුර දේවප්‍රිය ක්‍රීඩාංගණයක් ගැහුවයි කියලා මීත් එහාට එතුමාට යන්න බැහැ. ඕක තමයි එතුමාගේ උපරිමය. යන්න බැහැ. අපි ඒක හොඳාකාරවම දන්නවා. ඕක තමයි උපරිමය. ඒ නිසා අපට තිබෙන්නේ, ඒක නොවෙයි වැදගත්කම. එතුමාගේ නම දාගන්නවාද අරකද මේකද කියන එක නොවෙයි. ඒක සදාචාරත්මක වශයෙන්, තම තමන්ගේ සදාචාරයේ ප්‍රශ්නයක් තිබෙන්නේ. තමන්ගේ නම දා ගන්නවාද? එහෙම නැත්නම් තමන් මැරුණාට පස්සේ කාට හරි දාන්න ඉතුරු කරනවාද කියන එක වෙනම වැඩක්. ඒක අපට ප්‍රශ්නයක් නැහැ. ඒක එතුමා කැමති නම් එතුමා නම දාගත්තාට කමක් නැහැ. හැබැයි අපි ඉදිරිපත් කරන කාරණය තමයි මේකේ කිසියම් ආකාරයක ප්‍රමුඛතාවයක් ගන්න ඕනෑ. ප්‍රමුඛතාවයක් දෙන්න ඕනෑ. මම අද උදේ එතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. අපි මේ සභා සම්මත කළ යෝජනාව කලාව සංස්කෘතිය පැත්තෙන්නේ කෙරෙන්න ඕනෑ ප්‍රමුඛතාවය දිය යුතු වැඩක්. නමුත් ඒක මේ පරිපූරකයේ නැහැ. නමුත් ඒක නැති වුණාට මට මේකේ තිබෙන්නේ අමනාපයක් නොවෙයි. ඒක නැහැයි කියලා. ඒක මට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලා ඒකට සලකනවා නම් - වැඩිපුර කලාකරුවෝ තමයි පිටිපස්ස හැරිලා බැලුවාට පස්සේ පේන්නේ. නමුත් ඇත්තටම සලකනවා නම් ඒවා සම්බන්ධව සලකන්න ඕනෑ. නමුත් ඒවා සම්බන්ධව සලකලා නැතිව තමුන්නාන්සේලා තමුන්නාන්සේලාගේ මොකක් හරි ක්‍රියා පිළිවෙළකට නම් යන්නේ, ඒක අපට කරන්න දෙයක් නැහැ. අපට නොවෙයි නේ බලය තිබෙන්නේ. හැබැයි ගරු සභාපතිතුමනි, ඉස්සරහාට ඇත්තටම උවමනාවක් තිබෙනා නම්, මේක සංවර්ධනීය පැත්තෙන් මේ මුදල් යොදවා ගන්න ඇත්තටම කරන්න ඕනෑ, මීට කලින් මේ පරිපූරකය ගේන්න කලින් තමයි අපිව සම්බන්ධ කරගන්න ඕනෑ. මන්ත්‍රීවරුන්ව සම්බන්ධ කරගන්න ඕනෑ. සම්බන්ධ කරගෙන මෙවැනි මුදලක් ගන්නවා. මෙවැනි මුදලක් ගැනීමේදී අපේ අරමුණ මේකයි. ඒ නිසා දේශපාලන බේදයක් නැහැ. මේ සම්බන්ධව ප්‍රමුඛතාවය අරන් කටයුතු කරන්න, කාටත් එකඟ වෙන්න පුළුවන් සාකච්ඡාවක් කර ගන්න ඕනෑ. නමුත් ඒ සාකච්ඡාව කර ගන්නේ නැතිව තමයි පරිපූරකය අරගෙන එන්නේ. ඒක නිසා තමයි මේ ගැටලුව මෙතැන මතු වෙලා තිබෙන්නේ. ඒ නිසා ඇත්තටම වෙන්න ඕනෑ පරිපූරක ගේන්න ඉස්සෙල්ලා අපිව සම්බන්ධ කරගන්න ඕනෑ. නමුත් බැරි වෙලාවක්වත් මේ තිබෙන පාසල්වල තිබෙන මේ ගොඩනැගිලි ටික හදන්න හරි අනුමත නොකළොත් අපි දන්නවා ඊට පස්සේ ඒක අරගෙන යන්නේ අර පාසල්වලට දෙමව්පියන්ට දරුවන්ට අපි මේ ගොඩනැගිලි ටික හදන්න හැදුවා. හැබැයි දුන්නේ නැහැ පළාත් සභාවේ අහවල්ලු. අහවල්ලු කියලා. ඕක තමයි අන්තිමේදී කියන්නේ. අන්න අහවල්ලු විරුද්ධ වුණා. ඒ නිසා මේ ගොඩනැගිලි හදාගන්න බැරි වුණා. ඒ නිසා පෙරළා ආපසු ඒ චෝදනාව එන්නෙත් අපටමයි. ඒ නිසා මම කියන්නේ, මේක අපේ යෝජනාව නොවෙයි. හරි නම් තමුන්නාන්සේලාම එකතු වෙලා සාකච්ඡා කරලා ගේන්න ඕනෑ එක එකක්, මේ යෝජනාව. ඉස්සෙල්ලාම සභාවට ගේන්න ඉස්සෙල්ලා අඩු ගණනේ තමුන්නාන්සේලාගේ පක්ෂයේවත් එකඟතාවයක් ඇති කරගන්න ඕනෑ. මේ ආණ්ඩුව කරන කට්ටිය ඇතුළේවත්. ඒ එකඟතාවයක් නැතිව තමයි මේ පරිපූරකය අරන් ඇවිල්ලා තිබෙන්නේ. එක නිසා එහෙම තත්ත්වයක් ඇතුළේ කොහොමද අපිව සම්බන්ධ කර ගන්නේ. ඉතින් ඒක නිසා අපි කියන්නේ මේ පාසල්වල තිබෙන මේ නටඹුන් ටික වෙනස් කරලා, මේ ගොඩනැගිලි සම්පූර්ණ කරලා දරුවන්ට ලබා දීම පැත්තෙන් මේ පරිපූරකය යොදවා ගන්න. ඒ නිසා මේකේ සංශෝධනයන්වලට තිබෙනවා නම්, මම කියන්නේ අත්‍යවශ්‍ය සංශෝධනයන්වලට ඉඩ දීලා මේ පරිපූරකය සම්මත කර ගැනීම පැත්තෙන් අපේ එකඟතාවය අපි පළ කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, -

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

ගරු සභාපතිතුමනි, -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, අපේ ගරු මහ ඇමතිතුමා තිස් පස් මිලියන පනස් පන්දහසක් දාපු පරිපූරකයක් දැන් මේ ඇවිල්ලා කථා කරනවා. දැන් මේ බලන්න. මේ පරිපූරකය ගන්න අපේ ඩිපොසිට් එකේ තිබෙන රිපෝ ගිණුමේ ඉස්සෙල්ලාම කොපමණද තිබෙන්නේ කියලා මේකේ දාලා තිබෙනවාද? ඉස්සෙල්ලා මේ සභාව දැන ගන්න ඕනෑ අපේ ඩිපොසිට් එකේ තිබෙන මුදල කීයද කියලා. එතකොට මේ තිබෙන මුදලෙන් තමයි මෙපමණ ගන්නවා කියන්න ඕනෑ. දැන් මේ මුදල් කොහොමද ඩිපොසිට් කරලා තිබෙන්නේ. පළාත් පාලන ආයතනවලින් ලැබෙන මුද්දර ගාස්තුද? එහෙම නැත්නම් මේකට කොයි කොයි ආකාරයේ Tax වර්ගවලින්ද මේකට ආවේ. මොන මොන බදුවලින්ද මේක එකතු කළේ. කියලා මේක ඉස්සෙල්ලා අපව දැනුවත් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් මේ මුදල් අපි ගත්තාම අද පිහිටුවන පළාත් පාලන ආයතනවලට දෙන්න තිබෙන මුද්දර ගාස්තු නම් දෙන්න බැහැ. ඊට පස්සේ ගමේ මන්ත්‍රීවරයා අපව කනවා. ගමේ මන්ත්‍රීවරයාට වැඩ කරන්න සල්ලි නැහැ. අපි කැබිනට් එකේ ඉන්න කාලයේ මම, අපේ ජගත් අංගගේ මැතිතුමා, අපේ මහ ඇමති ප්‍රසන්න රණතුංග මැතිතුමා අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ ඩිපොසිට්වල ආපු පොලී සල්ලි -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ කාලයේ සණසේ දැම්මේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ මුද්දර ගාස්තු සල්ලි අරගෙන ඩිපොසිට් එකක් කරලා හදිසියට මේ පළාත් සභාවේ සේවක සේවිකාවන්ට ගංවතුරක් ආවාම, නියගයක් ආවාම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා මට සමාවෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති මූලාසනයේ අසුන් ගන්නවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වන්න. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියාගෙන ආවේ මේ පරිපූරකය දාන්න ඉස්සෙල්ලා මේකට ඇතුල් කරන්න ඕනෑ මේ ගිණුමේ කොපමණ මුදල් තිබෙනවාද? මේ ගිණුමේ තිබෙන ප්‍රමාණය මේ සභාවට දැන ගන්න ඕනෑ. මේකට ජනතා විමුක්ති පෙරමුණේ අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේක අපට වාර්ෂිකව එන ආදායම. එතකොට මේ ආදායම අපි අරගෙන වියදම් කරලා මේක නැතිහංගස්ථාන කරලා මේ යන යකා කොරහ බිඳගෙන යන්නේ කියලා ගියොත් අපට මොකද වෙන්නේ? තව සභාවක් ඉදිරියට එනවා.

හෙට පාර්ලිමේන්තුවට අලුත් පනත දානවා. පළාත් සභා ක්‍රමය. එතකොට කොට්ඨාශ ක්‍රමයට වෙනත් ක්‍රමයක් එන්නේ. එතකොට මේ කොට්ඨාශ ක්‍රමයට එන ක්‍රමය පළාත් පාලන ආයතනවලට දෙන්න තිබෙන මුද්දර ගාස්තු මේ දෙකටම අපි හිර වෙනවා මේ ක්‍රමය යටතේ. එහෙම නම් අපි වැඩ කරන්න ඕනෑ අපි ගන්න ඕනෑ කොට්ඨාශයෙන් කොට්ඨාශයට අපේ මන්ත්‍රීවරු කිව්වා වාගේ මොකක්ද සත්‍යතාවය? සත්‍යතාවයක් අරගෙන, ඒකට දෙන්න ඕනෑ ප්‍රමුඛතාවය මොකක්ද? පාසලක් හදනවා නම් ළමයින් කොපමණ ඉන්නවාද? ඒ ළමයි ප්‍රමාණය කොහොමද ඇතුල් වෙන්නේ? කොහොමද වැඩි වෙන්නේ? කියලා තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් මේ මුදල් ටික දීලා මේකට මුදල් ටෙන්ඩර් කරන්නේ කොහෙන්ද? පළාත් ඉංජිනේරු කාර්යාංශයට. ඉස්සර මේවා දුන්නේ කලාප කාර්යාලවලට. කලාප කාර්යාල කිසි දෙයක් මේවා දන්නේ නැහැ. එතකොට කලාප කාර්යාලවලින් රිපෝට් එකක් අරගෙන. එතකොට මේ අධ්‍යාපනයයි, මේ සෞඛ්‍යයයි, මහ මාර්ගයි විතරද පළාත් සභාවේ තිබෙන්නේ? තව අනෙක් විෂයයන් කොපමණ තිබෙනවාද? සමාජයේ එදිනෙදා මිනිස්සුන්ට අවශ්‍ය විෂයයන්. කෝ ඒවාට මේකේ මුදල් වෙන් කරලා. මේ නිසා මේ පරිපූරකය සම්පූර්ණයෙන් අහෝසි කරලා මේ මන්ත්‍රීවරු 104 ත් එක්කම කථා කරලා නව පරිපූරකයක් ගේන්න කටයුතු කරන්න මේ මුදල් ආයෝජනය කළොත්

අපට පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ගෙන් ගුටි කන්න තමයි වෙන්නේ. ගමට යන කොට. ඒ නිසා මේක අපි ඔබතුමා මගින් ගරු මහ ඇමතිතුමාට යෝජනා කරන්නේ. මේ මුදල් එහෙම වියදම් කරන්න බැහැ. මේක නීත්‍යානුකූලව කරන්න ඕනෑ. එහෙම නැත්නම් ගරු මහ ඇමතිතුමාටත් වෙන්නේ පළාත් සභාවේ මුදල් අවභාවිතාව යටතේ ජංපරය අදින්න තමයි වෙන්නේ. ඒ නිසා ඒක මතක් කරමින් කාලය ලබා දීම සම්බන්ධයෙන් බොහොම ස්තූතියි.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා තිබෙන එක ඇත්ත වශයෙන්ම වඩාත් සන්තෝෂ වෙනවා. ඒකේදී අපි දකින්නේ ගරු මහ ඇමැතිතුමාගේ ඉදිරි වැඩ පිළිවෙළට අවශ්‍යතාවය ඉටු කිරීම පිළිබඳවයි. නමුත් සමහර කලාපවල තමන්ගේ පාසලේ ආදි ශිෂ්‍ය සංගම් හරහා මුදල් යොදවලා ඉතුරු ගොඩනැගිලිවලට මුදල් අවශ්‍ය වෙලා තිබෙනවා. නමුත් ඒ වාගේම පාසල්වලට නම් කරලා නැහැ. ඒක ගම්පහ කැලණි කලාපයේ අල් අෂ්රොෆ්, අල් මහුමුද් පාසලේ එයාලගේ මුදල්වලින්ම තමයි කරගෙන තිබෙන්නේ. පෞද්ගලිකව. රජයේ සල්ලි කිසි දෙයක් ලැබිලා නැහැ. නමුත් මෙදා පාර හරි ඒ අල් මහුමුද් විද්‍යාලයේ නම ඇතුළත් කරලා, ඒ වාගේම නව ගොඩනැගිලි අවශ්‍ය වෙලා තිබෙනවා. සමහර පාසල්වලට නව ගොඩනැගිලි අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. ඉතිරි වැඩ කිරීම විතරක් නොවෙයි. නව ගොඩනැගිලි අවශ්‍ය වෙලා තිබෙනවා. කැලණි කලාපවල. අල් මුස්තාෆා පාසලටත්. ඒ වාගේම ගම්පහ කලාපයේ උඩුගොඩ අරෆා මහ විද්‍යාලය. අපේ හිටපු මහ ඇමති ප්‍රසන්න රණතුංග මැතිතුමා මුල් අත්වාරම දැම්මත් අවුරුදු ගණනක ඉඳලා ඒකට ශත පහක්වත් වෙන් වෙලා නැහැ. එම නිසා උඩුගොඩ අරෆා මහ විද්‍යාලයටත්, තව ගම්පහ කලාපයේ කුමාරිමුල්ල - මම දන්නවා අපේ උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමා දන්නවා. කුමාරිමුල්ල එයාලගේ සල්ලිවලින් තමයි මේ ගොඩනැගිලි ඉදි කරලා තිබෙන්නේ. නමුත් කලාප කාර්යාලවලින් ඒවා නම් කරලා නැහැ. නමුත් මේකට අවධානය යොමු කරන්න. අනිවාර්යෙන්ම ඒකට මිලියන 10 ක් වත් ලබා දෙන්න ඕනෑ. ඒ වාගේ අඩුපාඩු සිද්ධ වෙලා තිබෙනවා. මේක නිවැරැදි කරලා අපේ බස්නාහිර පළාතේ තිබෙන පාසල්වල, ඒ කියන්නේ දිස්ත්‍රික්ක තුනක තිබෙන පාසල්වල අඩුපාඩු නව ගොඩනැගිලි - මේකේදී අපි බලාපොරොත්තු වන්නේ ඉතුරු වුණු ගොඩනැගිලි කිහිපයක් තිබෙන නිසා ඒ ගැන අවධානය යොමු කරලා මහ ඇමතිතුමාත්, අධ්‍යාපන ඇමතිතුමාත් මේ ගැන අවධානය යොමු කරලා, ඒකට නිසි ලෙස විසඳුමක් ලබා දෙන්නය කියලා මම ඉල්ලා සිටිනවා. ස්තූතියි.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

ගරු සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තූතියි. ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට අවස්ථාව.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු සභාපතිතුමනි,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඊළඟට ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මම මේ කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ අපේ මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු පරිපූරක ඇස්තමේන්තුව ගැන නොයෙකුත් නොයෙකුත් මත ප්‍රකාශ කෙරුවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු මහ ඇමතිතුමා සභාවට පරිපූරකයක් ඉදිරිපත් කරන්නේ, මේ සල්ලි ගරු මහ ඇමතිතුමාගේ සාක්කුවේ දාගන්න නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර අයගේ එහෙම මතයක් හිත්වල තිබෙනවා. විෂයය

භාර ඇමතිවරුන්ට මේවා ගියාම - මොකද ඒ කාලයේ වුණු දේවල් තවමත් වෙනවා කියලා තමයි සමහර අය හිතන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම පරිපූරකය දැමීම පිළිබඳව ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මගේ ප්‍රසාදය මම මුලින්ම ප්‍රකාශ කරන්න ඕනෑ. අපි මන්ත්‍රීවරු විධියට මාසයකට සැරයක් අධ්‍යාපන නිලධාරීන් සමග එකතු වෙලා, විෂයය භාර නිලධාරින් සමග එකතු වෙලා ව්‍යූහ කමිටුවක් කියලා කමිටුවක් පවත්නවා. ඒ කමිටුවේදී ගත්ත තීන්දු තීරණ තමයි මේ පොතේ බොහොමයක් තිබෙන්නේ. ඒ නිසා මේවා ව්‍යූහ කමිටුවලට සහභාගිවන අය දන්නවා. ව්‍යූහ කමිටුවලට සහභාගි වන අය ඉන්නවා නම් ඒ අය දන්නවා මේ අපි යෝජනා කරන ඒවායෙන් 100% ක් නොවෙයි. 50% ක් හරි මේ ලැයිස්තුවේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පරිපූරකය දැම්මාට මේ පරිපූරකයේ යම් යම් අඩුපාඩුකම් තිබෙනවා. මේ මන්ත්‍රීවරු කියන දේ ඇත්ත. නමුත් අපි පරිපූරකයක් දැම්මේ ළමයින්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කරන්න. ගොඩක් වියදම් කරන්නේ, භාගෙට හදපු බිල්ඩින් අලුත් කරන්න. සම්පූර්ණ කරන්න. එහෙම නැත්නම් ඩෙස් පුටු ටික අරන් දෙන්න. ඒ නිසා මේකට විරුද්ධව කථා කරලා මේකත් දේශපාලන න්‍යාය පත්‍රයට හරවා ගන්න හදන්නේ ඇයි කියන එක තමයි මගේ ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මිලියන 3035 ක මුදල ෆික්ස් ඩිපොසිට් එකේ තිබෙනවා, මිලියන 6000 ක්. ඕවා තියාගෙන කන්නද? මහජනතාවගේ බදු මුදල්. ඕවා එක එක තැන්වල තැන්පත් කරලා තියා ගන්න හොඳ නැහැ. ඕවා තැන්පත් කරලා තිබුණාම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අහන්න. ඕවා තැන්පත් කරලා තියලා හදන්නේ ඉදිරියට ඇවිල්ලා ඕවා කාලා නාස්ති කරලා දාන්න. ඒ නිසා අපි නීත්‍යානුකූලව ක්‍රමානුකූලව මේවා වියදම් කරන්න ඕනෑ. මේවා මිනිස්සුන්ගේ බදු මුදල්. මේවා කවුරුත් හම්බ කරපු දේවල් නොවෙයි. කරුණාකරලා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මන්ත්‍රීවරුන් වශයෙන් ඉන්න කාලසීමාව තුළ අපට කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන්න මුදල් ලබා දෙන්න. අපි ගරු මහ ඇමතිතුමාගෙන්, ගරු ඇමතිතුමන්ලාගෙන් ඉල්ලන්නේ ඒකයි. අපට මුදල් ලබා දෙන්න. අපි ඇවිල්ලා ඉන්නේ මේක රත් කරලා, බොරුවට කෑ ගහලා, සමාජෙට කෑ ගහලා මේ හැන්සාඩ් පුරවන්න නොවෙයි. අපි ඇවිල්ලා තිබෙන්නේ වැඩ කරන්න. අපි ඇවිල්ලා තිබෙන්නේ දුප්පත් ළමයින්ගේ ඉගෙනීම ශක්තිමත් කරන්න. අපේ ඉස්පිරිතාලේ හදන්න. අපි ඇවිල්ලා ඉන්නේ ඒකටයි. අපි මෙතැන ඇවිල්ලා තිබෙන්නේ බොරුවට කයිවාරු ගහලා, බොරුවට කෑ ගහලා, මහ ඇමති හීන මවාගෙන, ඇමති හීන මවාගෙන මෙතැන කෑ ගහන්න නොවෙයි. කරුණාකරලා මේ පරිපූරකය නැවතත් ප්‍රතිසංස්කරණය කරලා, අපත් එක්ක එකතු වෙලා කථා කරලා මේක පුළුවන් තරම් ඉක්මණට ඉදිරිපත් කරලා මෙය ක්‍රියාත්මක කරන්නය කියලා තමයි මම ඉල්ලන්නේ. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙතුමා කලින් නැඟිට්ටා. එතුමාට දීලා දෙන්නම්. ඊළඟට ඔබතුමාට දෙන්නම්.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතැන දී අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමා පත්වීම පිළිබඳවත්, අමාත්‍ය මණ්ඩලය පත්වීම පිළිබඳවත් කථා කළා. ඒ වාගේම යහපාලනයක් පිළිබඳව කථා කළා. මොකද, අපේ ඉසුර දේවප්‍රිය ගරු මහ ඇමතිතුමා මම හිතන්නේ පළාත් සභාවේ අවුරුදු ගණනාවක් සිට අපත් සමග කටයුතු කරන, අපේ මිත්‍රයෙක්. මෙතැදී අපි දැක්කා, මේ යහපාලනය තුළ පසුගිය මැතිවරණයේදී විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාව මම කියන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ආසනය පිළිබඳව. මේ කොට්ඨාශය තුළ විශාල මුදල් ප්‍රමාණයක් පළාත් සභාවෙන් මාර්ග හදන්න ඒ වාගේම ඒ දේශපාලන වැඩ පිළිවෙළ සඳහා ක්‍රියාත්මක කළා. ඒ වාගේම මේ වන කොට මම දැක්කා, මොකද අපි විශේෂයෙන්ම දැන් මෙතැනදී කියැවුණු ව්‍යූහ කමිටුවල ගත්ත තීන්දු තීරණ අනුව මේ ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා කියලා. ඒ වාගේම අපි විදුහල්පතිවරු එක්ක කථා කරන කොට කියනවා,

[ ගරු චන්ද්‍රසෝම සරණලාල් ]

ව්‍යූහ කමිටුවට අපේ යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් ව්‍යූහ කමිටුවේ කාගේ ප්‍රමුඛතාවයක් ද දන්නේ නැහැ. අපේ ඒවා පැත්තකට විසි වෙනවා කියලා. ඒ උඩ මම මේ දිහා බැලුවාම විශේෂයෙන්ම මේ පරිපූරකය වෙන් කර තිබීම පිළිබඳව බලන කොට මම හිතනවා - මෙතැන අත්තනගල්ලේ විශේෂයෙන්ම පළාත් සභා මන්ත්‍රීවරු මමත් සමග තව තුන් දෙනෙක් කටයුතු කරනවා. හතර දෙනයි. අනික් කොට්ඨාශ දිහා බැලුවාම ඉතා අල්ප මුදල් ප්‍රමාණයක් තමයි වෙන් කරලා තිබෙන්නේ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. මේ වෙලාවේදී මේ කුඩම්මාගේ සැලකිල්ල අත්තනගල්ලට කරන්න එපා. විශේෂයෙන්ම මම පෞද්ගලික දන්නවා. මේ යහපාලනය තුළ මමත් මෙතුමා මහ ඇමතිවරයා හැටියට පත් වෙන කොට අපේ චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියට වචනයක් හරි කථා කරපු කෙනෙක්. මොකද, මගේ මිත්‍රයෙක් හැටියට මම කිව්වා, එතුමා හොඳයි. මේ කටයුත්ත ඉතාමත් විනිවිද භාවයකින් යුතුව කරයි කියලා. එතුමාගේ කණ්ඩායමත් සමග. අද බලනකොට එතුමාගේ කණ්ඩායමත් දෙකට බෙදිලා. දැන් මෙතැනදී අපි දැක්ක දෙයක් තමයි, ආණ්ඩු පක්ෂයේ වුණාට ආණ්ඩු පක්ෂයත් සමග එකඟතාවයක්, එකමුතුභාවයක් නැහැ. එහෙම තමයි මේ පරිපූරකය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ආණ්ඩු පක්ෂය තුළින්ම මේ පරිපූරකය පිළිබඳව විවේචන එල්ල වෙනවා. එහෙමනම් මේ වාගේ තත්ත්වයක තුළ මම ඉල්ලීමක් කරනවා.

විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය මේ වෙලාවේදී පැහැදිලිවම ගරු මහ ඇමතිතුමාට මේ යහපාලනය තුළ කරගෙන යන එකඟතාවය මත මහ ඇමතිතුමා ඇතුළු ඇමතිවරු හතර දෙනාට පූර්ව සහයෝගයක් ලබා දීලා තිබෙනවා. ඒ අනුව මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා, ඒ සංශෝධන කිරීමේ හැකියාව තුළ මේ පරිපූරක ඇස්තමේන්තුව අනුමත කරගන්න මමත් කැමැතියි. නැත්නම් එහෙම නැති වුණොත් අපි නියෝජනය කරන දිස්ත්‍රික්කයේ ජනතාවට අසාධාරණයක් සිද්ධ වෙනවා. මේ පිළිබඳව දැඩි අවධානය යොමු කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම යහපාලනයට ඡන්දය දුන්න ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන්, ඒ වාගේම ගරු මහ ඇමතිතුමාගේ පමණක් නොවෙයි. අනික් ගරු අමාත්‍යවරු හතර දෙනාගෙන්ම මම ඉල්ලීම කරනවා. මීට වැඩිය අපි පිළිබඳව අවධානය යොමු කරන්නය කියන ඉල්ලීම කරමින්, මේ සඳහා විශේෂයෙන්ම ඒ කොන්දේසි නොවෙයි. විශේෂයෙන්ම ඒ සංශෝධනයට එකඟව මේ සඳහා සහයෝගය ලබා දෙන්න මම බලාපොරොත්තු වෙනවා කියන එක මේ අවස්ථාවේ පැහැදිලිව ප්‍රකාශ කරනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට දෙමු.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම මේ තුන්වැනි සැරේට නැඟිට්ටේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තෙන්ම කියන්න ඕනෑ. මේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාම පසුගිය අයවැය අවස්ථාවේදී විවිධ සාකච්ඡා තිබෙන කොට මහ ඇමතිතුමාට යෝජනා කෙරුවා, මේ අපේ සංචිතයේ සල්ලි තිබෙනවා. මේවා නිකන් තියන්නේ ඉන්නේ ඇයි? මේවායෙන් වැඩක් කරන්නය කියලා. දැන් මේ බබ්බු වාගේ කථා කළාට අපි සත්‍ය කථා කරන්න ඕනෑ. අපි කාගෙවත් පැත්තක් අරගෙන කථා කරන්නේ නැහැ. මේ අය විසින්ම යෝජනා කෙරුවා. මේ රටේ සල්ලි තිබෙන්නේ ජනතාවගේ සුබ විහරණය කරන්න. ඒ සඳහා මේක යොදා ගන්නේ නැත්තේ ඇයි? කියලා. ඒ අනුව තමයි ඒ යෝජනාව දීලා මේ නිලධාරී මහත්වරු ඉදිරිපත් කරපු සැලසුම් අනුව සහ අපේ යෝජනා අනුව මම හිතන්නේ මේ කටයුත්ත සම්පාදනය කරන්න යෙදුණේ. මට පුද්ගලිකව නම් මොකුත් ලැබිලා නැහැ. දැන් මේ අවුරුද්දේ උදැසනම මොකද මේ පරිපූරකයක් ගේන්නේ කියන ප්‍රශන්ය මමත් ඇහුවා, මේක කමිටුවට ආපු වෙලාවේ. ඇත්තටම වශයෙන්ම මේ මිලියන 5000 ක සංචිතයේ

තිබෙද්දී තමයි යෝජනාව ආවේ. ඒකේ ඒ මුදල් අරගෙන රටට වැඩක් කරන්න ඕනෑ. මේවා බැංකුවල තියන්න නොවෙයි එන්නේ කියන කාරණාව විශේෂයෙන් අපි මේ ගැන අවධානය යොමු කළා. ඒක නැහැයි කියන්න බැහැ. ඊට අමතරව මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. කටාන ප්‍රදේශයේ, මම ඉන්න ප්‍රදේශය ගත්තොත් තවමත් කුණු ටික දාන්න තැනක් නැහැ. අපි අනුන්ගේ වතු ඉල්ලන් කුණු ටික දානවා. එතැනින් යන්න කියද්දී තව තැනකට යනවා. වර්ෂ ගණනාවක් මේ ප්‍රසන්න මහ ඇමතිතුමා සිටියා. එතුමා පරිපූරක ගෙනෙද්දී කවුරුවත් කථා කළේ නැහැ. එතුමා මෙතැනට පරිපූරක ගේන්නේ, කටවල් ලොක් කරලා තමයි. ගෙනැල්ලා Y es කියන්න විනාඩි 05 යි යන්නේ. අපි එතකොට විපක්ෂයේ. අපට මොකුත් කියන්න බැහැ. මේ කට්ටිය පූසෝ වාගේ සද්ද නොකර ඉන්නවා. කැම දෙන අය විතරයි, ඝාවි කියන්නේ. ඒ නිසා එහෙම තත්ත්වයක් තිබුණේ. කැම කන වෙලාවට විතරයි ඝාවි කියන්නේ. අනික් වෙලාවේ කට ලොක් කරලා තිබුණේ. ඒ නිසා මෙහි යම්කිසි බෙදීමේ යම්කිසි අඩුපාඩුවක් තිබෙනවා කියලා අපට පේනවා. නමුත් -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අධ්‍යාපන ඇමතිතුමාට දෙන්නේ මිලියන 4.7 යි. වලල්ලාවිටට.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අඩක් නිම කරපු, භාගෙට හදලා තිබෙන ගොඩනැගිලි හැදුවේ නැත්නම් මහා ධන සම්පත් විනාශයක් සිද්ධ වෙනවා. ඒ නිසා අඩක් නිම කළ වැඩ අනිවාර්යයෙන් ඉවර කරන්න ඕනෑය කියන තැන අපි ඉන්නවා. ඊට අමතරව මේ අත්‍යාවශ්‍ය කටයුතු - දැන් අපේ රෝහල්වල තිබෙන තත්ත්වයන් බැලුවාම ඇත්ත වශයෙන්ම ලේ පරීක්ෂා කරන්න එක කාලයක් තිබුණා, පිටට සල්ලි දෙන්න ඕනෑ. මේ ආණ්ඩුව ආවාට පස්සේ තමයි ඉස්පිරිතාලේ ඇතුළේ මේක නොමිලේ කරගන්න අවස්ථාව දුන්නේ. ඒ නිසා අත්‍යාවශ්‍ය රාජකාරී තිබෙන ඒවගේ - කුණු ටික දානවා කියන්නේ අත්‍යාවශ්‍ය දෙයක්. පාරේ කුණු තැන් තැන්වල තියන්න බැහැ. අද වෙන් කරලා ගත්තත්, කොහොම ගත්තත් දාන්න තැනක් නැත්නම් අද අපට දාන්න තැනක් නැහැ. අපි රජයේ ඉඩම්වල දාන්න යනවා. සීදුවේ දාන්න දෙන්නේ නැහැ. අපට මෙහෙම බරපතළ ප්‍රශ්න තිබෙනවා. ඉතින් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා, මේ සංශෝධනයකට යටත්ව සම්මත කරන්න අපි එකඟයි කියන කාරණාව කියමින් විශේෂයෙන්ම සමහර අය මේ යෝජනා ඉදිරිපත් කළේ, මේ මහ ඇමතිතුමා නැතිව වෙන මහ ඇමති කෙනෙක් සිටියා නම්, ඒගොල්ලන්ට ඕනෑ ඒවා ඔක්කොම කරන් ගෙනත් දාපුවාම සද්ද නැහැ. විපක්ෂය ගැන කථාවකුත් නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරු ගැන කථාවකුත් නැහැ. ලස්සනට කර ගත්තා. ඒ නිසා මේ අවස්ථාවේදී යම්තාක් දුරට හොඳ ප්‍රවණතාවයක් තිබෙනවා කියන එක විශේෂයෙන් සඳහන් කරමින් මේ සංචිතයේ මුදල් ඇත්ත වශයෙන්ම වර්ෂ ගණනාවක සිට තිබෙන දෙයක්. අපි සංචිතය ආරක්ෂා කරගන්න ඕනෑය කියන එකත්, ආර්ථික වශයෙන් අපි මූල්‍ය අර්බුදයට මුහුණ දෙන්නේ නැතිව මේක පරිපරිපාලනය කරගන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. එහෙම නැත්නම් බස්නාහිර පළාත් සභාව බංකොලොත් වුණු ආයතනයක් බවට පත් වෙනවා. නිකන් හරි මුදලක් ගෙවා ගන්න හැකියාවක් තිබුණේ නැත්නම්. ඒ තත්ත්වයට පත් නොවී ඒ මූල්‍ය කළමනාකරණය හරියට කරගන්න ඕනෑය කියන කාරණය මතක් කරමින්, සංශෝධනයට යටත්ව මෙය සම්මත කිරීමට එකඟතාවය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සිරිකමල් ගරු මන්ත්‍රීතුමාට දීලා ඔබතුමාට දීලා, මහේෂ් ගරු මන්ත්‍රීතුමාට දෙන්නම්. මම ඒක ලියා ගත්තා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳව මම හිතන්නේ මේ සභාවේ - මම මේ පළාත් සභාවට පත් වුණේ, 1999. එදායින් පසුව

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

මේ පරිපූරක ඇස්තමේන්තුවක් පිළිබඳව මම හිතන්නේ මේ තරම් සාකච්ඡා වුණු කිසිම අවස්ථාවක් තිබිලා නැහැ. එහෙම අවස්ථාවක් දීලත් නැහැ. ඒ නිසා කල්පනා කරන්න ඕනෑ, ඒ 99 පත් වෙන කොට එක මන්ත්‍රීවරයෙකුට ලක්ෂ 05 යි වෙන් කෙරුවේ මුළු අවුරුද්දේම තමන්ගේ යෝජනාවලට. නමුත් අද ඒක රුපියල් ලක්ෂ 50 දක්වා ව්‍යාප්ත වෙලා තිබෙනවා. ඊටත් අමතරව අමාත්‍යාංශ හරහා විවිධ වැඩ සටහන්වලට මන්ත්‍රීවරුන්ට මුදල් වෙන් වෙනවා. දැන් මෙතැනදී අපි දැක්කා, විශේෂයෙන්ම මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියපු කථාව, මගේ සම්පූර්ණ අනුමැතිය එතුමාට දෙනවා. හේතුව, මේ මුදලන් - එතුමා කථා කෙරුවේ 2015, 2016, 2018 වර්ෂවල මුදල් ඉතුරුවීම සම්බන්ධයෙන්. ඒ ගැන අපි පසුගිය මුදල් ප්‍රකාශනය මේ අවුරුද්දේ සාකච්ඡා කරන වෙලාවේදී දැඩිව ඒ තීන්දු තීරණ ගන්නය කියලා තීරණය කෙරුවා. ඒ මුදල් අපතේ ගියා. ඇත්ත. විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ. නමුත් එහෙම තියනවා කියලා සංචිතයේ අපේ තිබෙන මිලියන 6000 ක වාගේ මුදලක්, මෙපමණ වැඩ කරන්න ප්‍රමාණයක් තිබෙද්දී පරිපූරක ඇස්තමේන්තුවක් මේ අවුරුද්දේ මුල ගේනවා කියන එක පිළිබඳව මම හිතන්නේ සාකච්ඡා කරන්න ඕනෑ දෙයක්. සාමාන්‍යයෙන් පරිපූරක ඇස්තමේන්තුවක් එන්නේ අවුරුද්දේ අවසානයට. එහෙම තමයි. සාමාන්‍යයෙන් පළාත් පාලන ආයතනවලත් පරිපූරක ඇස්තමේන්තුවක් ගේන්නේ එහෙමයි. නමුත් මේ වෙලාවේ මේකේ විශේෂයක් තිබෙනවා.

දැන් සමහර කෙනෙකුට හිතන්න පුළුවන් ලබන අවුරුද්දේ මේ පළාත් සභාවේ ආයු කාලය අවසන් වන නිසා එතකොට මේ තිබෙන සල්ලි ටික ඔක්කොකම වියදම් කරලා ප්‍රධාන ඇමතිතුමා ඇතුළු ඒ අමාත්‍ය මණ්ඩලය හෝ ඉන්න මන්ත්‍රීවරු මේ සියලු මුදල් වියදම් කරලා තමන්ගේ ප්‍රතිරූපය නංවාගන්න වැඩ කරන්න ඕනෑය කියලා. මම මෙතැනදී එක දෙයක් කියන්න ඕනෑ, වත්තල මැතිවරණ කොට්ඨාශයේ තිබෙනවා, ශාන්ත ආනා බාලිකා විද්‍යාලය. මේකේ අවුරුදු එකසිය ගණනක් තිබුණු ගොඩනැගිල්ලක්, කඩා වැටෙන්න ඔන්න මෙන්න තත්ත්වයේ තිබෙද්දී ඊට අවශ්‍ය අනුමැතිය අරගෙන මේ පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ඒ ගොඩනැගිල්ල කඩලා දැම්මා. කඩලා දැම්මේ ගිය අවුරුද්දේ. ඒ ගොඩනැගිල්ල හදන්න සම්පූර්ණ මුදල දෙනවා කියන ප්‍රතිඥාව යටතේ. බොහොම පැහැදිලිව මේ සභාවේ ඒවා ලිඛිතව තිබෙනවා. අද ගිහිල්ලා බලන්න. අද මේ මොහොත වන විටත් තාවකාලික කූඩාරම් යට ඒ ගැහැණු ළමයින් ඉගෙන ගන්නවා. ශාන්ත ආනා විද්‍යාලයේ. ගිය අවුරුද්දේ සත පහක් දීගන්න බැරිව ගියා. එතකොට මෙහෙම මුදලක් මේ සංචිතවල තියාගෙන අපේ ළමයින් කූඩාරම් යට ඉගෙන ගන්න කොට අපි ඒ ජනතාව අතරින් පත් වෙලා ආපු මන්ත්‍රීවරු හැටියට ලැජ්ජා වෙන්න ඕනෑ. මේ සභාවේ මෙපමණ මුදල් ඉතිරියක් තියාගෙන අපට ඒවා වියදම් කරන්න බැරි වීම ගැන. ඒක නිසා මේකේ කාලසීමාව අවුරුද්දේ මුලද මුදල් ඇස්තමේන්තු කරලා ගේන්නේ. එහෙම නැත්නම් අවුරුද්දේ අන්තිමද කියන එක නොවෙයි. දැන් තමයි කාලය. ඡන්දයක් තිබුණත් නැතත් මේ මුදල වියදම් කරන්නම ඕනෑ.

මම දන්නේ නැහැ, මොන පරමාර්ථ තිබෙනවාද කියලා මේකට විරුද්ධ වන අයගේ. සමහරවිට ඊළඟ පළාත් සභාවේ ඒ අය බලයට ආවාම මේ සංචිතයේ තිබෙන මුළු 6000 ම එකතු කරලා අරගෙන වැඩ කරන්න හිතාගෙන ඉන්නවාද කියලා. ඒක නොවෙයි. මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න ඕනෑ. මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මේ මුදල අධ්‍යාපනයට තමයි අද වැඩිපුර දාලා තිබෙන්නේ. ඒ හා සමානවම සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමතිතුමාට අවුරුදු දෙකක් තිස්සේ කිව්වා. වත්තල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හදන්න සල්ලි දෙන්න කියලා. සත පහක් දීගන්න බැරිව ගියා. සත පහක් දෙන්න බැරුව ගියා. මේවා අද කියන්න ඕනෑ. තමුන්නාන්සේ ලැජ්ජා වෙන්න ඕනෑ. තමුන්නාන්සේයි, මමයි, ජානක මන්ත්‍රීතුමයි ඉල්ලුවා. 2016 ඉල්ලුවා. 2017 ඉල්ලුවා. මේවා කියන්න ඕනෑ. එතකොට සල්ලි තියාගෙන, මේ සල්ලි හංගගෙන - අර අපේ ගමේ භාෂාවෙන් කියනවා වාගේ සල්ලි රෙද්ද අස්සේ ගහගෙන ඉඳලා හරි යන්නේ නැහැ. මේවා එළියට දාන්න ඕනෑ. එළියට දාලා මේ මිනිස්සුන්ගේ ප්‍රයෝජනයට ගන්න ඕනෑ. අපට ඡන්දය දීපු ජනතාවට, මේ බස්නාහිර පළාතේ ජනතාවගේ ප්‍රයෝජනයට ඒ මුදල වියදම් කරන්න ඕනෑ. ඒ මිනිස්සු ගිහිල්ලා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ අව්වට වේලෙනවා. වැස්සට තෙමෙනවා. ඉන්න තැනක් නැතිව. සල්ලි ටික තියාගෙන නිකන් ඉන්නවා. හැම අවුරුද්දේම කියනවා, ලබන අවුරුද්දේ දෙන්නම් කියලා. මම මේ කාරණා දෙකක් ගැන විතරයි කිව්වේ. වත්තල ශාන්ත ආනා විද්‍යාලයයි, වත්තල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ගැනයි. මේ දාලා තිබෙන යෝජනා ගැනත් මම

සැහීමකට පත් වෙන්නේ නැහැ. මේකේ තව යෝජනා තිබෙනවා. ඒක නිසා අපේ යෝජනා ගන්න. මේක හරි සාකච්ඡාවක්, කථිකාවක් වුණේ නැහැ. ඒක නිසා සම්පූර්ණ සහයෝගය අපි දෙනවා. මේ මුදල එළියට ඇදලා මේ තිබෙන සංවර්ධන වැඩ කටයුතුවලට මේ මුදල යොදවන්න කියන කාරුණික ඉල්ලීම මේ අවස්ථාවේදී කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොමත්ම ස්තුතියි. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් වුණු වෙලාවේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව. අපේ සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම මේ පරිපූරක ඇස්තමේන්තුව තමයි මම හිතන්නේ පරිපූරක ඇස්තමේන්තු ඉතිහාසයේ වැඩිම වෙලාවක් සාකච්ඡා කරපු පරිපූරක ඇස්තමේන්තුව. මේකට ප්‍රධාන කාරණාව තමයි ඇත්තටම පරිපූරක ඇස්තමේන්තුව මගින් මේ වර්ෂයේ ක්‍රියාත්මක කරන්න අපේක්ෂා කරන ව්‍යාපෘති ඇතුළත් කරලා පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරපු නිසා තමයි මේ තරම් දීර්ඝ වෙලාවක් මේ සාකච්ඡාව ඇදිලා ගියේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීට කලින් ඉතිහාසයේ කවදාවක්වත් පරිපූරක ඇස්තමේන්තුවලින් කරන්න අපේක්ෂා කරන වැඩ වෙන වෙනම වෙන් කරලා පෙන්නලා පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරලා නැහැ. මේ තමයි පළමුවැනි අවස්ථාව. ඒ නිසා තමයි මන්ත්‍රීවරුන්ට එහෙම සාකච්ඡා කිරීමේ අවස්ථාව ඉඩකඩ ලැබිලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි පසුගිය අයවැය හැම අවස්ථාවකම කියලා තිබෙනවා, අපේ රටේ වඩාම සංවේදී විෂයය අධ්‍යාපනය කියලා. මේ රටේ දෙමව්පියෝ, මේ රටේ පුරවැසියෝ වඩාම උනන්දු වෙන්නේ අධ්‍යාපනය සඳහා තමන්ගේ දරුවන් යොමු කරන්න සහ අධ්‍යාපනයෙන් යම් ප්‍රතිඵල ප්‍රයෝජන ලබා ගන්න. ඒ නිසාම පසුගිය අයවැය වෙලාවේ අපි දන්නවා, අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් වෙලා තිබුණේ ඉතාම සොච්චම් මුදලක්. ඒකට බලපෑ ප්‍රධාන කාරණාව අධ්‍යාපන ඇමතිතුමාගේ හැසිරීම කියන විශ්වාසය තමයි අපට තිබෙන්නේ. අපි දන්නවා, අයවැය තුනක් විතර පසුගිය අවස්ථාවල එද්දී අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය තිබුණේ 60% කටවත් වැඩිය අඩුවෙන්. එතකොට අධ්‍යාපන අමාත්‍යාංශයට මුදල් වෙන් වෙන්නේ නැහැ. නමුත් අපි අයවැය විවාදය යන හැම වෙලාවේදීම කිව්වා, අධ්‍යාපනයට කරන්න තිබෙන ආයෝජනය මදි නිසා අධ්‍යාපනය වෙනුවෙන් විශාල ආයෝජනයක් කරන්න පටන් ගන්න කියලා. විශේෂයෙන්ම භාගෙට හදපු ගොඩනැගිලි ගැන අපි කිව්වා. ඒ නිසා අපේ ගරු ප්‍රධාන ඇමතිතුමා එතුමාගේ පිළිතුරු කථාවේදී කිව්වා. එතකොට අයවැය යෝජනා ඉදිරිපත් කරලා ඉවරයි. එතුමාගේ පිළිතුරු කථාවේදී කිව්වා, මේ සංචිතයේ මුදල් ඇදලා හරි අපි යම් ප්‍රමාණයක් මුදල් වියදම් කරලා මේ භාගෙට ඉදි කිරීම් කරපු ගොඩනැගිලි හදලා දෙන්න කටයුතු කරනවා කියලා.

මම හිතන්නේ මේකේ 90% ක් තිබෙන්නේ, භාගෙට හදාපු අධ්‍යාපනයේ ගොඩනැගිලි ඉදි කරන්න ගත්තු අධ්‍යාපන අරමුදල්. මේ ගොඩනැගිලි අනිවාර්යයෙන්ම හැදිය යුතු වෙනවා. උදාහරණයක් විධියට කිව්වොත් අපේ හෝමාගම අධ්‍යාපන කලාපයේ, සීතාවක අධ්‍යාපන කොට්ඨාශයේ පහත්ගම රෝමානු කතෝලික විද්‍යාලය. ගරු ප්‍රධාන ඇමතිතුමා ඒකට ගියා. ගිය අවුරුද්දට එහා අවුරුද්දේ ලංකාවේ හොඳම ශිෂ්‍යයා ශිෂ්‍යත්ව විභාගයේ බිහි වුණේ, ඒ ඉස්කෝලේ. හැබැයි, ඒ ඉස්කෝලේ පවත්වාගෙන යන්න විධියක් නැහැ. අද කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයේ තමයි පන්ති කාමර පවත්වාගෙන යන්නේ. ඒ නිසා එතුමා පොරොන්දු වුණා, ඒ ගොඩනැගිලි හදලා දෙන්නම් කියලා. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් වුණු මුදලින් ඒ ගොඩනැගිල්ල හදාගන්න පුළුවන්කම තිබුණේ නැහැ. ඒ නිසා ඒ අරමුදල් මේ පරිපූරක ඇස්තමේන්තුව ඇතුළේ දාලා එතුමා මුදල් වෙන් කරලා තිබෙනවා, ගොඩනැගිලි හදන්න. අපේ අධ්‍යාපන කලාපයට ව්‍යාපෘති 19 ක් වෙනුවෙන් - අපේ අධ්‍යාපන කලාපය කියන්නේ හෝමගම සහ අවිස්සාවේල්ල කියන මැතිවරණ බල ප්‍රදේශ දෙකම අයිති වෙන කලාපය. ව්‍යාපෘති 19 ක් වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ජයවර්ධනපුර කලාපය කියලා කියන්නේ, මැතිවරණ කොට්ඨාශ 04 ක් නියෝජනය කරන, ලංකාවේ වැඩිම දරුවන් අධ්‍යාපනය හදාරන පාසල් ටික තිබෙන්නේ මේක ඇතුළේ. මහරගම,

[ ගරු මහේෂ් අල්මේදා ]

කඩුවෙලත්, ඒ වාගේම කෝට්ටේත්, කොළොන්නාවත් කියන මේ මැතිවරණ ආසන 04 ම තිබෙන්නේ ජයවර්ධනපුර කලාපය ඇතුළේ. ඒ කලාපය ඇතුළට විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව මේ මිලියන 3035 ආයෝජනය කරන ආකාරය ගැන පැහැදිලි ලැයිස්තුවකුත් එක්ක මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්න කටයුතු කරලා තිබෙනවා. මේ හරහා පරිපූරක ඇස්තමේන්තුවේ විනිවිද භාවය ආරක්ෂා කරලා තිබෙනවා කියන කාරණය අපි කියන්න ඕනෑ. මීට කලින් කවදාවත් එහෙම විනිවද භාවයක් ආරක්ෂා කරලා තිබුණේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ළඟ 2010 පරිපූරක ඇස්තමේන්තුව තිබෙනවා. 2010 පරිපූරක ඇස්තමේන්තු 03 ක් ඉදිරිපත් කළා. ඒ පළමුවැනි පරිපූරක ඇස්තමේන්තුව දැම්මේ 2010.04.20 වැනිදා. මේ පරිපූරක ඇස්තමේන්තුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට මිලියන 836 ක් වෙන් කරලා ප්‍රධාන ලේකම්තුමාගේ වැය ශීර්ෂයට මිලියන 1492 ක් හංගලා තිබුණා. අපි දන්නේ නැහැ, මේ මුදල් මොනවටද වියදම් කළේ කියලා. එහෙම හංගලා තමයි පරිපූරක ඇස්තමේන්තුව පාවිච්චි කළේ. ඒ පරිපූරක ඇස්තමේන්තුව 2010.04.20 වැනිදා ඉදිරිපත් කළේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2011 –

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එතකොට කථා කරන්න එපැයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එහෙම කථා කරන්න අවස්ථාවක් දුන්නේ නැහැ. එහෙම කථා කරන්න අවස්ථාවක් තිබුණේ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ නියම සර්පයෝ. දැන් තමයි කියන්නේ. පරිස්සම් වෙන්න ඕනෑ. මෙන්න නියම සර්පයා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2011

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නියම පාවා දීම.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මෙන්න නියම නයා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

2011.02.22 වැනිදා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තමන්ට විතරක් හම්බ වුණාම හරි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කළේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තමන්ට විතරක් හම්බ වෙනවා නම් හරි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මිලියන 585 ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ තියලා මිලියන 1285 ක් ප්‍රධාන ලේකම්ගේ ගිණුමේ තිබුණේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නියම සමසමාජ ප්‍රතිපත්තිය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා. මයික් off කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කරුණාකරලා කථා කරන්න දෙන්න ගරු මන්ත්‍රීතුමා. ඊට පස්සේ ඔබතුමාගේ කථාවේදී කථා කරන්න. ඔබතුමාගේ කථාව ඊට පස්සේ කරන්න. පිළිතුරු කථාව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කථා කරන්න දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මහේෂ් ගරු මන්ත්‍රීතුමා, මූලාසනයට කථා කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2012 පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළා. ඒකේ මුළු ගණන මිලියන 5792 කයි. ඒ මිලියන 5792 අධ්‍යාපන අමාත්‍යාංශයට මිලියන 1581 ක් වෙන් කර ගත්තා. ඒ වාගේම මේ අයවැයේ අධ්‍යාපනයට වෙන් කරපු මුළු ගණන ඒ කියන්නේ මිලියන 1977 ක් ප්‍රධාන ලේකම්තුමා යටතේ හංගලා තිබුණේ. ප්‍රධාන ලේකම්තුමාගේ වෝට් එකේ තිබුණේ. මේ මිලියන මිලියන 1977 වියදම් කරපු විධිය ගැන පැහැදිලි කිරීමක් තිබුණේ නැහැ. මේ වාගේ ලැයිස්තුවක් එදා ආවේ නැහැ. ඒ නිසා දිගින් දිගට පරිපූරක ඇස්තමේන්තු දාලා තිබෙනවා. අවුරුද්දේ මුලත් දාලා තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගිය අවුරුද්දේ 1529 යි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අවුරුද්දෙ අගත් දාලා තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගිය අවුරුද්දේ ප්‍රධාන ලේකම්ගේ එකේ 1529 යි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අවුරුද්දට තුන් වතාව ගණනේ පරිපූරක ඇස්තමේන්තු දාලා තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගිය අවුරුද්දේ ගණනත් කියන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ පරිපූරක ඇස්තමේන්තු වලදී කවදාවක්වත් අපට ලැයිස්තුවක්, සංවර්ධනය කරන අපේක්ෂා කරන ලැයිස්තුවක් ඉදිරිපත් කරලා තිබුණේ නැහැ. ඒ නිසා මේ පරිපූරක ඇස්තමේන්තුවේ සංවර්ධනය කරන්න බලාපොරොත්තු වන ව්‍යාපෘති සියල්ල මේ සභාවට දැන ගැනීම සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා. මේකේ අපට පැහැදිලි කිරීම් දෙකක් ගරු ප්‍රධාන ඇමතිතුමාගෙන් දැනගන්න තිබෙනවා. ඒ දෙක තමයි, ගරු ප්‍රධාන ඇමතිතුමා මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා සම්මත කර ගන්නේ පරිපූරක ඇස්තමේන්තුව විතරක්ද? එහෙම නැත්නම් මේ ලැයිස්තුවත් මේකේ අනුමත කරනවාද කියන කාරණය ගරු ප්‍රධාන ඇමතිතුමා පැහැදිලි කරලා දුන්නොත් හොඳයි කියන කාරණය මේ වෙලාවේ මතක් කරනවා. ඒ වාගේම තමයි ඒ ලැයිස්තුව ඉදිරිපත් කරන්නේ සංශෝධනවලට යටත්ව ද කියන කාරණයත් ගරු ප්‍රධාන ඇමතිතුමා මේ සභාවට හෙළිදරව් කළොත් - අපි පැහැදිලිව දන්නවා, සමහර කොට්ඨාශවල ඇතුළත් නොවුණු ව්‍යාපෘති තිබෙන්න පුළුවන්. සමහර කොට්ඨාශවලට මුදල් ලැබීම් අඩු ප්‍රමාණයක් තිබෙන්න පුළුවන්. ඒවා සංශෝධනය කරගන්න පුළුවන් විධියට මේ ව්‍යාපෘති සංශෝධනය කිරීමේ පදනම මත මේ පරිපූරක ඇස්තමේන්තුව සම්මත කරනවාද කියන කාරණය ප්‍රධාන ඇමතිතුමා මේ සභාවට ඉදිරිපත් කරනවා නම් ඒක වඩාත් ප්‍රයෝජනවත් කියන කාරණය මතක් කරනවා.

ඒ කෙසේ වුණත් අපි සතුටු වෙනවා. පළාත් සභාව සතු මුදල් අක්‍රීය මුදල් බවට පත් කරන්නේ නැතිව, ඒවා සජීවව

[ ගරු මහේෂ් අල්මේදා ]

පාවිච්චි කරලා, ඒවායේ ප්‍රයෝජනය පළාතේ ජනතාවට ගන්න පුළුවන් විධියට, ඒ මුදල් පාවිච්චි කරන්න හැකි පරිදි පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා තියෙනවා භාගෙට හදපු ගොඩනැගිලිවලට ප්‍රමුඛතාවය දීලා, ඊට අමතරව සෞඛ්‍ය යෝජනා සියල්ල අත්‍යවශ්‍ය යෝජනා විධියට අපි සලකන්නේ. ඒ නිසා ඒ යෝජනා සියල්ල ඉදිරිපත් කරලා, පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීම ගැන සතුටු වෙමින්, මේ පරිපූරක ඇස්තමේන්තුව සම්මත කළ යුතුයි කියන කාරණය කියමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පරිපූරක ඇස්තමේන්තුව මම හිතන විධියට මිලියන 3035 ක මුදල අධ්‍යාපනය ගත්තොත් මම හිතන විධියට අඩක් නිම වුණු ගොඩනැගිලි වශයෙන් එය නිම කරන්නට විශාල මුදල් ප්‍රමාණයක් ලබා දීම සම්බන්ධයෙන් මා ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වන අතර ඒ වාගේම කොළඹ කලාපය තුළ ගත්තාම තවත් වැඩ කොටස් රාශියක් තිබෙනවා. මම හිතන විධියට, මම අයවැය වෙලාවේදී කීප වතාවක්ම අධ්‍යාපනය සම්බන්ධව කථා කරපු මන්ත්‍රීවරයෙක් හැටියට මේ වන තෙක් කිසිම දෙයක් නොවුණු නිසා නැවතත් මේ පරිපූරකය ගෙනෙන අවස්ථාවේදී කථා කරන්නට අවස්ථාවක් ලබා ගන්නවා. ඒ මන්ද, මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ගරු මහ ඇමතිතුමා ඇතුළු සියලුදෙනාටම. මෙම පරිපූරක මුදල මාර්තු මාසයේ ගෙන ඒම සම්බන්ධයෙන්. එහෙමත් නැත්නම් මම හිතන විධියට මෙතෙක් කල් මේ පරිපූරක මුදල සැප්තැම්බර් මාසයේ නැත්නම්, ඔක්තෝබර් මාසයේ තමයි ගේන්නේ. ඒ ගෙනාපුවාම කඩිමුඩියේ කොන්ත්‍රාත් ලබා දීලා දෙසැම්බර් 31 ට ඉස්සෙල්ලා මේවා නිම කරන්නට ඕනෑ. මම හිතන්නේ ඒ වෙන කොට මේ මුදල් ටික සමහරක් වෙලාවට අපට ලැබෙන්නේ නැහැ. ඒ සම්පූර්ණ මුදලම. ඒ කොන්ත්‍රාත්කාරයන් වැඩ ගත්තාට, ඒ කාලය තුළ දී කරලා නිම කරන්නට එයාලටත් වෙලාවක් නැහැ. ඒ නිසා මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා, ගරු මහ ඇමතිතුමාට. මේ වෙලාවේදී මේ පරිපූරක ඇස්තමේන්තුව තුන්වැනි මාසයේම ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. ඒ වාගේම එතුමා හරහා අපට විශාල මුදල් කන්දරාවක් කොළඹ කලාපය තුළ, මුස්ලිම් පාසල් සංවර්ධනය කරන්නට අපට ලැබිලා තිබෙනවා. ඒකත් අපි මේ වෙලාවේදී මතක් කර සිටිනවා. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ කොටහේන රෝමානු කතෝලික විද්‍යාලය 1 – 13 එකම ගොඩනැගිල්ලක් යටතේ තමයි ඒ දරුවෝ අධ්‍යාපනය ලබන්නේ. ඒ නිසා මම කිහිප වතාවක් ඉල්លුවා. ඒ අයට උඩු මහලක් හදලා ඒ දරුවන්ගේ අධ්‍යාපනය කර ගන්නට ඒ අවකාශ ලබා දෙන්නය කියලා. ඒ වාගේම බ්ලූමැන්ඩල් කලෙයි මගල් විදුහල. ඒ විදුහලේ ගොඩනැගිල්ලක් ගත්තා උතුරු කොළඹ කොට්ඨාශ කාර්යාලය පවත්වාගෙන යන්නට. ඒ වෙලාවේදී ඒ විදුහල්පතිතුමා ඇතුළු ඒ සංවර්ධන කමිටුවට, ආදි ශිෂ්‍යයන්ට අපි පොරොන්දුවක් ලබා දුන්නා. ඔබට මේ වෙනුවට දිරාපත් වෙලා තිබෙන ඒ ගොඩනැගිල්ල ඉවත් කරලා, අපි ඔබට තෙමහල් ගොඩනැගිල්ලක් ලබා දෙනවාය කියලා. නමුත් අවුරුදු තුනකට වැඩි කාලයක් වෙනවා. අපට ඒ කලෙයි මගල් විදුහලට ඒ ගොඩනැගිල්ල ලබා දීමට හැකියාව ලැබුණේ නැහැ. නමුත් මේ පරිපූරකයේදී මම දැක්කේ, සියල්ලක්ම අඩක් නිම වූ ගොඩනැගිලි ඉදි කිරීම. අඩක් නිම වූ ගොඩනැගිලි ඉදි කරනවාට වැඩිය, ඒකත් සම්පූර්ණයෙන්ම විය යුතුයි. නමුත් සමහර පාසල්වල මේ දරුවන්ට අධ්‍යාපනය ලබාගෙන යන්න බැරි වෙලා තියෙනවා. ගොඩනැගිලි කඩා ඉවත් කර තිබෙන නිසා. ඒ කලෙයි මගල් විදුහලටත් මම ඉල්ලා සිටිනවා, මේ පරිපූරක ඇස්තමේන්තුවේදී මහ ඇමතිතුමාට ඒකේ ගොඩනැගිල්ලක් ඉදි කර දෙන්නට හැකි පරිදි මේකේ සංශෝධනයක් කරන්නය කියන එක.

ඒ වාගේම කහිරියා මුස්ලිම් විදුහලේ 2009 ඉඳලාම ප්‍රාථමික අංශය ෂෙඩ්වල තමයි තවමත් 1 සිට 5 දක්වා ඒ දරුවෝ අධ්‍යාපනය ලබන්නේ. ගියොත් බලන්න පුළුවන්. අල් හිජ්රා භූමියේ තවමත් දරුවෝ ෂෙඩ්වල අව්වේ වේලී ගෙන, වැස්සේ තෙමී ගෙන ඉතාමත් දුක්බර අන්දමට 1 – 5 දක්වා ප්‍රාථමික අංශයේ දරුවෝ ඉගෙන ගන්නවා. එහෙම නම් මේ ෂෙඩ්වල ඉන්න දරුවන්ට අපි කුමක්ද කරන්නේ කියන එකේ ප්‍රශ්නයක් තිබෙනවා. මේ ඇස්තමේන්තුවේදී පවා අඩක් නිම වූ ගොඩනැගිලිවලට පමණක් නම්, සමහර වෙලාවට මේ දරුවන්ගේ අනාගතය කුමක් වේද? අපි කවදාද මොවුන්ට ගොඩනැගිලි හදලා දෙන්නේ කියන එකේ ප්‍රශ්නයක් අපි තුළ තිබෙනවා. ඒ නිසා මෙය බස්නාහිර පළාත් සභාවට අයත් පාසලක්

හැටියට ෂෙඩ්වල අධ්‍යාපනය ලබන දරුවන්ට විශේෂ අවධානය යොමු කරන්නය කියන එක මම මේ සභාවේ ඉල්ලා සිටිනවා.

ඒ වාගේම හම්සා විදුහලේත් තවත් මෙවැනිම ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා අපි මේවාටත් ඇහුම්කන් දීලා - ඒ වාගේම මේ පාසල්වල තිබෙන්නා වූ සියලුම මේ පරිපූරක ඇස්තමේන්තුවෙන් අඩක් නිම වූ පමණක් නැතිව සංශෝධනය කරලා, නව ඉදි කිරීම්වලටත් අපට ඔබගේ අනුමැතිය ලබා දෙන්න. ඒවා ගිහිල්ලා බලලා, පරීක්ෂණ කරලා බලලා, දිය යුතුද කියලා බලලා ඒ අයටත් එය ලබා දෙන්නය කියන ඉල්ලීම කරමින්, මෙම අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා, නැගිටපු ආකාරයට මම නාම ලේඛනයක් හදලා තිබෙනවා, මෙතැන. මූලාසනයෙන් හදලා තිබෙනවා. ඒ නිසා ඒකට අවස්ථාව ලබා දෙන්න තවත් අදහස් ප්‍රකාශ කරන අය පොඩ්ඩක් දැනුම් දුන්නා නම් මම ඒ අයගේ නම් ටික ලියා ගන්නවා. මීළඟට ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2018 පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳව අපේ මතවාදී විරෝධතාවයක් නොමැති වුණත්, මෙහි සඳහන් වන අති විශාල දැවැන්ත මුදල රුපියල් තුන් බිලියන තිස් පස් මිලියන පනස් පන් දහසක් වූ අති දැවැන්ත මුදල ආයෝජනය කිරීමේදී, පුනරාවර්ථන ආයෝජන පිළිබඳව අපේ ගැටළුවක් නැති වුණත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කලාප මට්ටමින් අධ්‍යාපන අමාත්‍යාංශයත්, ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආයෝජන පිළිබඳවත්, මේ ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතා ලේඛන සකස් කිරීමේදී සිදු වූ විශාල අඩු ලුහුඬුකම් දකින්න ලැබෙනවා. එක් එක් කලාප වශයෙන් හෝ ප්‍රදේශ වශයෙන් මේ මුදල් ආයෝජනය කිරීමේදී ඒ ඒ ප්‍රදේශවල ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය සකස් කිරීමේදී ඇති වී තිබෙන දැවැන්ත ගැටළු නිසාම මේ මුදල ආයෝජනය කිරීමේදී පළාතේ ජනතාවට සාධාරණත්වයක් ඉෂ්ට කිරීමට යම් යම් අවස්ථා අපොහොසත් වෙලා තිබෙනවාය කියන කාරණාව පැහැදිලිව කියන්න අවශ්‍යයි. මේ පරිපූරක ඇස්තමේන්තුවේ සඳහන් වන පුනරාවර්ථන වියදම් සඳහා වූ ආයෝජන, අනිවාර්යයෙන්ම ඒවා ලබා දිය යුතු මුදල් හැටියට සැලකුවත්, මම පෙර කී ආකාරයට මෙම ව්‍යාපෘති ලේඛන සකස් කර එහි ප්‍රමුඛතාවය සටහන් කිරීමේදී සිදු වී ඇති අක්‍රමිකතාවය පිළිබඳව අපේ විශාල කනස්සල්ලක් පවතිනවා. විශේෂයෙන් උදාහරණයක් වශයෙන් ගත්තොත් කළුතර අධ්‍යාපන කලාපයේ ව්‍යුහ කමිටුවේදී මම නිතර පැහැදිලි කිරීමක් කළා. මීට වසර හතකට පමණ කලින් කඩා ඉවත් කළ ශ්‍රී ලංකාවේ පළමු වන බෞද්ධ පාසල පානදුර උපාධ්‍යා විද්‍යාලයේ දරුවන්ගේ ප්‍රධාන ශාලාව පිළිබඳව. ඒ පිළිබඳව කිසිම සඳහනක් මේකේ වෙන්නේ නැහැ. කලාප කාර්යාලයේ ලේඛනයකට ඇතුළත් කරලා තිබුණා. නමුත් මම කිව්වා, මේකේ ආරම්භයක් ඇති වෙන්න ඕනෑ. මේ දරුවන්ට විශාල අසාධාරණයක් සිද්ධ වෙනවා. නගර මධ්‍යයේ පිහිටි මේ පාසලේ මේ ප්‍රධාන ශාලාව ඉවත් කරලා, මෙපමණ කාලයක් ගත වෙනවා. මේකට ආරම්භයක් ඇති වෙන්න ඕනෑ. දැන් මේ පරිපූරක ඇස්තමේන්තුවෙන් අඩක් වැඩ නිම කළ ව්‍යාපෘති සඳහා පමණක් මුදල් ආයෝජනය කරනවා නම්, අපට ඒ පිළිබඳව ගැටළුවක් නැහැ. නමුත් එසේ නොවෙයි. මේ ලේඛනය ඇතුළේ නව ව්‍යාපෘති තිබෙනවා. ඒ නව ව්‍යාපෘති ගොන්නට එවැනි ප්‍රමුඛතාවය දිය යුතු ව්‍යාපෘතියක් ඇතුළත් කරන්න අපොහොසත් වීම පිළිබඳව පමණක් නොවෙයි, සමස්තයක් වශයෙන් බැලුවොත් එහෙම අපට පේනවා. ප්‍රදේශ අනුව මේ මුදල් ආයෝජනය කරලා තිබෙන ආකාරය. ඒ නිසා සමස්තයක් වශයෙන් බස්නාහිර පළාතේ ප්‍රමුඛ ජනතාවට මේ පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය තමන්ගේ අමාත්‍යාංශය හරහා වැය කරන මුදල් ඉතාමත් සර්ව සාධාරණ ආකාරයෙන් බෙදා හදා දීමේ වගකීම සහ යුතුකම එතුමන්ලාට පැවරෙනවා. නමුත් මේ ඇස්තමේන්තු සකස් කිරීමේදී ඒ වගකීමෙන් බැහැර වී තිබෙනවාදෝ කියන සැකය මතු වෙනවා.

ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මගේ ස්තුතිය පළ කරනවා. මේ පරිපූරකය ඉදිරිපත් කිරීමේදී අදාළ ව්‍යාපෘති ලේඛන මේකට අමුණා තිබීම සම්බන්ධයෙන්. ඉස්සර මෙපමණ විනිවිදභාවයකින් යුතුව ඒ කටයුතු කෙරුණේ නැහැ. ඒ කෙසේ වුණත් මෙහිදී අර මතු වෙලා තිබෙන ප්‍රමුඛ කාරණාව, ප්‍රමුඛතාවය දිය යුතු කාරණාව කෙරෙහි නැවත නැවතත් ගරු ඔබතුමා මගින් ගරු ප්‍රධාන

[ ගරු ජගත් අංගගේ ]

අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. මෙහි සංශෝධනවලට යටත් වීමට එතුමා එකඟද කියන කාරණාව පිළිබඳව පැහැදිලි කිරීමක් අපට අවශ්‍ය වෙනවා. මේ පරිපූරකයේ දැනට ව්‍යාපෘති නාම ලේඛන සකස් කර තිබෙනවා. මේ ව්‍යාපෘති නාම ලේඛනයට පමණක් සීමා වෙලා මේ පරිපූරකය ක්‍රියාත්මක වෙනවාද? ගරු මන්ත්‍රීවරුන්ගේ සංශෝධනවලට එතුමා එකඟතාවය පළ කරලා, එකඟතාවයන්ට යටත් පරිපූරක ඇස්තමේන්තුවක් හැටියට මේක මේ ගරු සභාවේ සභා සම්මත කර ගන්නවාද කියන කාරණාව අපට පැහැදිලිව දැන ගන්නට අවශ්‍යයි. එය එසේ වෙනවා නම්, අපි කිව්වා පළාත් සභා සංචිතයේ මුදල් පිළිබඳව. පළාත් සභාවක් වුණාම සංචිතයක් තිබෙන්න ඕනෑ. ඒ සංචිතයේ යම්කිසි ස්ථාවර මුදලක් තිබෙන්නටත් ඕනෑ. මොකද, අපි අනපේක්ෂිත දේවල් මේ පරිසරය තුළ සිද්ධ වෙන්න පුළුවන්. විවිධ අවස්ථාවල. අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ සුළි සුළං. අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ, සුනාමි. අපි කුණාටු බලාපොරොත්තු වෙන්නේ නැහැ. පාරිසරික වශයෙන් හදිසියේ වන වෙනස්වීම්. එවැනි අවස්ථාවකදී තමන්ගේ ප්‍රදේශයේ ජනතාවගේ රැකවරණය සහ ආරක්ෂාව වෙනුවෙන් තමන්ගේ පළාත් සභාවේ සංචිතයේ යම් ප්‍රමාණයක මුදලක් ඉතිරි කර තිබීම මේ මහජන නියෝජිතයෝ 104 දෙනාගේම වගකීමක්. අපි 104 දෙනාම හිතනවා නම්, සංචිතයේ සල්ලි තියෙන්න ඕනෑ නැහැයි කියලා. ඒ පළාත් සභාවේ අනාගතය පිළිබඳව අපේ දැකීමක් නැති ආකාරයෙන් ක්‍රියා කිරීමක්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභාව මතු එන මන්ත්‍රීවරුන් සහ මතු මේ රටේ උපදින්න ඉන්න දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳවත් හිතන්න දැවැන්ත වූ වගකීමක් තිබෙනවා. එසේ වගකීමක් නැති පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු හැටියට ක්‍රියා කිරීමට මා එකඟ නොවන බවද ඉතාමත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ මුදල් යම් ප්‍රමාණයක් අරගෙන රටේ යහපත වෙනුවෙන්, පළාතේ යහපත වෙනුවෙන් ආයෝජනය කිරීමේ විරෝධතාවයක් නොමැති වුණත්, මුඛ්‍ය වූ, මූල්‍ය වූ, වගකිවයුතු කාරණාවලින් බැහැර වීම සුදුස්සක් නොවන බවද ගෞරවයෙන් ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ නිසා මම ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ ඉදිරිපත් කරලා තිබෙන ව්‍යාපෘති ලේඛනයන්ගේ යම් යම් සංශෝධන ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනවාද? නැද්ද? ඒ පිළිබඳව ඔබතුමාගේ මතය අනුව අපි ඒ පරිපූරක සඳහා අපේ කැමැත්ත ප්‍රකාශ කිරීම සිදු විය යුතුය කියලා යෝජනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හය වැනි පළාත් සභාවේදී පරිපූරකයක් පිළිබඳව ඉතිහාසයේ ප්‍රථම වතාවට විවාදයක් කරන්න අවස්ථාව ලැබීම පළාත් සභා පහක හිටපු කෙනෙකු විදියට මා ලද භාග්‍යයක් කොට සලකනවා. ඒ වාගේම හැමදාම පිට පොට ගියපු ගමනක්. හරි පොටට ආවාමත්, ඒ හරි පොටෙනුත් පොට කපා ගෙන යන්නේ නැතිව, වඩාත් එය සාධාරණය කරන්න ජනතා නියෝජිතයින් විදියට මහජන නියෝජිතයින්ගේ අදහස් ඉදිරිපත් කිරීමත්, එක් පැත්තකින් සාධාරණයි කියලත් හිතෙනවා. ඒ වාගේම මේ පරිපූරකයේ තුනෙන් එක් පංගුවක් අධ්‍යාපනයට තමයි ප්‍රතිපාදන වෙන් වෙන්නේ. මේ වාගේ දෙගුණයක මුදලුත් පරිපූරක විදියට මේ සභාවේ සංසරණය වන අවස්ථා නොතිබුණත් නොවෙයි. හැබැයි, ව්‍යාපෘතිත් සමඟ, අමාත්‍යාංශ සමඟ මේ යෝජනා ඉදිරිපත් වුණාමත් එහි අඩු වැඩි බව පිළිබඳව, ප්‍රදේශ ව්‍යාපෘති නිශ්චිතව පෙනීම පිළිබඳව, එහි විනිවිදභාවය නිසාම සිත් රිදෙන තැනුත් නැතිවා නොවෙයි. ඒ නිසා මේ මන්ත්‍රීතුමන්ලාගේ අදහස් එසේ ඉදිරිපත් වීම එක් පැත්තකින් විනිවිදභාවය වැඩි නිසාදෝ කියලත් හිතෙනවා. අර සුවඳ වැඩි වුණාම දූරියන් ගඳයි නේ? සුවඳ වැඩි නිසා තමයි දූරියන් ගඳ. මේ පරිපූරකයත් ඒ වාගේ වෙන්න පුළුවන්. කොහොම නමුත් ස්මාර්ට් පන්ති කාමර පිළිබඳව දිස්ත්‍රික්ක තුනේ ක්‍රියාත්මක කරන්න යන ව්‍යාපෘතිය, විශිෂ්ට ව්‍යාපෘතියක්. ඒ වාගේම එය අත්‍යවශ්‍ය දෙයක්. ඒ වාගේම අපි එක් කරන්න කැමැතියි. අපි ආපන ශාලාවලින් විශාල මුදලක් සෑම පාසලකම, ජනප්‍රිය පාසලකම එක් කරනවා. හැබැයි, ආපන ශාලා කොතෙක් සෞඛ්‍ය සම්පන්නද? කොතෙක් හුරුපුරුදු ඇති කරනවාද කියන එක පිළිබඳව අපි මෙතෙක් මැදිහත් වෙලා නැහැයි කියන එකත් මම ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙතත්, ඔබතුමා මගින් අධ්‍යාපන අමාත්‍යතුමා වෙතත් යොමු කරන්න කැමැතියි. ආපන ශාලා ව්‍යාපෘතියකුත්, ආපන ශාලා හොඳ හුරු පුරුදු සහ සෞඛ්‍ය

සම්පන්න ලෙස එක් කරන්න මේ පරිපූරකය අත තිබ්බොත් එය වඩාත් අගනේය කියන අදහස මා සතු වෙනවා.

ඒ වාගේම කොළඹ දිස්ත්‍රික්කයේ භූමි භාගයෙන් 1/3 පංගුවක් නියෝජනය කරන මැතිවරණ බල ප්‍රදේශයේ මමත් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් නියෝජනය කරනවා. ඒ වාගේම හෝමාගමත් එක්ක එක් වුණොත් කොළඹ දිස්ත්‍රික්කයේ භූමියෙන් අඩකටත් වඩා වැඩියි. හැබැයි, කොළඹ දිස්ත්රික්කයේ හෝමාගම කලාපය, අධ්‍යාපන කලාපයට මේ පරිපූරකයෙන් අත්‍යවශ්‍ය ව්‍යාපෘති, සීතාවක සහ පාදුක්ක කියන කොට්ඨාශ දෙකට ගොඩනැගිලි සම්බන්ධයෙන් ලැබීම පිළිබඳව අපි සතුටු වෙනවා. හැබැයි, ඒ සතුටු වෙනවා වාගේම, මේ හෝමාගම කලාපයේ අපේ ප්‍රදේශයට වෙන් වුණු ප්‍රතිපාදන ප්‍රමාණය මීට වඩා වැඩි කරන්න හැකියාවක් තිබෙනවා නම්, ඒ වැඩි කිරීම සහ වැඩි අවස්ථාවක් -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මිලියන 236 ක් හම්බ වෙලා තිබෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මිලියන 236 ක් හම්බ වෙලා නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැත්තේ මොකද? හෝමාගම කලාපයේ මිලියන 236 යි. එකතු කරලා බලන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මිලියන 67 ක් තමයි සීතාවක සහ පාදුක්ක කියන අධ්‍යාපන කොට්ඨාශ දෙකටම ලැබිලා තිබෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හෝමාගම කලාපයට.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඔබතුමාත් වාගේම මමත් ගණන් දන්නවා. හෝමාගමට මිලියන 94 ක් තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

236 ක්.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

අධ්‍යාපන ව්‍යාපෘති 11 න් අටක් ලැබිලා තිබෙනවා. ඒ වාගේම අත්‍යවශ්‍ය අධ්‍යාපන අවශ්‍යතාවයන් සහිත යෝජනා, අත්‍යවශ්‍ය ඒවා තවත් සීතාවක සහ පාදුක්ක කොට්ඨාශයේ තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපනය ගැන කථා කරද්දී මේ දේ කැමැත්තෙන් හෝ අකමැත්තෙන් කියන්න ඕනෑ. අනෙක් අමාත්‍යාංශ ටික දුවද්දී අධ්‍යාපන අමාත්‍යාංශයේ අර කිච්ච, උපන් ගෙයි ඇදයක් මේ හය වන පළාත් සභාවේ තිබුණාදෝ මන්දා. කොහොම නමුත් එය නිවැරදි කරන්න ප්‍රධාන අමාත්‍යතුමා පසුගිය අයවැයේදී ප්‍රකාශ කළා වාගේ මේ පරිපූරකයක් ගෙනැල්ලා ඒ ඇදය යතු ගාන්න, ඒ ගැටය පලන්න උත්සාහ දැරීම පිළිබඳවත් අපේ ගෞරවය සහ ස්තුතිය අපි පුද කළ යුතු වෙනවා.

ඒ වාගේම සෞඛ්‍ය වැය ශීර්ෂයේත් අත්‍යවශ්‍ය අවශ්‍යතාවයන් රැසක් - එක් පැත්තකින් මූලික රෝහල තිබෙන්නේ, අවිස්සාවේල්ලේ. ඒ වාගේම බෝම්බයට අහු වුණු සාලාව රෝහලේ, ඒ වාගේම පාදුක්ක රෝහල් සහ ළමා මාතෘ සායන ආශ්‍රිතවත් තිබෙනවා. මේ යෝජනාවලටත් අවස්ථාව සලසමින්, මේ අලුත් යෝජනාවලටත් තවත් වැඩි මුදල් ප්‍රමාණයක් කොළඹ දිස්ත්‍රික්කයේ එක් පැත්තකින් අධ්‍යාපනික වශයෙන් නගරයට ගලා ගෙන එන ශිෂ්‍ය සංඛ්‍යාව අවම කරන්න ගමේ පාසල් වැහෙන සංස්කෘතිය වෙනස් කරන්න, ගමේ පාසල් බලවත් කරන්න ශක්තිමත් කරන්න, එහි අත්‍යවශ්‍ය අවශ්‍යතාවයන් ශක්තිමත් කරන්න මුදල් වෙන් කරන්න කොළඹ දිස්ත්‍රික්කය තුළ වැඩිපුරම අවස්ථාව ඇත්තේ හෝමාගම කලාපය වෙනුවෙනුයි කියන එකත්, ඒ හෝමාගම කලාපයෙනුත් ග්‍රාමීය ප්‍රදේශ තිබෙන සීතාවක සහ පාදුක්ක අධ්‍යාපන කොට්ඨාශවලත් කියන එක මතක් කරමින්, මේ අපි කණ්ඩායමක් විධියට, ඒ වාගේම ප්‍රතිපත්තියක් විධියට අපි පක්ෂයක, ඒ වාගේම කණ්ඩායමක ඉඳගෙන අපි දෙබිඩි ප්‍රතිපත්තිවල නොවෙයි ඉන්නේ. අපි ඍජු ලෙස නායකයා සහ කණ්ඩායම සමඟ එකට කටයුතු කරනවාය කියන එකත් මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2018 පරිපූරක ඇස්තමේන්තුව සම්බන්ධව වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මට කථා කරන්න ඕනෑ, මේ පරිපූරකය ගැන. අපි සභා කටයුතු කාරක සභාවේදී, ගියවර නොවෙයි. ඊට එපිට වාරයේදී මේ පරිපූරක ඇස්තමේන්තුව සම්බන්ධව ඉදිරිපත් වුණා. ඒ ඉදිරිපත් වුණු වෙලාවේ අපි පොඩි මතයකට ආවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මතක ඇති. අපි පොඩි මතයකට ආවා. මේක මෙහෙම නොවෙයි. මීට වැඩිය විනිවිද පේන්න ඕනෑය කියලා. මම හිතන්නේ, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා එහෙම ඉන්නවා. විනිවිද පේන්න ඕනෑ විධියට අපට ඉදිරිපත් කරන්නය කියලා. ඊට පස්සේ පසුගිය සභා කටයුතු එකේදී අපට බොහොම ලස්සනට, බොහොම පැහැදිලිව බ්‍රේක් ඩවුන් එකක් සමඟ මේ මිලියන 3055. හෙක්ටර් බෙත්මගේ ගරු සභා නායකතුමා එහෙම දන්නවා. බ්‍රේක් ඩවුන් එකක් සමඟ අපට මේක ඉදිරිපත් වුණා. මේ වෙලාවේ අපි සන්තෝෂ වුණා. මේ විධියට අනුමත කර ගන්නා මුදල්වලට වෙන දේ පැහැදිලිවම තිබීම පිළිබඳව. ඒක ප්‍රශ්නයක් ගැටළුවක් නැහැ. මහ ඇමතිතුමා වැඩිපුර දා ගත්තාද? ළඟ ඉන්න හිතවතුන්ට වැඩිපුර ගියාද? විපක්ෂයේ සංවිධායකතුමාට, විපක්ෂ නායකතුමාට වැඩිපුර ආවාද කියන එක කිසිම ගැටළුවක් නැහැ. මේකේදි අපි සන්තෝෂ වෙනවා, බ්‍රේක් ඩවුන් එකක් මේකේ ඉදිරිපත් කිරීම සම්බන්ධව. ගරු මහ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. හේතුව, මේකේදී කොහොම හරි අපට ඕනෑ, ගමකට, පළාතකට වැඩක් වෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහරු උඩින් පාත් වුණා වාගේ කථා කරනවා. මේක මහ ඇමතිතුමාට වැඩිපුර දා ගෙන කියලා. නැහැ. මේක සාමාන්‍ය පෘතග්ජන ගතිය. එළඹෙන කවුද මහ ඇමති ඕනෑම මහ ඇමති කෙනෙක් තමන්ගේ ප්‍රතිරූපය ගොඩ නගා ගන්න යමක් කරනවා. මෙතැන පොඩි ගැටළුවක් තිබෙනවා. මේක සභා කටයුතු කාරක සභාවට ඉදිරිපත් වන අවස්ථාවේ අපේ බන්දුල මහතාත්, එතුමාගේ කාර්ය මණ්ඩලයත් කිව්වා, අපි පරිපූරකයෙන් මිලියන 3055 අරගෙන පාසල්වල සහ රෝහල්වල මග ඇණ හිටලා තිබෙන වැඩවලට තමයි අපි මේ මුදල් ටික යොමු කරන්නේ කියලා වාගේ වචනයක්. ඒක තමයි අපේ මූලික අභිප්‍රාය කියන එක බන්දුල මැතිතුමා ඒ සම්බන්ධව සඳහනක් කළා. නමුත් අපට මේකේ කියා ගෙන යන කොට බහුතරයක් අපි සන්තෝෂ වෙනවා. ආඩම්බර වෙනවා. මේකේ දාලා තිබෙනවා, අධ්‍යාපනයට අපේ භාගයට නැවතුනු වැඩ කරන්න. හැබැයි, ඒ අතරතුර අලුත් ව්‍යාපෘතිවලටත් මේකේ මුදල් වෙන් වෙලා තිබෙනවා. අපි ඒකත් හොඳට පැහැදිලිව මේකේ දකිනවා. නමුත් අපට ඒ ගැන වැඩිය එළවන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මේ පරිපූරකය ගැන විවිධ විවිධ දේශපාලන මත දරන අයට ඕනෑ ඕනෑ විධියට දකින්න පුළුවන්. මේක විපක්ෂයේ දැන් කණ්ඩායම් කිහිපයක් ඉන්නවා. ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම් කිහිපයක් ඉන්නවා. ඒ කණ්ඩායම්වල උදවියට එක එක විධියට මේක දකින්න පුළුවන්. විපක්ෂයේ අපි ඉන්නවා. අපෙත් මේ කණ්ඩායමේ එක එක විවිධ මත තිබෙන මන්ත්‍රීවරු ඉන්නවා.

නමුත් මේක අපි දකිනවා. මගේ පෞද්ගලික මතය. මම දකිනවා, පසුගිය පරිපූරක ඇස්තමේන්තු කිහිපයකට මමත් සම්බන්ධ වෙලා තිබෙනවා. මේ පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයෙකු වශයෙනුත්. පසුගිය වර්ෂවලත්. මේ වාගේ විනිවිද පේන පරිපූරකයක් ඉදිරිපත් වුණේ නැහැ. මම සන්තෝෂ වුණා. ඇත්තටම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා බොහොම පැහැදිලිව කථා කළා. එතුමා සාමාන්‍යයෙන් එහෙම කථා කරන්නේ නැහැ. මම බැලුවා, ගරු මහ ඇමතිතුමනි, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා බොහොම සාධාරණ වෙලා තිබෙන්නේ මොකද කියලා. ඒක සන්තෝෂයි. අපි හැදෙන කොට වෙනස් වෙන්න ඕනෑ. හොඳ දේ හොඳ විධියට දකින්න ඕනෑ. අපි ආඩම්බර වෙන්න ඕනෑ. මේකේ අඩුපාඩුකම් ඇති. 100% ක්ම මේවා නිවැරදි කරන්න බැහැ. නමුත් මේ පරිපූරකය අපට මේ දීලා තිබෙන වැඩ සටහන අනුව අපේ පළාත්වලටත් අපි සන්තෝෂ වෙන්නේ නැහැ. අපේ පළාත්වල තව පාසල් තිබෙනවා, අතපසු වුණා. නමුත් සමස්තයක් වශයෙන් අපට මේකෙන් උදව්වක් වෙලා තිබෙනවා. අපේ රෝහලට උදව්වක් වෙලා තිබෙනවා. මම හිතනවා, මේකේ ඉන්න බස්නාහිර පළාත් සභාවේ මේ දිස්ත්‍රික්ක තුනේම මන්ත්‍රීවරුන්ට ඒ විධියට යමක් භුක්ති විඳීමේ හැකියාව ඇති කියලා. අවසාන වශයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එකක් කියන්න ඕනෑ. ඔබතුමා හරහා ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලනවා. මේ වැඩ නිම කරලා අවසන් වන අවස්ථාව වන කොට අපි සියලු දෙනාම ඡන්දයකට යන්න කාලය වකවානුව උදා වෙමින් යන්නේ. එතකොට

මම ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේවා විවෘත කරන අවස්ථාවල තනියෙන් නාම පුවරු නොගහා, තනියෙන් මේ ක්‍රෙඩිට් එක දා ගන්නේ නැතිව අපි සියල්ල එක්කහු වෙලා පළාත් සභාවේ මේ පරිපූරකය පාස් කර ගන්න උදව් කළාය කියන හැඟීම ඇතිව, ගරු මහ ඇමතිතුමා යන්න ඉස්සෙල්ලා අපි එහෙම කරමුයි කියලා කියමින් මගේ අදහස් ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලා, විනාඩි පහකට වාගේ සීමා වෙලා කථා කරනවා නම් හොඳයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විනාඩි පහෙන් කථා කරන්න දෙයක් නැහැ. නමුත් කෙටියෙන් කියනවා නම්, මේ පරිපූරක ඇස්තමේන්තුව ගැන. අපේ අයවැයටත් වඩා විශාල පරිපූරක ඇස්තමේන්තුවක් තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. බිලියන තුනකට පොඩ්ඩක් ඉක්මවූ ප්‍රමාණයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හැම කෙනාම කිව්වා වාගේ අර බෙදිලා ගිහිල්ලා තිබෙන එක ගැන තමයි ගොඩක් දෙනෙකුට තිබෙන ප්‍රශ්නය. විශේෂයෙන්ම කියන්න ඕනෑ. දැන් පාසල්වලට මුදල් වෙන් කරද්දී ව්‍යූහ කමිටුවල යෝජනා ගත්තාය කිව්වා. මම නම් හිතන්නේ නැහැ. එක්කෝ ව්‍යූහ කමිටුවල මොකක් හරි වැරැද්දක් තිබෙනවා. එහෙම නැත්නම් එතැනත් මොකක් හරි දේශපාලන කුමන්ත්‍රණයක් තිබෙන්න ඕනෑ. මොකද, අපේ මීගමුව කලාපය ගත්තාම, ජා - ඇල කොට්ඨාශය ගත්තාම පාසල් දෙකකට විතරයි. උදම්මිටත් එක්ක ගත්තාම තුනකට විතරයි මුදල් හම්බ වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. දැන් ෆායිස් ගරු මන්ත්‍රීතුමාත් මතක් කළා. පසුගිය වසර තුළ අනාරක්ෂිතයි කියලා ඉවත් කරපු ගොඩනැඟිලි ගොඩක් තිබෙනවා, මේ පාසල්වල. දැන් ඒවාවලට මුදල් කොහෙත්වත් වෙන් වෙලා නැහැ. දැන් මම හිතන්නේ මේකත් වැටෙන්න ඕනෑ අර අඩක් නිම කළාය කියලා දාන කොටසටම තමයි. මේවාත් ඒවාටම තමයි වැටෙන්න ඕනෑ. මොකද, අඩක් නිම කරලා පටන් අරගෙන නැහැ. මොකද, අනාරක්ෂිතයි කියලා මේවා කඩා ඉවත් කරලා තිබෙනවා. තුඩැල්ල නිමල මරියා විදුහලෙත් ගිය අවුරුද්දේ බිල්ඩිම අයින් කළා. අනාරක්ෂිතයි කියලා ඉංජිනේරු කාර්යාලයෙන්ම ඇවිල්ලා. දැන් මේකට මුදල් වෙන් කරලා නැහැ. හැබැයි, මේවා කොට්ඨාශයට යවලා තිබෙනවා. කලාපයට යවලා තිබෙනවා. ව්‍යූහ කමිටුවටත් ඇවිල්ලා තිබෙන්න ඕනෑ. නමුත් මේ කියපු විධියට මේ ලැයිස්තුවේ ඒක නැහැ. ඉතින් ඒ වාගේ පාසල් ගොඩක් තිබෙනවා. මම මේ එකක් උදාහරණයකට කිව්වේ. ඉතින් මේක ව්‍යූහ කමිටුවේ ඇවිල්ලා තිබෙන යෝජනා කියන එක නම් මම පිළිගන්නේ නැහැ කොහොමටවත්. මේක කාගේ වුවමනාවට ආවාද මම දන්නේ නැහැ. තවත් පාසල් ගොඩක් තිබෙනවා. අර කිව්වා වාගේ කොළඹට අති බහුතරයක් වෙන් වෙලා තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයටත්, කළුතර දිස්ත්‍රික්කයටත්. ඉතින් එහෙම බලද්දී බහුතරයක් කොළඹ හා සමානම ජනගහනයක් ඉන්න ගම්පහ දිස්ත්‍රික්කය බලද්දී ඒවාට ඉතාමත් අඩු ප්‍රමාණයක් තමයි වෙන් වෙලා තිබෙන්නේ. ඒ නිසා ඔය කොහොම කිව්වත්, හිතපු හිතපු විධියට ඉස්සරත් මේවා බෙදා ගත්තා. ඒක මහ ඇමතිතුමාට වැඩියෙන් බෙදා ගත්තාය කියන එක මට නම් ප්‍රශ්නයක් නැහැ. මොකද, ඉස්සර ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා ඉන්න කාලයේ රෙජී රණතුංග කියලා අලුත් විද්‍යාලයක්ම හදා ගත්තා. එදා අපි කිව්වේ, මිනුවන්ගෙඩට තමයි ඔක්කොම ලැබුණේ කියලා. මිනුවන්ගොඩට ගොඩක් බෙදා ගත්තා. නමුත් මේක එදත් එහෙමයි. අදත් එහෙමයි. හැබැයි, මේක බෙදිලා යද්දී අපේ සෞඛ්‍ය ඇමතිතුමා ඉන්නවා. එතුමාට ගිය අවුරුද්දේ ලිපියක් එව්වා. ජා - ඇළ රෝහලට අර බෙහෙත් ගබඩාවට ශීතකරණ පහසුකම් ටික නැහැ. ඒකට යන්නේ රුපියල් ලක්ෂ තුනයි ද හතරයිද? මම ඇස්තමේන්තුවකුත් යැව්වා. හැබැයි, ඒකට දීලාත් නැහැ. ඒක ඇහෙන්නෙත් නැහැ. ඇහෙන්නේ නැහැ වාගේ ඉන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සෞඛ්‍ය ඇමතිතුමා, ඔබතුමාට කියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා, අවධානය යොමු කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිව්වේ, ගිය අවුරුද්දේ මම DMO ගෙන් අරගෙන ඇස්තමේන්තුවකුත් එව්වා. ජා ඇළ රෝහලට. අර බෙහෙත් ගබඩා කරලා තිබෙන එකේ ශීතකරණය ලබා දෙන්නය කියලා. AC කරලා දෙන්නය කියලා. දැන් අලුත් නීතිය අනුව ෆාමසියකුත් AC කරලා තිබෙන්න ඕනෑ. නැත්නම් බෙහෙත් ගබඩා කරලා තියන්න සුදුසු නැහැ. ඉතින් මේ කියපු ටිකවත් නැහැ. හැබැයි, මේකේ කළුතර දිස්ත්‍රික්කයේ නම් ගොඩනැගිලිද? මොනවාද? ඕනෑ දෙයක් දාලා තිබෙනවා. නමුත් මේ ඉතාමත් අවම අවශ්‍යතාව වුණත් සපුරලා නැහැ. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන් -

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

උපකරණ කියලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

උපකරණ කියලා. ඒකට උපකරණවලට වැටෙනවාද කියලා මම දන්නේ නැහැ. නමුත් මේ උදාහරණයක් කිව්වේ. පාසල් ගැන කියද්දීත් ඒ වාගේ උදාහරණ ගොඩක් තිබෙනවා, කියන්න. වෙලාව නැති නිසා මේවා ගොඩක් කියන්න බැහැ. නමුත් මම ඉල්ලා සිටියේ මේ පරිපූරක ඇස්තමේන්තුව දාද්දී මේකට සංශෝධන ඉදිරිපත් කරන්න, අර හැම කෙනාම කිව්වා වාගේ අවස්ථාවක් ලබා දෙන්නය කියලා. අපේ මහ ඇමතිතුමාගෙනුත් විශාල මුදලක් මෙහෙම වෙන් කරන එක හොඳයි. අපේ පළාතේ ජනතාව වෙනුවෙන් අපි කවුරුත් සතුටු වෙන්න ඕනෑ. විශාල මුදලක් වෙන් කරන එක ගැන. ඒ එක්කම හැම දෙනාගේම ඉල්ලීම තමයි ඒ මන්ත්‍රීවරුන්ගේ අදහස්, යෝජනාත් ගන්නය කියන එක. මේක ව්‍යුහ කමිටුවලයි, කාරක සභාවලයි යෝජනා විතරක් අර ගන්නේ නැතිව. සමහර අය අධ්‍යාපන උපදේශක කාරක සභාවේ නැහැ. ඒගොල්ලෝ ඉන්නේ වෙන ඒවාවල. ඉතින් ඒ අයගේ යෝජනා මේවාට ඇවිල්ලා නැහැ එතකොට. ඉතින් ඒ නිසා ගොඩක් අයගෙන් අපි ඉල්ලා සිටින්නේ. ඇමතිවරුන්ගෙන්. මහ ඇමතිතුමාගෙන්. හැම මන්ත්‍රීවරයෙකුගෙන්ම යෝජනා ගන්න. පුළුවන් නම් මන්ත්‍රීවරයෙකුට මුදලක් වෙන් කරලා දෙන්න මේ පරිපූරකයෙන්. අපට මහ ඇමතිතුමා ගියවර කිව්වා, ලක්ෂ 250 ක් 300 ක් මේ අවුරුද්දේ හැම මන්ත්‍රීවරයෙකුටම වෙන් කරලා දෙනවාය කියලා. ඉතින් ඒක මේකෙන් කරන්න පුළුවන්. අපි කියන්නේ නැහැ, මුදල් වෙන් කරලා දෙන්නය කියලා. ඒ හා සමාන යෝජනා අපෙන් අරගන්න. අරගෙන ඒ යෝජනා ක්‍රියාත්මක කරන්න, මේ පරිපූරකයෙන් මුදල් ටික වෙන් කරලා දෙන්නය කියලා තමයි මම හිතන්නේ, ගොඩක් දෙනෙක් ඉල්ලන්නේ. වෙන මොකුත් ඉල්ලන්නේ නැහැ. අපි කිසිම කෙනෙකුගේ විරෝධතාවයක් නැහැ මේකට. හැම මන්ත්‍රීවරයෙකුටම, හැම මහජන නියෝජිතයෙකුටම තමන්ගේ ප්‍රදේශවල වැඩ කර ගන්නත්, මහ ඇමතිතුමාට 60% ක් වෙන් කරලා තිබෙනවා වාගේම අපටත් ඔය සියයට දශම පහක්වත් යන්නේ නැහැ මම හිතන්නේ ඔය පරිපූරකයෙන් මිලියන 10 ක් 20 ක් වෙන් කළොත්. ඉතින් ඒක සලසා දෙන්නය කියලා තමයි මේ මන්ත්‍රීවරු ඔක්කොම ඉල්ලන්නේ. මම හිතන්නේ, ඔබතුමා මාර්ගයෙන් මහ ඇමතිතුමාටත්, අමාත්‍ය මණ්ඩලයටත් ඒක දැනුවත් කරලා සියලු දෙනාටම අනික් මන්ත්‍රීවරුන්ටත් පොඩි සාධාරණයක් හරි ඉෂ්ට කරන්නය කියලා තමයි අපි සියලු දෙනාගේම ඉල්ලීම. බොහොම ස්තූතියි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පරිපූරක ඇස්තමේන්තුව සාකච්ඡා කරන අවස්ථාවේදී මමත් ජ්‍යෝෂ්ට මන්ත්‍රීවරයෙකු වශයෙන් කවදාවත් මේ වාගේ කථා කරන්න අවස්ථාවක් ලැබිලත් නැහැ. මම මහ ඇමතිවරු ගණනාවක් එක්ක හිටියා. මේ වාගේ ලේඛනයක් මම දැකලත් නැහැ. මේක පළමුවන වතාව. මම සතුටු වෙනවා. මේ වාගේ ලේඛනයක් ඇවිල්ලා විනිවිද පේන්න යමක් කිරීමට උත්සාහ කිරීම සම්බන්ධයෙන්. පළමුවෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මූලාසනයේ සිටින මන්ත්‍රීවරයා මගෙන් කථික ලැයිස්තුවක් ඉල්ලුවා. මම කිව්වා, කථික ලැයිස්තුවක් ඕනෑ නැහැ. මේක කථා කරන්න අවස්ථාවක් දෙන්න කියලා. අද කථා කරන්න අවස්ථාව දුන්න නිසා තමයි මේකේ තිබුණු ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ යම් යම් අදහස් එළියට ආවේ. ඒ තුළ යම් කණ්ඩායමක් බලාපොරොත්තු වුණා, මේකේ බෙදීමක් අරගෙන ගේමක් ගහන්න. අද යථාර්ථය මෙතැනදී ඔප්පු වෙලා තිබෙනවා. මේ දැන් රැස්වීම් ශාලාව තුළ ඉන්න කණ්ඩායම් තුළත් ඒක ඔප්පු වෙලා තිබෙනවා. එහෙම නම් අපි ඔක්කොම එකතු

වෙලා මේ දේ කරමුයි කියන විශ්වාසය තිබෙනවා. යම් යම් සංශෝධන තිබෙනවා. මෙතැන කැලණි කලාපයේත් ලැයිස්තුව තිබෙනවා. මේ ලැයිස්තුවේම ක්‍රියාත්මක වෙලා නැහැ. මුදල් දාලා නැහැ. අඩුපාඩු තිබෙනවා. මම මේක සභාගත කරනවා. මේක තමයි එවපු ලැයිස්තුව. මේක සභාගත කරනවා.[1] මේ වාගේම අනික් ප්‍රදේශවලත් තිබෙන්න පුළුවන්.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කවුද ඒක එව්වේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කැලණි කලාපයේ ව්‍යුහ කමිටු රැස්වීම. මේ ව්‍යුහ කමිටු රැස්වීම ඔබතුමා නොදැනුවත්ව වෙන්න ඇති කථා කරන්නේ. මේ තිබෙන්නේ ව්‍යුහ කමිටු රැස්වීම. මේකේ තිබෙනවාද කියලා අහනවා, ඔබතුමා කියන ඒවා. මේකේ තිබෙනවාද කියලා අහනවා, මේ තිබෙන ගණන. එපමණයි ඕනෑ. (බාධා කිරීම්) මේ තිබෙන්නේ ලේඛනය. මම වගකීමෙන් කථා කරන්නේ. මේ තිබෙන්නේ ලේඛනය. ව්‍යුහ කමිටු ලේඛනය. මේ වැරදි අර්ථ කථනයක් ගේන්න යම් යම් අය උත්සාහ කරනවා. විපක්ෂයේ සංවිධායකවරයා වශයෙන් - ඒ වාගේ කැත වැඩ නැහැ. මේ මගේ ගේ එහා පැත්තේ පාසලත් අඩක් නිම කරලා. ඒකත් නැහැ. මේ වාගේ වැරදි චිත්‍ර මවන්න එපා. ගරු මන්ත්‍රීතුමා, වැරදි චිත්‍ර මවන්න එපා. මම ඉල්ලීමක් කරනවා. අපි බලයට ආවත්, කවුරු බලයට ආවත්, තිබෙන මුදල්වලින් ප්‍රයෝජනය ගන්න ඕනෑ.

හැබැයි, මූල්‍ය කළමනාකරණයක් කරන්න ඕනෑ. මමත් ගණකාධිකාරීවරයෙක් වශයෙන් කටයුතු කළේ. මූල්‍ය කළමනාකරණයක් තුළ කටයුතු කරන්න ඕනෑ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගියවර අයවැය විවාදයේදී මේ සම්බන්ධව කිව්වා. මේක කවුරුත් කිව්වේ නැහැ. ගියවර අයවැය විවාදයේදී කථාවේදී කිව්වා, මම මුලින්ම පරිපූරක ඇස්තමේන්තුවක් පෙබරවාරි මාසයේදී ගේනවාය කියලා. බලන්න වාර්තාවේ කියවලා. ඒ දේ අද එතුමා කරලා තිබෙනවා. එහෙම නම් අපට ඒ අවස්ථාව දීලා තිබෙනවා. එහෙම නම් අපි ඒක හොඳ පැත්තට ගනිමු. හොඳ පැත්තට අරගෙන මේ ගමන යමුයි කියන එකයි මම ඉල්ලීමක් කරන්නේ.

ඒ වාගේම සෞඛ්‍ය පැත්ත කථා කරන කොට ගරු සෞඛ්‍ය ඇමතිතුමා ගරු සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න ඇමතිතුමාත් සමඟ අපේ කිරිබත්ගොඩ රෝහලට ආවා. මෙතුමාගේ කථාවේදීත් අපට කිව්වා, ඒකේ තිබෙන අඩුපාඩු සකස් කරනවාය කියලා. මම ඉල්ලීමක් කරනවා. ඒ උපකරණ, ඔබතුමා කියපු කථාව වාගේ ඒ උපකරණ අඩුපාඩු - කොළඹට ආසන්නම තිබෙන ප්‍රධාන රෝහලක් ලෙස කිරිබත්ගොඩ රෝහල කියන්නේ. ඒකට අංග සම්පූර්ණ උපකරණ, ඒ කියන්නේ ඔපරේෂන් තියටර් එකට අවශ්‍ය දේවල් තමයි. ඔබතුමා දන්නවා. ඒ දේ ක්‍රියාත්මක කරන්නය කියලා, හදිසි අනතුරු අංශයේ අවශ්‍ය උපකරණ ලබා දෙන්නය කියන එක මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම පරිපූරක අවස්ථාවේදී අපට මේ වාගේ අවස්ථාවක් ලබා දීම ගැන අපි සතුටු වෙනවා වාගේම, මම ඉල්ලීමක් කරනවා. ගරු විපක්ෂ නායකතුමා, අපේ මංජු ශ්‍රී අරංගල මැතිතුමා අන්තිමට සංශෝධනයක් ගේනවා. ඒ සංශෝධනයට අපි සියලුම දෙනා කැමැති වෙලා කටයුතු කරමුයි කියලා ඉල්ලීමක් කරමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධවත් ස්තුතිවන්ත වෙමින්, ඒ වාගේම තව මාස නවයයි තිබෙන්නේ. මේ පරිපූරකය පාස් කරන්න. මේ වාගේ මුදලක්. මිලියන 3500 කට ආසන්න මුදලක් පාස් කළත් ක්‍රියාත්මක කරන්න ඕනෑ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යවරු. එතුමන්ලාට ඒ ශක්තිය තිබෙන්න ඕනෑ. බොරුවට මුදලක් වෙන් කළ ගමන් කැත විධියට හිතනවා නම්, සවුත්තු විධියට හිතනවා නම් ලැජ්ජයි. කවුරුත් මේ මුදල් සාක්කුවේ දා ගෙන යන්නේ නැහැ. කොන්ත්‍රාත්කරුවෝ අපේ කාගේවත් නොවෙයි. එහෙම නම් ඒවා විනිවිද පේන්න, ඒ මුදල් ප්‍රමාණය ඉක්මණට කර ගන්න ගරු අමාත්‍ය මණ්ඩලය දවස ගණනේ, සුමාන ගණනේ හරි කැඳවාගෙන ඒක ශක්තිමත් කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. නැත්නම් මොන තරම් පරිපූරක පාස් කළත් වැඩක් නැහැ. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අමාත්‍යාංශයේ මුදල් ඉතිරි වෙනවා නම්. ඒ කියන්නේ වැඩක් වෙන්නේ නැහැ. ඒක නොකරන්නය කියලා මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. බොහොම ස්තුතියි.

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කියපු කාරණය. එතුමා ව්‍යූහ කමිටුවේදී දීලා තිබෙන ව්‍යාපෘති එකක්වත් මේ මිලියන 105.95 ඇතුළේ නැත්නම් ඒක බරපතළ ප්‍රශ්නයක්. මම කියන්නේ ඔබතුමාට, මේකම තමයි එහෙම නම් ප්‍රශ්නය. ඒ කියන්නේ, මේ මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතා අනුව - ලේබන එකක් නොවෙයි සීයක් ඉදිරිපත් කළත් වැඩක් නැහැ. මේ ව්‍යාපෘති 241 න් වැඩක් නැහැ එහෙම නම්. මේ ව්‍යාපෘති 241 කා සඳහාද? ඇයි මෙතැන 104 දෙනෙකු ජනතා නියෝජිතයෝ වශයෙන් පත් කරලා එවන්නේ. මේ ජනතා නියෝජිතයෝ පත් කරලා එවන්නේ, ඒ ජනතාවගේ අවශ්‍යතාවය මත පදනම් වෙලා කටයුතු කරන්න. එහෙම නම් අපේ මන්ත්‍රීවරුන්ගේ යෝජනා මේකේ නැත්නම්, මේක බරපතළ ප්‍රශ්නයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාට එක කාරණයක් පෙන්වන්නම්. මේ ලැයිස්තුවේ තුන් වන පිටුවේ අංක 84. මම මේ උදාහරණයක් කියන්නේ. අංක 84 සේදවත්ත, සිද්ධාර්ථ මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය. 2016 දී මේ අධ්‍යාපන ඇමතිවරයාට මම ලියුමක් දුන්නා, මේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කරලා දෙන්නය කියලා. ඒ පාර කිව්වා, ඊළඟ අයවැයට අනිවාර්යයෙන් දානවා. අයවැය යෝජනාවලට මේක ඇතුළත් කරනවා. මේක කෝටි පහක් විතර යන වැඩක්. මිලියන පනහක් විතර යන වැඩක් කියලා, ලේකම්වරයාට අත්සන් කරලා දුන්නා ලියුම. ඒක කෙරුණේ නැහැ. ඊට පස්සේ පරිපූරක ඇස්තමේන්තුව එන කොට ඇමතිවරයාට ගිහිල්ලා කිව්වා, ඇමතිතුමා සේදවත්ත සිද්ධාර්ථ විද්‍යාලයේ වැඩේ කෙරුණේ නැහැ. හරි මේ සැරේ පරිපූරකයට දාමු. අනේ මන්ත්‍රීතුමා, මතක් කරන්න කිව්වා. ආයිත් ලියුමක් දුන්නා. ඒක කෙරුණෙත් නැහැ. ඊට පස්සේ හදිසියේ දවසක් මට මේ අධ්‍යාපන ඇමතිවරයා කථා කරනවා. කථා කරලා මොකක්ද කියන්නේ? මන්ත්‍රීතුමා, ක්‍රීඩා අමාත්‍යාංශයෙන් යෝජනා වගයක් ඇවිල්ලා තිබෙනවා. ඔබතුමාගේ අර තිබුණා නේද ක්‍රීඩාංගනයක්. මම කිව්වා, ඔව්. සේදවත්ත සිද්ධාර්ථ ක්‍රීඩාංගනය. අනේ ඒක ගැන පොඩ්ඩක් විස්තර කියන්න කෝ? ඒ පාර දුරකථනයෙන් මම කිව්වාම කිව්වා, හරි අපේ ක්‍රීඩා අමාත්‍යතුමා, දයාසිරි ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් එවලා තිබෙනවා. මේක තමයි හදන්නේ කියලා. දැන් මම දන්නේ නැහැ. මම කියලා නැහැ. හැබැයි, මිලියන හතක යෝජනාවක් එනවා මේ ලැයිස්තුවට. මේ ව්‍යූහ කමිටුව කථා වුණේ නැහැ මේක. මම ලිඛිතව විතරයි දැනුම් දීලා තිබෙන්නේ. ලියුම් තුනක් ලියලා තිබෙනවා. මිලියන හතක යෝජනාවක් එවලා තිබෙනවා. ඇත්තටම මේක මිලියන 50 ක් යන ව්‍යාපෘතියක්. මම දන්නවා, එක සැරේ එහෙම මුදල් ඉල්ලීම අසාධාරණයි. හැබැයි, මිලියන 7 ක එකක් මේ ලැයිස්තුවට එනවා, මේක හදන්නය කියලා. මම දන්නේ නැහැ කොහෙන්ද ආවේ කියලා. මම මේක ඊයේ පරීක්ෂා කළා. කලාප කාර්යාලයෙන් ඇහුවාම කියනවා, අපට කථා කරලා කිව්වා තිබෙන ව්‍යාපෘති ටිකක් එවන්නය කියලා. අපි මේකත් දාලා යැව්වා.

හැබැයි, ඒ පදනමෙන් නම් මේ ව්‍යාපෘතිය ඇවිල්ලා තිබෙන්නේ, අපේ සංවිධායකතුමා කිව්වා වාගේ ඒ පදනමෙන් නම් මේ ව්‍යාපෘති ඇවිල්ලා තිබෙන්නේ, එහෙම නම් මේ මන්ත්‍රීවරුන්ගේ උවමනාව ඉෂ්ට වෙලා නැහැ. මන්ත්‍රීවරුන්ගේ උවමනාව ඉෂ්ට වෙලා නැහැයි කියන්නේ, පළාතේ ජනතාවගේ වුවමනාවන් මේ ලැයිස්තුවක් දැමීමෙන් ඉෂ්ට වෙලා නැහැ. මේ බොරු ලැයිස්තුවක් දානවාට වැඩිය හැම මන්ත්‍රීවරයාගේම උවමනාව සලකා බලලා, ඒ යෝජනා ටික කැඳවලා මේක කළා නම් මේ ප්‍රශ්නය වෙන්නේ නැහැ. ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මම කියන්නේ, අපට මහ ඇමතිතුමා එක්ක ප්‍රශ්නයක් නැහැ. මේ මුදල් වෙන් කිරීම පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. ජයවර්ධනපුර කලාපයට මිලියන 445 ක් වෙන් කරලා තිබෙනවා. අපි දන්නවා, ඒකෙන් මහරගමට මිලියන 342.5 යි. හැබැයි, කොළොන්නාව මම නියෝජනය කරන කොට්ඨාශයට මිලියන 19 යි. අඩුවෙන්ම තිබෙන්නේ, කොළොන්නාවට. ඒ කොළොන්නාවේ එකක් තමයි මේ මිලියන 07. මම කියන්නේ, ඒක නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. මම කලින් කිව්වා වාගේ සමානාත්මතා පදනමෙන්, සියලුම මන්ත්‍රීවරුන්ට සමාන අගයක් ලැබෙන විධියට - මන්ත්‍රීවරයා ඒවා වියදම් කර ගත්තේ නැත්නම් කරන්න දෙයක් නැහැ. හැම මන්ත්‍රීවරයෙකුටම යම් මුදලක් වෙන් කළාට පස්සේ, ඒ මුදල මන්ත්‍රීවරයා වියදම් කර ගත්තා නම්, ඒක මහ ඇමතිතුමාගේ ප්‍රශ්නයකුත් නොවෙයි. ඇමතිවරුන්ගේ ප්‍රශ්නයකුත් නොවෙයි. මේ පළාත් සභාවේ ප්‍රශ්නයකුත් නොවෙයි. ඒක මන්ත්‍රීවරයාගේ ප්‍රශ්නයක්. හැබැයි, මම

කියන්නේ, බෙදීමේ සමානාත්මතා පදනමෙන්. එක මන්ත්‍රීවරයෙකුට මෙපමණ දෙනවා. දැන් මහ ඇමතිතුමාට මතක ඇති. ගිය සැරේ හැමෝටම යම් මුදලක් දෙනවාය කිව්වා. ලක්ෂ 20 ක්. හැබැයි, සමහරුන්ට දෙන්නේ නැහැයි කියලා මතයක් ආවා. මම කිව්වා, මම ගන්නේ නැහැ. හැබැයි, අන්තිමේදී ගන්නේ නැහැයි කියපු සමහර මන්ත්‍රීවරු ගත්තා. ඒත් කිඳෙල්පිටිය ගත්තේ නැහැ. කරන්න දෙයක් නැහැ. මම කියන්නේ, සමානාත්මතා පදනමෙන් බෙදන්න.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

හැබැයි, ඒක ප්‍රදේශයේ ජනතාවට කරපු අසාධාරණයක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

වෙන්න පුළුවන්. නමුත් අපි මන්ත්‍රීවරු හැටියට, ජනතා නියෝජිතයෝ හැටියට, දේශපාලඥයෝ හැටියට අපට යම් ස්ථාවරයක් තිබෙන්න ඕනෑ. ඒ ස්ථාවරය අනුව කටයුතු කරන්න ඕනෑ. අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කළා. ඉතා හොඳයි. එතුමාගේ කොට්ඨාශයට මිලියන 236 ක් හම්බ වෙලා තිබෙනවා. දැන් මේ කථා කරපු මන්ත්‍රීවරු ඔක්කොම දිහා බැලුවාම, ඒගොල්ලෝ නියෝජනය කරන කලාපය, කොට්ඨාශය එක්ක පුංචි විශ්ලේෂණයක් කළොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පේනවා. ඇයි ඒගොල්ලෝ මේ පිළිබඳව ධනාත්මකව සහ ඍණාත්මකව ද කථා කරන්නේ කියලා. ඒක යසට විශේලේෂණය කර ගන්න පුළුවන්. ඒ නිසා ඕනෑ කෙනෙකුට කියන්න පුළුවන් කිඳෙල්පිටියටත් හිතේ අමාරුවක් තිබෙනවා. ජයවර්ධනපුර කලාපයේ මැතිවරණ කොට්ඨාශවලට වැඩියෙන් දීලා. කොළොන්නාවට - කොළොන්නාව කියන්නේ, බරපතළ ප්‍රශ්න තිබෙන කොට්ඨාශයක්. හැබැයි, කොළොන්නාවට අඩුවෙන් දීලා. කොළොන්නාව කොට්ඨශ කාර්යාලයේ ඒ කොට්ඨාශ අධ්‍යක්ෂවරියට ආපු දවසේ ඉඳලා වැසිකිලියක් නැහැ. ඒක ඉල්ලලා දැන් අවුරුදු ගණනක් වෙනවා. ඒ නිසා මේ අවශ්‍යතාවය - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්නේ අවශ්‍යතා තේරුම් ගන්න. මේක අපි ආයි හෝදා හෝදා මඩේ දාලා වැඩක් නැහැ. අවශ්‍යතාවය තේරුම් ගන්න. මන්ත්‍රීවරුන්ගේ යෝජනා පිළිගන්න. ඒ අනුව සෑම මන්ත්‍රීවරයෙකුටම සමානතා පදනමින් මේක බෙදන්න. එහෙම බෙදුවොත් මේ යෝජනාවට, මේ පරිපූරක යෝජනාවට පෞද්ගලිකව මගේ ඡන්දය දෙනවා. නැත්නම් ඡන්දය දෙන්නේ නැහැ. බොහොම ස්තූතියි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුවෙන්ම මම සතුටු වෙනවා. මෙවැනි පරිපූරක ඇස්තමේන්තුවක් සම්බන්ධයෙන් මේ සභාව තුළ ඉතාම විවෘත ඒ වාගේම විනිවිදභාවයකින් යුතු සාකච්ඡාවක් ඇති වීම සම්බන්ධයෙන්. මේක යහපාලන දේශපාලන සංස්කෘතියේ වැදගත් අංග ලක්ෂණයක් විධියටයි අපි දකින්නේ. මොකද, සම්මුතිවාදී ආණ්ඩුවේ, මේ යහපාලන ආණ්ඩුවේ අපි ප්‍රධාන වශයෙන්ම ඉදිරිපත් කරපු ප්‍රතිපත්තියක් තමයි, අදහසක් තමයි විවෘත භාවය, විනිවිදභාවය සහ මූල්‍ය කළමනාකරණයේදී පැවතිය යුතු ඒ විනිවිදභාවය පවත්වා ගැනීම කියන එක. අද මේ සභාව තුළ ඒක තමයි පිළිබිඹු වෙන්නේ. මීට කලින් මේ සභාවේම අදහස් පළ වුණා. හිටපු ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරුන්ගෙන් මෙවැනි පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් වුණු අවස්ථාවලදී මේ වාගේ විවෘත සාකච්ඡාවක්, සංවාදයක් සිදු නොවුණු බව. බොහෝ වෙලාවට එම යෝජනාව මහ ඇමතිවරයා ඉදිරිපත් කරනවා. සිග්නල් කණු වාගේ ඒකට අත උස්සන එක විතරයි සිද්ධ වුණේ. ඒ ගැන පුළුල් සාකච්ඡාවක්, විවෘත සාකච්ඡාවක් සංවාදයක් සිදු වුණේ නැහැ. ඒ වාගේම මේ වාගේ වාර්තාවක්, ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් වුණේ නැහැ. ඒ ව්‍යාපෘතිවලට කොපමණ මුදල් වෙන් කළාද? මේවායේ අවශ්‍යතාවය මොකක්ද? ප්‍රමුඛතාවය කුමක්ද කියන එක පිළිබඳව කරුණු ඉදිරිපත් වුණේ නැහැ.

ඒ නිසා පැහැදිලිව කියන්න ඕනෑ. මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා තිබෙන්නේ, මුදල් කාබාසිනියා කරන්න නොවෙයි. එහෙම නැත්නම් මේ මුදල් අරගෙන මේවායින් කැසිනෝ ගහන්නවත්, එහෙම නැත්නම් මේ මුදල්වලින් සූදු කෙළින්නවත් ඒ ඇමතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ උවමනාව සඳහා නොවෙයි. මේ මුදල් ආයෝජනය කරන්නේ, මේ පළාතේ මහජනතාවගේ සුභ සිද්ධිය සඳහා. මේ පළාතේ දරුවන්ගේ අධ්‍යාපනයේ සුභ සිද්ධිය සඳහා. මේ පළාතේ සෞඛ්‍ය ක්ෂේත්‍රය නගා සිටුවීම සඳහා. මේ පළාතේ යටිතල පහසුකම් දියුණු කිරීම, සංවර්ධනය කිරීම සඳහා. නමුත් මේ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන තර්කවල කිසිදු පදනමක් නැහැයි කියන එක පෙනී යන්නේ මොකද, ඔවුන් හැම විටම කල්පනා කරන්නේ ප්‍රාදේශීයවාදීව තමන්ට මේකෙන් ලැබෙන ප්‍රතිලාභය මොකක්ද? තමන්ගේ ප්‍රදේශයට ලැබෙන ප්‍රතිලාභය කුමක්ද

[ ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

කියන එක දිහා බලලා. එහෙම නැත්නම් මේකෙන් ලැබෙන දේශපාලන වාසිය දිහා බලලා. නමුත් පසුගිය පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල අරගෙන බැලුවාම අපට පේනවා, මොන තරම් සංවර්ධන කටයුතු කළත්, ඒ වාගේම යටිතල පහසුකම් දියුණු කළත්, ඒ වාගේම මහජන සුභ සිද්ධිය සඳහා යම් යම් දේවල් කළත් ඒවා මත නොවෙයි ජනතාව තීන්දු තීරණ ගන්නේ. උදාහරණයක් විධියට අරගෙන බැලුවොත් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව අරගෙන බැලුවොත්, දැක්කා ඒකේ ප්‍රතිඵලය කුමක්ද කියන එක. එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා වැඩිපුරම සංවර්ධන කටයුතු කළේ, සුභ සාධන කටයුතු කළේ බඩු භාණ්ඩ බෙදා දුන්නේ, ඒ සියලු කටයුතු කළේ ඒ ප්‍රදේශවල. නමුත් ඒක ඒ මැතිවරණ ප්‍රතිඵලවලට කිසිසේත් අදාළ වෙලා නැහැයි කියන එක පැහැදිලියි. ඒ නිසා එකෙන් ලබපු ප්‍රතිලාභය ඒ ප්‍රදේශයේ ජනතාවට තිබෙනවා. ඒ සංවර්ධන කටයුතුවල ප්‍රතිලාභය ඒ ජනතාවට ලැබිලා තිබෙනවා.

ඒ නිසා අපි කල්පනා කරන්න ඕනෑ. මේකෙන් තමන්ගේ දේශපාලන ප්‍රතිරූපය හදා ගන්නවත්, එහෙම නැත්නම් තමන්ට දේශපාලන වාසියක් ගන්නවත් නොවෙයි. මේක පැහැදිලිවම මේ අපේ ඇමතිවරු දන්නවා. පසුගිය පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵල. නමුත් මෙවැනි පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා තිබෙන්නේ, වෙන මොකක් සඳහාවත් නොවෙයි. මේ ප්‍රදේශයේ මේ පළාතේ මේ තමන්ගේ දිස්ත්‍රික්කවල ඒ තිබෙන අඩු පහසුකම් සහිත ඒ වාගේම භාගයට ඉදි කිරීම් කරලා තිබෙන, ඒ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය ආයෝජනයක් විධියට තමයි මේ මුදල් වෙන් කරලා තිබෙන්නේ. පාසල් දියුණු කරන්න. සංවර්ධනය කරන්න. සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුණු කරන්න. සංවර්ධනය කරන්න. ඒ නිසා මේ පිළිබඳව පටු අදහස්වලින්, පටු ආකල්පවලින් බලන්නේ නැතිව, මෙවැනි පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීම පිළිබඳව අපි සතුටු වෙනවා. ඒ වාගේම මේකේ විවෘතභාවයක් තිබෙනවා. ඒ වාගේම මේ ව්‍යාපෘති තෝරා ගැනීම කරලා තිබෙන්නේ, ව්‍යුහ කමිටු තුළ. ඒ තුළ යම්කිසි විවෘත භාවයක් තිබිලා තිබෙනවා. විනිවිද භාවයක් තිබිලා තිබෙනවා. ඒ වාගේම ප්‍රමුඛතාවය සහ අවශ්‍යතාවය හඳුනාගෙන තිබෙනවා. අඩුපාඩු තිබෙන්න පුළුවන්. ඒ අඩුපාඩු තිබෙනවා නම්, ඒවා අපි නිවැරදි කරන්න ඕනෑ. ඒවා අපි කථා කරන්න ඕනෑ. සාකච්ඡා කරන්න ඕනෑ. මෙන්න මේ සාකච්ඡාව, සංවාදය, සම්මුතිය තමයි අවශ්‍ය කරන්නේ. මේ යහපාලන ප්‍රතිපත්තිය ඉස්සරහාට ගෙනියන්න. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. මුදල් අපට තැන්පත් කරලා තියා ගන්න පුළුවන්. ඒවා ආරක්ෂා කරලා තියා ගන්න පුළුවන්. නමුත් මේ මුදල් හැම විටම රටේ ජනතාවගේ සුභ සිද්ධිය, පළාතේ ජනතාවගේ සුභ සිද්ධිය සඳහා යොදවන්න ඕනෑ. අන්න ඒ සඳහා මේ පරිපූරක ඇස්තමේන්තුවට අපේ සම්පූර්ණ සහයෝගය අපි පළ කරනවා. මේ පිළිබඳව අපේ සතුට අපි පළ කරමින් මේ තරම් විවෘත භාවයක් සහ විනිවිදභාවයකින් කටයුතු කිරීම පිළිබඳව අපේ සහයෝගය, කැමැත්ත ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. මට මතකයි, පසුගිය මහ ඇමතිවරයා ඉන්න කාලයේ මම ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමාට කිව්වා. ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කළා. ගරු මහ ඇමතිතුමනි, මට පාසලකට ළමුන් තුන් දෙනෙකු දාලා දෙන්නය කියලා. ඒ දවස්වල මම ප්‍රසන්න රණතුංග හිටපු මහ ඇමතිතුමාට ඒක කිව්වාම එතුමා කිව්වේ, මල්ලියා ඕක කරන්න පුළුවන්කමක් නැහැයි කියලා. ළමයි තුන් දෙනෙකු පාසලට දාලා දෙන්න. මම විපක්ෂයේ සිටීම සමහරවට ඒකට හේතුවක් වෙන්න ඇති. ඊට පස්සේ ඒ දවස්වල අපට වෙන් වුණේ, ප්‍රතිපාදන ලක්ෂ 35 යි. ඒ ලක්ෂ 35 ක් ලැබුණු අවස්ථාවේදී ඊට අමතරව පාලක පක්ෂයේ පාර්ශවයන්ට විශාල වැඩි වරප්‍රසාද ප්‍රමාණයක් ලැබුණා. ඒ අවස්ථාවේදී ගිහිල්ලා මහ ඇමතිතුමාව හම්බ වෙලා - ඒ දවස්වල වෙනමම ව්‍යාපෘතියක් ලක්ෂ පහක් තිබෙනවා. පුළුවන් නම් මේ ව්‍යාපෘතිය කරලා දෙන්නය කියලා දුන්නා. නමුත් ඒ අවස්ථාවේදී ඒ පිළිබඳව මොනම ආකාරයෙන්වත් සහයෝගයක් දැක්වුවේ නැහැ. අර අපට ලැබුණු ලක්ෂ 35 ම තමයි. අපි අද විශේෂයෙන් මාත් එක්ක ප්‍රතිවාදියෙක් හැටියට එන්න ඉන්න පුද්ගලයෙකු තමයි ගරු මහ ඇමතිතුමා. අපි දෙන්නාම මහරගම ආසනය නියෝජනය කරන්නේ. සමහර විට එක කොට්ඨාශය නියෝජනය කරන මහ ඇමතිවරයා සහ මම මන්ත්‍රීවරයෙක්. අද මේ අපේ ඉසුර දේවප්‍රිය ගරු මහ ඇමතිතුමා මේ විධියට මහ ඇමතිවරයා බවට පත් නොවුණා නම්, අද විපක්ෂයේ ඉන්න අපි

සියල්ලටම ලක්ෂ 24 කින් සෑහීමකට පත් වෙන්න සිද්ධ වෙනවා. ලක්ෂ 24 ක් තිබුණු ප්‍රමාණය අපි සියලු දෙනාටම ලක්ෂ 50 ක් දක්වා වැඩි කරලා දුන්නා. ඇත්තටම අපි ඒකට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපි යම් අවස්ථාවක ඉල්ලීමක් කළොත් ඒ අමාත්‍යාංශ හරහා, ඉස්සර සත පහක දෙයක් ලබා දුන්නේ නැහැ. අපට සත පහක්වත් නොදෙන තවත් අමාත්‍යාංශ තිබෙනවා. නමුත් පොදුවේ අපි ගත්තොත් එහෙම, ඕනෑම අමාත්‍යවරයෙකු එක්ක අපි කථා කළොත් එහෙම, අපට අවශ්‍ය කරන ඒ කටයුතු සිද්ධ කරලා දීලා තිබෙනවා.

ඒ නිසා විශේෂයෙන්ම අර මීට පෙර - මම ඉතාම සතුටට පත් වෙනවා. අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මේ පිළිබඳව දීර්ඝ විග්‍රහයක් කළා. මෙතෙක් කල් අපි ඇත්තටම දැක්කේ නැහැ පරිපූරකයක් සඳහා මේ වාගේ මුදල් වෙන් කිරීමක් කරලා, විනිවිදභාවයකින් එය ඉදිරිපත් කරනවා. මෙතෙක් කල් සිද්ධ වුණේ, තමන් මුදලක් වෙන් කර ගත්තා. තම තමන්ගේ ව්‍යාපෘති ඒ ඇතුළට දා ගත්තා. ඒ ඇතුලේ ඒක ක්‍රියාත්මක කර ගෙන ගියා. ඒ නිසා යම් යම් පාඩු සිද්ධ වෙන්න පුළුවන්. අපේ කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, කට්ටියකට වැඩියෙන් තිබෙන කොට ඒ කට්ටිය කථා කරනවා. අඩුවෙන් තිබෙන කොට අඩුවෙන් කථා කරනවා. එතුමාට අඩුවෙන් තිබෙන නිසා සමහර විට එතුමා අඩුවෙන් කථා කරනවා. ඒක එක එක පුද්ගලයින්ගේ මත. නමුත් මට මේ තුළ කියන්න එක්තරා දෙයක් අවශ්‍ය වෙලා තිබෙනවා. මහ ඇමතිතුමා මේ වෙලාවේ හිටියා නම් හොඳයි. මම හිතන්නේ, මහරගමට තමයි මම නියෝජනය කරන ප්‍රදේශයට තමයි විශාලම මුදල් ප්‍රමාණයක් මේකේ වෙන් කරලා තිබෙන්නේ. හැබැයි, මේකේ සමහර තැන් බැලුවාම අත්‍යවශ්‍යම ස්ථානදෝ කියලා පුංචි සැකයකුත් ඇති වෙනවා. දැන් සමහර පාසල් තිබෙනවා. අලුතෙන්ම ඉදි වන සමහර පාසල්. ප්‍රදේශය නියෝජනය කරන නිසා නම් කරන්න කැමැති නැහැ. අලුත්ම පාසල්. පාසලේ දරුවෝ සංඛ්‍යාව ගත්තොත් එහෙම ඉතාම අනූ හත් දෙනෙකු වාගේ ඉන්න පාසල්වලට කෝටි ප්‍රකෝටි ගණනක මුදල් ප්‍රමාණයක් වෙන් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ තිබෙන පාසල්වලින් වැඩිම ළමයින් සංඛ්‍යාවක් ඉන්න පාසලක් තමයි කොළඹ රාජකීය විද්‍යාලය. කොළඹ රාජකීය විද්‍යාලය ඇරුණාම වැඩිම ළමයින් සංඛ්‍යාවක් ඉන්න ස්ථානයක් තමයි කොට්ටාව ධර්මපාල විද්‍යාලය. කොට්ටාව ධර්මපාල විද්‍යාලයට වසරකට හය වන ශ්‍රේණිය සඳහා ළමයින් 750 ක් අලුතෙන් එනවා. ඒ විදුහල්පතිවරයා කියනවා, ඒ විදුහල්පතිවරයාට ඒ එන ළමයින් සංඛ්‍යාව පාසලට දා ගන්න බැහැ. පාසලේ ගොඩනැගිලි නැහැ. නමුත් මෙවර ඒ සඳහා වෙන් කරලා තිබෙනවා, පාසල සඳහා. කොට්ටාව ධර්මපාල විද්‍යාලය. 82 යටතේ. බැල්කනිය සහිත ශ්‍රවණාගාරය ඉදි කිරීම. එතකොට දැන් කල්පනා කරන්න බලන්න. මේ පාසලට අවශ්‍ය කරනවා තනි මහල් ගොඩනැගිල්ලක්. බස්නාහිර පළාතේ වැඩිම ළමයින් සංඛ්‍යාව ඉන්න පාසල. එතකොට මේකේ මම දන්නේ නැහැ කලාප කාර්යාලය යවපු එකක්ද කියලා. එතකොට මේකද ප්‍රමුඛතාවය? එතකොට මේ පාසලේ ළමයින් ටික පිට්ටනියට ගෙන්වා ගන්න බැහැ. එපමණ ළමයින් සංඛ්‍යාවක් ඉන්න ස්ථානයක්.

ඒ නිසා මෙන්න මේ වාගේ අඩු - දැන් මේකත් ඉතා හොඳයි. මේ කටයුත්තත් ඉතා වැදගත් දෙයක් වෙනවා. නමුත් මීට වඩා අනික් එක වැදගත් නොවේදෝ කියලා ගැටළුවක් තිබෙනවා. ඒ නිසා මේ පරිපූරකයට අමතරව තවත් අමතරව - මීට පෙර කිව්වා වාගේ, සංචිතයන් තුළ මුදල් හිර කරලා තියනවාට වඩා, යම් විධියකින් එක් කොටසක් තියලා තවත් කොටසක් - ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට තවදුරටත් මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබා ගෙන ඒ ව්‍යාපෘති සඳහා වෙන් කරන්න අවස්ථාවක් දෙනවා නම් වඩාත් හොඳයි. මොකද, මහරගම බුවනෙකබා විද්‍යාලයේ පිට්ටනිය වෙළෙන්දෝ දැන් අල්ලාගෙන. වෙළෙන්දෝ වැට ගලවාගෙන ඇතුළට ඇවිල්ලා වාහන දා ගෙන බඩු විකුණනවා. ඉතින් අපි දැන් ව්‍යුහ කමිටුවේ ඇති වෙන්න කථා කළා. මෙතුමාත් දන්නවා. මේකේ වැට ගහලා දෙන්නය කියලා. ගත්ත ගමන්ම මම බැලුවා අත්‍යවශ්‍යම දේ. වෙළෙන්දන් මේ ඇතුළු වෙන ස්ථානය නැති කර ගන්න. නමුත් ඒවා මේකේ නැහැ. ඒ නිසා එවැනි ව්‍යාපෘතීත් මේකට ඇතුළු කර ගන්න පුළුවන්කමක් තිබෙනවා නම් වඩා හොඳයි. මේ අවස්ථාව ලබා දීම ගැන ගරු ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමනි, 2018 පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මේ සභාවේ විශේෂයෙන්ම නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කිරීමේදී සඳහන් කරන්න යෙදුණා, මේ යහපාලනය තිබෙන හොඳකම නිසා මේ පරිපූරකය පිළිබඳව මේ තරම් විනිවිදභාවයකින් යුතුව ඉදිරිපත් වුණාය. විනිවිදභාවයකින් යුතුව සාකච්ඡා කරන්න ඉඩකඩ ලැබුණාය කියන කාරණාව කියන්න යෙදුණා. ඒ වාගේම ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, පළාත් සභා ඉතිහාසයේ කවදාවත් පරිපූරකයක් පිළිබඳව සාකච්ඡා කරන්න හම්බ වුණේ නැහැයි කියලා. මම ඉතාම කනගාටු වෙනවා. එතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙකු හැටියට ඕනෑ තරම් - මම 2004 සිට මේ සභාව නියෝජනය කරන්නේ. එදා සිට මේ දක්වා ඕනෑ තරම් පරිපූරක පිළිබඳව විවේචන කරන්න, අදහස් ඉදිරිපත් කරන්න මේ සභාවේ ඕනෑ තරම් ඉඩකඩ තිබුණු අවස්ථා තිබුණා. හැබැයි, මේ වාගේ දවස පුරා නොගිය එක ඇත්ත. ඒ වාගේම ව්‍යාපෘති ලේඛනයක් මේ ආකාරයෙන් ඉදිරිපත් නොවුණු බවත් ඇත්ත. නමුත් විෂයයන් හැටියට යම් පැහැදිලි විස්තරයක් ඒ මුදල් මොනවාටද වෙන් වෙන්නේ කියන එක ඉතිහාසයේ ඕනෑ තරම් අවස්ථාවල විස්තර වී තිබුණාය කියන කාරණාව මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. හංගලා ගැහුවත්, ගහන වැඩේ කළා කොහොම හරි. හැබැයි, ඒ කාලය තුළ 'සරුදම් අරුණැල්ල', 'අපේ පාසල අපේ දැතින් සුරකිමු' කියන ව්‍යාපෘති මුළු සමස්ත පාසල් පද්ධතියටම, දහම් පාසල් පද්ධතියටම සියලුම මන්ත්‍රීවරු සම්බන්ධ වන ව්‍යාපෘති ඕනෑ තරම් ඒ කාලයේ ක්‍රියාත්මක වුණා. එහෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වුණා. හැබැයි, අද මේ ඉදිරිපත් කරලා තිබෙන සංවර්ධන ව්‍යාපෘති ලේඛනය දිහා බැලුවාම ගරු සභාපතිතුමනි, මම නම් නියෝජනය කරන කැලණිය කලාපය හැටියට මම නම් සෑහීමකට පත් වෙන්නේ නැහැ. සතුටු වෙන්නේ නැහැ. සංඛ්‍යා ලේඛන හැටියට ඉදිරිපත් කළොත් කැලණිය අධ්‍යාපන කලාපය සමන්විත වෙන්නේ, බියගම, මහර, වත්තල, කැලණිය කියන කොට්ඨාශ හතරකින්. මේ කොට්ඨාශ හතරටම මේ පරිපූරකයෙන් හම්බ වෙලා තිබෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 104.75 යි.

හැබැයි, උදාහරණයක් හැටියට ගත්තොත් ගරු සභාපතිතුමනි, ජයවර්ධනපුර කලාපය - අති විශාල මුදල් කන්දරාවක් ජයවර්ධනපුර කලාපයට වෙන් වෙන කොට ජයවර්ධනපුර කලාපයේ එක පාසලක් ගත්තොත් බප/මාදිවල රාහුල මහා විද්‍යාලයේ තට්ටු හතරේ ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා විතරක් රුපියල් මිලියන 130 ක් වෙන් වෙනවා. ජයවර්ධනපුර කලාපයට අති විශාල මුදලක් වෙන් වෙන කොට එක පාසලකට විතරක් රුපියල් මිලියන 130 ක් වෙන් වෙන කොට කැලණි කලාපයේ කොට්ඨාශ හතරක්, පාසල් 113 ක් සඳහා මුදල් වෙන් වෙන්නේ රුපියල් මිලියන 104.75 ක මුදලක්. මේක මොන තරම් අසාධාරණයක්ද? අසමතුලිතතාවයක්ද කියන කාරණාව මේ සභාවේ මේ වෙලාවේ මම මතක් කරන්න කැමැතියි. ඒ නිසා මේකත් යහපාලනයේ තියරියද කියලා මම අහන්න කැමැතියි. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වා, යහපාලනය නිසා මේක විවාදය කරන්න හම්බ වුණාය කියලා. මේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති වෙලා තිබෙනවාය කිව්වා. එතකොට ඒ ප්‍රජාතන්ත්‍රවාදය, ඒ යහපාලනයේ න්‍යායක්ද මේ ආකාරයෙන් මේ අසමතුලිතතාවය විධියට මුදල් වෙන් කිරීම කියන කාරණාව මම මේකේ දිගින් දිගට කියන්නේ නැහැ. ඒ වාගේ ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා. දැවැන්ත මුදල් කන්දරාවක් වෙන් කරලා. අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමාට, අමාත්‍යතුමන්ලාට අනිවාර්යයෙන්ම විශාල මුදලක්, වැඩි මුදලක් වෙන් කර ගන්න ඕනෑ. ඒකට අපේ අහිතකුත් නැහැ ඊර්ෂ්‍යාවකුත්

නැහැ. කිසි ගැටළුවක් නැහැ. ඉතිහාසයේත් එහෙම වෙලා තිබෙනවා. අදත් ඒක වෙලා තිබෙනවා. හැබැයි, එහෙම වෙද්දී යම් හෝ මට්ටමක සාධාරණයක් සිද්ධ වෙන්නට ඕනෑ. තවදුරටත් කැලණිය කලාපයේ කිව්වොත් මහර කොට්ඨාශයට මිලියන පහයි. වත්තල කොට්ඨාශයට මිලියන 10.5 යි. සිරිකමල් මන්ත්‍රීතුමා කොපමණ උඩ දා ගෙන කෑ ගැහුවත්. බියගම කොට්ඨාශයට මිලියන 27 යි. හැබැයි, ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා නියෝජනය කරන කැලණිය කොට්ඨාශයට නම් දෙයියන්ගේ පිහිටෙන් මිලියන 62.25 ක් වෙන් වෙලා තිබෙනවා. ඒ නිසාම තමයි අර කිව්වේ, එක එක මන්ත්‍රීවරු වැඩියෙන් මුදල් හම්බ වුණු අය ඒ ආකාරයෙන් තමයි - මේ එතුමා නියෝජනය කරන කැලණිය කොට්ඨාශය. මුළු කැලණිය කලාපයටම වෙන් වුණු මුදලෙන් 50% කට වැඩි මුදලක් කැලණිය කොට්ඨාශයේ එතුමා නියෝජනය කරන පාසල් සඳහා වෙන් කර ගෙන තිබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා ප්‍රධාන ඇමතිතුමා, ප්‍රධාන ලේකම්තුමා ප්‍රධාන මුළු පළාත් සභාවේ සමස්ත ප්‍රධාන විධායක නිලධාරීන් එක්ක ගම්පහ දිස්ත්‍රික්කයේ සියලු මන්ත්‍රී මණ්ඩලයත් එක්ක අමාත්‍ය මණ්ඩලයත් එක්ක පසුගිය වසරේ ප්‍රගති සමාලෝචන රැස්වීමක් තිබුණා මීනුවන්ගොඩ අධ්‍යාපන කලාප කාර්යාලයේ. ඒ වෙලාවේ ප්‍රදේශයේ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කිරීමේදී මම වීඩියෝ ක්ලිප් එකක් සහිතව කැලණිය අධ්‍යාපන කලාපයේ නිලධාරීන් පෙළෙන අපහසුතාවය පිළිබඳව, කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩකඩ මදි කම පිළිබඳව වීඩියෝ ක්ලිප් එකක් ප්‍රදර්ශනය කරලා අඩු ගණනේ නිලධාරියෙකුට මේසයක් අතරින් යන්න ඉඩක් නැහැ. විශාල අපහසුතාවයකින් කැලණිය කලාපයේ නිලධාරීන් සේවය කරන්නේ. සමස්ත අධ්‍යාපන පද්ධතියේ ඉන්න නිලධාරීන් වෙනුවෙන් ක්‍රියාත්මක වන කැලණිය කලාපයේ ඉඩ මදි කම පිළිබඳව වීඩියෝ ක්ලිප් එකකින් එදා ඉදිරිපත් කළා. එදා ප්‍රධාන අමාත්‍යතුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා, ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලු දෙනාම පිළිගත්තා කැලණිය අධ්‍යාපන කලාපයේ මේ තිබෙන අඩුපාඩු සකසන්න ඕනෑය කියලා. දැන් ඔය කියන විධියට ව්‍යූහ කමිටුවෙන් යෝජනා කරලා, මේ අදාළ තැන්වලට යොමු කරලා තිබෙනවා. කැලණිය අධ්‍යාපන කලාපයේ අලුතෙන් ගෙන යන්න යන ගොඩනැඟිල්ලේ තිබෙන අඩුපාඩු ඉදි කරන්නට මිලියන 24 ක මුදලක් අවශ්‍යයි කියන කාරණාව. හැබැයි, ඒවා පිළිබඳව කිසිසේත් සැලකිල්ලක් දක්වලා නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජෝර්ජ්ට කිව්වා නම් ඉවරයි නේ?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මම හිතන්නේ, දැන් ජෝර්ජ් මන්ත්‍රීතුමාට කියන්න සිද්ධ වෙනවා. ජෝර්ජ් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලන්න සිද්ධ වෙනවා. ඒ නිසා ඒවා පිළිබඳව දැඩි අවධානය යොමු කරන්න ඕනෑය කියන කාරණාව මේ වෙලාවේ මම මතු කරනවා.

ඒ වාගේම තමයි අපේ සෞඛ්‍ය ඇමතිතුමා මෙතැන ඉන්නවා. මම එතුමාට මීට පෙරත් සඳහන් කළා. අයවැය විවාද දෙකකදී එතුමාට ඉල්ලීම් කළා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවත් අනුමත කළා. මේ වෙන කොට ගිය වසරේ ගම්පහ දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල අතරින් හොඳම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හැටියට බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ යෝජනාවක් අනුව අවුරුදු ගණනාවක ඉඳගෙන අයවැය විවාද දෙකකදී මාතෘ හා ළමා සායන ගොඩනැගිල්ලක් ඉදි කරන ලෙස ප්‍රතිපාදන ඉල්ලුවා. ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ ඉල්ලුවා. ලොකු මුදලක් නොවෙයි. රුපියල් මිලියන පහයි ගණනක මුදලක් ඉල්ලලා තිබුණේ. ඒ නිසා මම කනගාටු වෙනවා. අති විශාල මුදලක් සෞඛ්‍යයටත් වැය කරද්දී ඒ වාගේ යෝජනා පිළිබඳව සලකා නොතිබීම පිළිබඳව. ඒ නිසා ගරු සභාපතිතුමා මාර්ගයෙන් සෞඛ්‍ය ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේ යෝජනා පිළිබඳව අවධානය යොමු කරන්නය කියලා. ඒ වාගේම අනෙකුත් අසමතුලිතතා තිබෙන තැන් පිළිබඳව අවධානය යොමු කරලා, අද කඩිමුඩියේ මේ පරිපූරකය සම්මත කර ගන්නේ නැතිව, අපි ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ යම් අනෙකුත් ස්ථානවලටත් යම් සාධාරණයක් ඉෂ්ට වන ආකාරයේ නැවත යෝජනා ලබා ගෙන මේ පරිපූරක සම්මත කරන්නය කියන කාරණාව.

[ ගරු ගුණසිරි ජයනාත් ]

ඊළඟට ගරු සභාපතිතුමනි, මම මතු කරන්න කැමැතියි. මම දන්නේ නැහැ, කොපමණ දුරට මම මේ කියන කාරණාව ප්‍රායෝගිකද කියලා. මේ පරිපූරකය හරහා අති විශාල මුදලක් ඉදි කිරීම් සඳහා වෙන් වෙලා තිබෙන්නේ. අපේ ඉංජිනේරු කාර්යාංශයේ Capacity එක කොපමණ දුරට තියෙයිද කියන එක මම හිතන විධියට බරපතළ ගැටළුවක් වෙයි. අමාත්‍යාංශවල වාර්ෂික අයවැයෙන් වෙන් වන මුදලුත් අවසානයේ කර ගන්න බැරි වන තත්ත්වයක් තුළ අති විශාල මුදලක් මේ ඉදිකිරීම්වලට වෙන් කරලා තිබෙන වෙලාවේ අපේ ඉංජිනේරු කාර්යාංශය ඒකට කොපමණ ශක්තිමත්ද කියන කාරණාවත් මේ වෙලාවේ මම මතක් කරන්න කැමැතියි. එහෙම නැත්නම් වාර්ෂික අයවැයේ මුදලුත් අවිච්ඡේද වෙනවා. මේ පරිපූරකයේ මුදලුත් අවිච්ඡේද වෙන තත්ත්වයට පත් වෙන්නට පුළුවන්. ඒවා පිළිබඳවත් අවධානය යොමු කරන්නය කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඉතාම සතුටු වෙනවා මේ මුදල වෙන් කිරීම ගැන. දැන් අපේ කිදෙල්පිටිය මන්ත්‍රීතුමා කිව්වා, එක එක කොට්ඨාශවලට වැඩියෙන් වෙන් වෙලා තිබෙන අය ඒවාට කථා කරනවාය කියලා. නමුත් ජා ඇළ ආසනය ගත්තොත් මිලියන 20 කට අඩු මුදල් ප්‍රමාණයක් තමයි වෙන් වෙලා තිබෙන්නේ. අපේ තිබෙන ආසනයට, කොට්ඨාශයට මුදල් වෙන් නොවුණත් අපේ බස්නාහිර පළාතේ දරුවන්ගේ අනාගතය වෙන්නේ, දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් මිලියන 1996 ක් වෙන් කිරීම ගැන ඉතාම සතුටු වෙනවා. මොකද, රටේ අනාගතය කියන්නේ දරුවෝ. අද පාසල්වලට ගියාම ගොඩක්ම තිබෙන්නේ භාගයට හැදුනු ගොඩනැගිලි. ඉතින් මේවා ඉවර කරන්න මුදල් වෙන් කිරීම ගැන සතුටු වෙනවා. මොකද, අපි හිතනවා නම් ඡන්දය ගන්න නම් බිල්ඩින් හදන්න ඕනෑ. වැඩ කරන්න ඕනෑ කියලා. ඒ සඳහා අපේ කොට්ඨාශයට වෙන් වුණේ නැහැයි කියලා. අපි ඒ ගැන වෛරයක් ඇති වෙනවා නම් ඒක සම්පූර්ණ බොරුවක්. මේ මැතිවරණ කිහිපය තුළම ඒකේ ප්‍රතිඵලය අපට පෙන්වලා තිබෙනවා. නමුත් පොඩි හරි සංශෝධනයක් විය යුතු නම් විය යුතුයි. අත්‍යවශ්‍යම ගොඩනැගිලි කොහේද? අත්‍යවශ්‍යම දේවල් කොහේද කියන එක බලලා ඒ අත්‍යවශ්‍ය තැන්වලට මුදල් දැමීම ඉතාම සුදුසුයි. හැබැයි, මුදල් කොටසක් තිබිලා, අපට හදිස්සියක් වුණු වෙලාවට කොටසක් තිබිලා කොටසක් අරගෙන මෙවැනි විනිවිදභාවයකින් - ඒ කියන්නේ, අපි දැන් කැමැත්ත පළ කරන්නේ, අපි දන්නවා මුදල් වෙන් වෙලා තිබෙන්නේ මෙන්න මේකට. මේක කෙරෙන්නේ කියලා. ඒ ගැන අපි සතුටු වෙනවා. මොකද, ඇත්තටම අධ්‍යාපනය අත්‍යවශ්‍යයි. ඒක අපි නිතරම කථා කරලා තිබෙනවා. එහෙම වෙන් කිරීම ගැන ඉතාම සතුටු වෙනවා. ඒ වාගේම රටේ අපි දැන් නිතරම කථා කරනවා. කෘෂිකර්මයට මුදල් වෙන් කරලා තිබෙන්නේ ඉතාම අඩුවෙන්. මිලියන 153 යි. නමුත් මේකට තවත් වැඩිපුර කොටසක් වෙන් කළා නම් තවත් වැඩ කරන්න පුළුවන්. ඒ අඩුපාඩු, තවත් කළ යුතුම තැන් තිබෙනවා නම් තව මුදල් ටිකක් අරගෙන ඔය උවමනායි කියන, අවශ්‍යයි කියන තැන්වලට ලබා දෙන්නය කියලා අපි යෝජනා කරනවා. (බාධා කිරීම්) එතුමා හැම කෙනෙකුටම බෙදනවා. ඇහුම්කන් දෙනවා. ඉතාම සුළු මුදලක් ජා ඇළට වෙන් වෙලා තිබෙන්නේ. නමුත් අපි මේකට සතුටු වෙනවා. ජා ඇළට වෙන් නොවුණත් අපට ඕනෑ කොහෙන් හරි මුදලක් වෙන් කරලා රටේ ජනතාව වෙනුවෙන් වැඩ කරනවා නම් ඒක තමයි අපේ අවශ්‍යතාවය. අපේ කොට්ඨාශයට වෙන් නොවුණාට අපට ප්‍රශ්නයක් නැහැ. අපි විරුද්ධ නැහැ. සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. අපට අවශ්‍ය කොහොම හරි අපේ දරුවෝ තැන් තැන්වල අධ්‍යාපනය ලබන්නේ. හරියට ගොඩනැගිලි නැහැ. ඒ නිසා ඒකට මුදල් වෙන් කරලා (බාධා කිරීම්) මේ කට්ටිය කඩාකප්පල් කරලා පුරුද්දක් නැහැ. අපි නවක මන්ත්‍රීවරු හින්දා මෙහෙම කෑ ගහන කොට කථා කරලා - පළපුරුදු මන්ත්‍රීවරුන්ට එහෙම කථා කරලා පුරුද්දක් තිබුණාට. එහෙම නම් මම නතර කරන්නම්. ඕගොල්ලන් කථා කරන්න.

ඇත්තටම අවස්ථාවක් ලැබීම ගැන සතුටු වෙනවා. අපි මහ ඇමතිතුමාටත් අනෙක් කැබිනට් ඇමතිවරුන්ටත් මේ මුදල වෙන් කරලා හරියටම - අනික සතුටුයි. වසර මුල. අපට හැමදාම තිබෙන ගැටළුව. වසර අවසානයේ මුදල් වෙන් කළාට වැඩ කරන්න කාලයක් නැහැ. ඇත්තටම නිලධාරීන් අඩුයි. මේවා වෙන් කර ගන්න අමාරුයි. හැබැයි, වසර මුල මේ මුදල වෙන් කිරීම ගැන සතුටු වෙනවා. මොකද, ටික කාලයක් තිබෙනවා වැඩ කරන්න. නැත්නම් හැමදාම අනික් පැත්තට සල්ලි ටික යනවා. වැඩ කර ගන්න බැරිව.

හදිසියේ මාස දෙකෙන් වැඩ ටික කරන්න ඕනෑ. මුලදී වෙන් කරලා වැඩ කිරීම ගැනත් සතුටු වෙනවා. මුලදී වෙන් කිරීම ගැන සම්පූර්ණ සහයෝගය දෙනවා. සංශෝධන සහිතව. අපේ කොට්ඨාශවලටත්, අනෙක් අයටත්, නොලැබුණු අයටත් බලලා, අත්‍යවශ්‍ය අයට ප්‍රමුඛතාවයක් දීලා සම්මත කරන්න සහයෝගය ලබා දෙන බව පවසනවා. බොහොම ස්තූතියි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, බොහොම ස්තූතියි. ඇත්තටම පළාතේ අධ්‍යාපනය වළපල්ලට යමින් තිබෙන මොහොතක මේ පරිපූරක ඇස්තමේන්තුව දැමීම පිළිබඳව මම ස්තූතිවන්ත වෙනවා. එක. ඒ එක්කම මම හිතන්නේ, මේ සල්ලි වෙන් වුණු එකේ විෂමතා තිබෙනවා. ඒ සම්බන්ධව පොඩි කනගාටුවකුත් තිබෙනවා. දැන් මගේ ගමේ ඉස්කෝලේ ගත්තාම ඉවර කරන්න මිලියන 26 ක් දාලා එවලා තිබුණා. හැබැයි, 08 යි තිබෙන්නේ. අලුතින් පටන් ගන්න ඒවාට මිලියන හැට හැත්තෑව තිබෙනවා. ඉතින් මම ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒකත් කර දෙන්න. ඒ වාගේම දැන් මේ එක එක්කෙනා තම තමන්ගේ ප්‍රදේශවල පාසල් හදාගන්න, මුල් ගල තියපු ගොඩනැගිලිවල කොටසක් ඉවර කරන කොට තවත් සමහර පාසල් තිබෙනවා, ගස් යට පන්ති කාමර තිබෙනවා. ඒවායේ බිල්ඩිමක් හදන්න පටන් අරගෙනවත් නැහැ. මම හිතන්නේ ව්‍යූහ කමිටුවෙන් ඒවත් ආවා නම් හොඳයි කියලා මම විශ්වාස කරනවා. අර අපේ ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ. ඒ වාගේම මේ අපේ ගරු මහ ඇමතිතුමා හිතනවාද දන්නේ නැහැ, මේ අධ්‍යාපනය කියන්නේ බිල්ඩින් හදලා, පන්ති කාමර හැදුවාම අධ්‍යාපනය කියලා. නැහැ. මම හිතන්නේ දැනුම, ආකල්ප, කුසලතා කියනවා නම්, අධ්‍යාපනයේ මේ කුසලතා සංවර්ධය කර ගන්න, ක්‍රීඩාව සංවර්ධනය කරගන්න මොන විධියකින්වත් මේ මහරගම ඒ ජයවර්ධනපුර කොට්ඨාශය අරුණකොට අනික් කලාපවල අය සෙල්ලම් කරන්නේ නැහැ. බස්නාහිර පළාතේ. ඒවාට ක්‍රීඩාවට වෙන් වෙලා නැහැ. ඒ නිසා මම ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ ක්‍රීඩාව තමයි දරුවෙකුට අධ්‍යාපනයට ඉස්සෙල්ලා දෙන්න ඕනෑ. ඔක්කොමලා දොස්තරලා කරන්න බැහැ. අද කොල්ලෝ නැහැ. කොලු භාගේ ඉන්නේ. ඇයි ක්‍රීඩාවක් නැහැ. පහේ පන්තියේ ශිෂ්‍යත්වයේ සිට O/L දක්වා පොතක් පස්සේ එළවනවා. O/L Fail වුණාම, Pass වුණාම, ඊට පස්සේ දරුවෝ නැහැ. ඒ නිසා මම හිතන්නේ ක්‍රීඩාවට වැඩි ප්‍රමුඛත්වයක් දෙන්න. මම හිතන්නේ මේ පරිපූරක ඇස්තමේන්තුවෙන් මිලියන 500 ක් දෙනවා නේ. ඒ මිලියන 500 න්වත් වෙන්න කරන්න. මොකද, පාසල් තිබෙනවා, යගුලියක් නැහැ. කව පෙත්තක් නැහැ. හෙල්ලක් නැහැ. එහෙම තැන්වලට ඒ බඩු බාහිරාදිය දීලා ඒ ක්‍රීඩාව පැත්තත් දියුණු කරන්න. ඒ වාගේම මම හිතන්නේ පන්ති කාමර ටික හැදුවාට පස්සේ ගරු සභාපතිතුමනි, මේ විශාල පන්ති කාමර හදනවා. බිල්ඩින්. මේවායේ ඩෙස් පුටු කෝ? අධ්‍යාපනය කරන්න උපකරණ කෝ? මම හිතන්නේ ඒවත් යම් ප්‍රමාණයක් මේ වෙන් කරන්න කියලා අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ එක්කම සෞඛ්‍ය ඇමතිතුමා ඉන්නවා. සෞඛ්‍ය ඇමතිතුමාට මිලියන හත්සිය ගණනක් වෙන් වෙද්දී අපේ මීගමුව මහ රෝහලට මැරෙන්න ඕනෑ නම් තමයි එක්කෙනෙක් යන්න ඕනෑ. එහෙම සංකල්පයක් තිබෙන්නේ. එහෙම ආකල්පයක් තිබෙන්නේ. මේ ළඟදී අපේ යාළුවෙක් මැරිලා අපේ සේපාල මන්ත්‍රීතුමා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්. මම ගිහිල්ලා එන කොට තවත් මිනියක් ගෙනාවා. මිනිය ගෙනාවාට අර කොරිඩෝ එකෙන් ඇවිල්ලා මෝචරියයි බිල්ඩිමයි අතර ගල් කැඩිලා තිබෙන්නේ. එතැනින් යන කොට මිනිය වැටුණා. අර ට්‍රොලියෙන්. මිනිය වැටුනා බිමට. තල්ලු කරද්දී.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පණ ආවද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

පණ ආවේ නැහැ. මිනිය වැටුණා. මිනිය වැටිලා පස්සේ අර නෑදැයෝ කෑ ගහනවා. පස්සේ අර සේවකයෝ දෙන්නා ආයෙත් මිනිය ඇතුළට අරගෙන ගියා. මම හිතන්නේ සෞඛ්‍ය ඇමතිතුමනි, සොයා බලන්න. ඊළඟට මීගමුව මහ රෝහලේ මෘත ශරීරාගාරයක් නැහැ. ඒකේ තිබෙන්නේ, cool room එකක් ගෙනැල්ලා තියලා තිබෙනවා. මම හිතන්නේ මිලියන 40, 50 ක් යන්නේ. වැඩිය යන්නේ නැහැ. ඒකට මූලික ප්‍රමුඛත්වයක් දෙන්න ඕනෑ. කාණු පද්ධතිය හදන්න ලක්ෂ 120 ක්, මිලියන 12 ක් දාලා තිබෙනවා. ස්තූතිවන්ත වෙනවා. ඊට ඉස්සෙල්ලා මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයක් අපට හදා දෙන්න කියන ඒ ඉල්ලීම කරමින්, මේක හොඳ වැඩක්. මේකට අපේ සහයෝගය ලැබෙනවා . ස්තූතියි.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, පරිපූරක අයවැයට අදහසක් දක්වන්න පෙර මට පොඩි අදහසක් දක්වන්න තිබෙනවා. ගරු සභාපතිතුමනි, උදේ මම එනකොට වාහනයක් පිටිපස්සෙන් ඇවිල්ලා මගේ වාහනයේ හැප්පුනා. ඒ නිසා මට වෙලාවට එන්න බැරි වුණා. මගේ පෞද්ගලික පැහැදිලි කිරීමක් තිබුණා, ගියවර පරිපූරකය සම්බන්ධයෙන්. ඒ ගැන මම වචනයක් කියලා මම වෙලාව ගන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම්වලට මට දෙන්න බැහැ . මේ වෙලාවේ දෙන්න බැහැ. ඔබතුමා මේකට කථා කරන්න.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, අත්තනගල්ල රංග ශාලාවක් හදන්න අපේ ගරු මහ ඇමතිතුමා මිලියන 50 ක් දුන්නා. ගියවර පරිපූරකයෙන්. ඒක එතුමා වාහනයෙන් ගිහිල්ලා, එතුමා බස්සලා, ඒක පෙන්නලා ෆොටෝ ටික ගහලා තමයි සල්ලි ටික ගත්තේ. එතුමා හැදුවා. අපේ නමක්වත් නැහැ. මම කනගාටු වෙනවා. ඒ ගැන දැනුවත් කළා. හැබැයි මම මේ පරිපූරක වෙලාවේදී කියනවා. ඒක පළාත් සභාවට පවරාගන්න උත්සාහ කරනවා. ඒකට විරුද්ධතාවය දක්වලා තමයි මම මේ පරිපූරකයට අදහස් දක්වන්නේ. ඒ නිසා ඒ ගැන දිගට කථා කරන්නේ නැහැ. ප්‍රාදේශීය සභාව සතු ගොඩනැගිල්ලක්. මම සභාපති කාලේ ඒක පවරා ගත්තා සභාවට. ඒක පළාත් සභාව පවරා ගැනීමක් තිබෙනවා නම් ඒක නවත්වන්න කියලා මම යෝජනා කරනවා.

මම ආයතනයක හිටිය ප්‍රධානියෙක් වශයෙන් මම මේ ස්ථිර තැන්පතු ගන්නවාට පෞද්ගලිකව විරුද්ධ කෙනෙක්. හැබැයි මේකට යම් හෝ වචනයක් කථා කරන්න පෙර මම සියලුම නිලධාරීන් එක්ක යම් යම් අවස්ථාවලදී කථා බහ කර ගත්තා. ස්ථිර තැන්පතු මුදල මේ ආකාරයෙන් ගන්න කොට තිබෙන - මොකද ආයතනයේ තිබෙන වටිනාකම තමයි ස්ථිර තැන්පතු. සභාවක් පත් වෙන කොට, සභාවකට මහ ඇමතිවරයෙක් පත් වෙන කොට අමාත්‍ය මණ්ඩලයක් පත් වෙන කොට ඒ ස්ථිර තැන්පතු ඉතා වැදගත් තැනක් ගන්නවා. ඒ වාගේම තමයි නිලධාරීන්ට ඒ හා බැඳීමක් තිබෙනවා. අර කිව්වා වාගේ රජයේ ප්‍රදාන, පඩිනඩි ගෙවීම්, ආපදා තත්ත්වයක් ඇති වුණාම මේ මුදල් තමයි අපට පාලනය කරන්න වෙන්නේ. නමුත් අපි අත්‍යාවශ්‍ය කාරණයකට මුදල් ගන්නා එක සම්බන්ධයෙන් අපි විරෝධතාවයක් දක්වන්නේ නැහැ. ඒ නිසා විශේෂයෙන් රටක සෞඛ්‍ය, රටක අධ්‍යාපනය වෙනුවෙන් විරුද්ධව කථා කරන්න අපි කොහෙත්ම සුදුසු අය නොවෙයි. අපි ඒවාට පක්ෂ වෙන්න ඕනෑ. රටේ සෞඛ්‍ය වෙනුවෙන් යමක් වෙනවා නම්, අධ්‍යාපනය වෙනුවෙන් යමක් වෙනවා නම් අපි ඒවාට එකඟතාවය දක්වන්න ඕනෑ. හැබැයි, මේ පරිපූරක යෝජනා හරහා තිබෙනවා, තට්ටු හතර පහේ ගොඩනැගිලි හදන්න. පාසලක තට්ටු හතරේ ගොඩනැගිල්ලක් හදන කොට - මම ඊයේ පෙරෙයිදා දවසක ඉස්කෝලයකට ගියා. ඉස්කෝලේ තිබෙන්නේ තට්ටු තුනේ ගොඩනැගිල්ලක්. ගුරුවරු ගණනාවක් මම ළඟට ඇවිල්ලා කිව්වා, අනේ මන්ත්‍රීතුමා පල්ලෙහායින් පන්ති කාමරයක් හදලා දෙන්න. උඩ පන්තියේ ඉන්න ළමයින් පල්ලෙහාට ගේන්න. අපට දණහිස් අමාරුව තිබෙනවා. අපිට කොන්දේ අමාරුව තිබෙනවා. අපට දියවැඩියාව. අපට ප්‍රෙෂර් එක. අපට උඩ නගින්න පුළුවන්කමක් නැහැ. අර තුන් වැනි තට්ටුවේ ඉන්න ළමයින් ටික පල්ළෙහාට ගෙනැල්ලා උගන්වන්න තාවකාලික පන්ති කාමරයක් හදන්න ඔබතුමා තඟඩු ටිකක් හරි අරන් දෙන්නය කියලා. ඒ නිසා කාලීන වශයෙන් වැදගත් තමයි තට්ටු හතර පහ තිබෙන කොට. ඒකට යම්කිසි ජනප්‍රියතාවයකුත් ලැබෙයි. ගොඩනැගිල්ල ඒ ගැන ලොකු අලංකාරයකුත් ලැබෙයි. නමුත් රටේ අවශ්‍යතාවය එය නොවන බව මම මේ සභාවට කියන්න ඕනෑ.

ඒ වාගේම තමයි විශේෂයෙන් මම අවස්ථා ගණනකදීම මේ පළාත් සභාවට ඇවිල්ලා අපේ අර ජයනාත් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මමත් ෆොටෝ ගණනාවක් ගහගෙන ඇවිල්ලා, ඒක CD එකට ගහගෙන ඇවිල්ලා පෙන්නලා සංඝබෝධි විද්‍යාලයේ තිබෙන තත්ත්වය පෙන්නුවා. අත්තනගල්ල ආසනය පිළිබඳව අද අපට ගැටලුවක් නැත්තේ අත්තනගල්ල පන්නිල නායක හාමුදුරුවෝ දෙමහල් ගොඩනැගිලි 13 ක් හදලා අද අත්තනගල්ල අධ්‍යාපනයට පිරිනමලා තිබෙන හින්දා. හැබැයි, සංඝබෝධි විද්‍යාලය ඒ ප්‍රදේශයේ ප්‍රමුඛ පාසල. ඒක තමයි ජාතික පාසල කරන්න උත්සාහ කරන්නේ. ඒ පාසලේ අදටත් ටකරන් ගහපු හෝල් දෙකක් තිබෙනවා.

පන්ති කාමර AC කරලා, පන්ති කාමරවල Fan දාලා උගන්වන කාලයේ, ටයිල් කරලා උගන්වන කාලයේ සංඝබෝධි විද්‍යාලයේ දරුවෝ ඉන්නේ ටකරන් හෝල්වල. දෙමව්පියන් 3000 ක් ඉන්න මේ සංඝබෝධි පාසලට ශාලාවක් නැහැ. දෙමව්පියන් 300 ක් විතර පමණයි රැස් කරගන්න පුළුවන්කම ලැබෙන්නේ. වැසිකිළි පහසුකම් නැති පාසල් කොපමණ අත්තනගල්ල ආසනයේ තිබෙනවාද? දරුවෝ කැන්ටිම කියලා 10, 11 ට ගියාම පිගාන බිම තියාගෙන පාන් කැල්ල හොදිවල ඔබාගෙන කනවා තමයි දකින්න තිබෙන්නේ. ඒ නිසා මේ පරිපූරකයෙන් අවශ්‍යතා අපි හඳුනාගන්නට ඕනෑ. කැන්ටිමේ අවශ්‍යතාවය. ක්‍රීඩා පිටියේ අවශ්‍යතාවය. පන්ති කාමරයේ අවශ්‍යතාවය. දරුවෝ 35 ක් කරන කොට" 45 පන්ති කාමරයේ හිටපු දරුවෝ 35 ක් වෙන කොට නාගරික පාසල්වලට පන්ති කාමරයක අවශ්‍යතාවයක් ඇති වුණාම පන්ති කාමරයක් හදන්න සල්ලි වෙන් කරලා නැහැ. ඒකට ඩෙස් පුටු ටිකක් අපි ගන්නට ඕනෑ. නව පන්ති කාමර ඇති වෙන්නට ඕනෑ. මේවාගේ කාරණා දිහාත් අපි අවධානය යොමු කරන්න ඕනෑය කියන එකයි මම විශ්වාස කරන්නේ.

ඒ වාගේම මේ පළාත් සභාවට ආව පළමුවැනි දවසේ සිට අධ්‍යාපන ඇමතිතුමාට මම යෝජනා ගණනාවක් ගෙනාවා. රූප සටහන් ගෙනාවා. ව්‍යාපෘති වාර්තා ගණනාවක් ලියලා එතුමාට දුන්නා. එතුමාට නම කියන කොටත් මතක් වෙයි, මම කියන්නේ මොකක්ද කියන එක. අත්තනගල්ල ආසනයේ - ඉඩම් කට්ටි වෙන කොට ප්‍රදේශයේ ජනගහණය වැඩි වෙන කොට, අද පන්ති කාමරයේ 35 වෙන කොට,පාසලේ පන්ති කාමරයක් ඇති නොවෙන කොට පුංචි හරි පාසලක් ප්‍රදේශයේ ආරම්භ කරන්න අපි ලොකු උත්සාහයක් ගත්තා. ඒ වෙනුවෙන් මේ ව්‍යූහ කමිටුවේ අපි ඕනෑ තරම් යෝජනා කළා. උපදේශක කාරක සභාවේ ඇවිල්ලා යෝජනා කළා. ඇමතිතුමා ගිහිල්ලා ඒවා පරීක්ෂා කළා. නමුත් ඒ වෙනුවෙන් මුදලක් වෙන් වෙලා නැහැ. ඒ නිසා මම මේ පරිපූරක අයවැයට අධ්‍යාපනය වෙනුවෙන්, සෞඛ්‍ය වෙනුවෙන්, සමාජයේ යමක් වෙනවා නම් අපට ලැබෙනවාද? නොලැබෙනවාද? කියන එක නොවෙයි. අපි ඒ වෙනුවෙන් අපේ පක්ෂපාතීත්වය දක්වන්නට ඕනෑ. ඒකට අපි සහයෝගය දක්වන්න ඕනෑ. ඒ රටේ ජනතාව වෙනුවෙන්. අපේ දරුවෝ වෙනුවෙන් මේ කාරණා ඉටු වෙන්නේ. නමුත් අපටත් දරුවෝ වෙනුවෙන් යම් යම් කාරණා, අපි මේ සමාජයට ගන්න යම් යම් උත්සාහයන් ඉටු කරන්න අපි කටයුතු කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්. කථාව කෙටි කරන්න.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ඒ වාගේම අධ්‍යාපන ඇමතිතුමාට, අපේ ගරු මහ ඇමතිතුමාට මම කියන්නේ අපි පාසලට යන කොට මහින්දෝදය විද්‍යාගාරය කියලා එකක් තිබෙනවා. ඒකේ අභිමානවත් භාවයක් තිබෙනවා. ඉස්කෝලෙට හොඳ නව පෙණුමක් තිබෙනවා. පාසලේ එහෙම ගොඩනැගිල්ලක් හැදෙන්න ඕනෑ. මම මේ පරිපූරක අයවැයට යෝජනා කරනවා, පාසලට සෞන්දර්යය ඒකකයක් හදන්න. බෙර ගහන කොට අනික් පන්ති කාමරවල උගන්වන්න පුළුවන්කමක් නැහැ. ඒ දරුවන්ට නටන්න, ගයන්න හැකියාව තිබෙන තැනක් ගොඩනගන්න. පාසලේ කෙළවරට වෙන්න රුපියල් මිලියන 15 ක්, 20 ක් මුදල් වෙන් කරලා, සෞන්දර්යය ඒකකයක් හදලා දෙන්න. ඒක ඔබතුමාගේ සංකල්පයක් වශයෙන් ගේන්න. මහ ඇමතිතුමාගේ සංකල්පයක් වශයෙන් ගෙනැල්ලා පාසල් පද්ධතිය තුළට නවතාවයක් එකතු කරන්න. එතකොට අපට පුළුවන් අපේ දරුවෝ ඒ සෞන්දර්යය පැතිවලට යොමු කරන්න. ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්. කථාව කෙටි කරන්න.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මේ පරිපූරක අයවැයට සංශෝධන සහිතව අපි මහ ඇමතිතුමාට සහයෝගය ලබා දෙනවා කියලා ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, අද ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරලා තිබෙන පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳව අපේ සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා රාශියක් කථා කළා. ඒ හැම මන්ත්‍රීවරයෙක්ගෙන්ම කියැවුණු දේවල් තමයි මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා තිබෙන්නේ, මීට කලින් මේ පළාත් සභාවට පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරනකොට ක්‍රියාත්මක කරන ව්‍යාපෘති මොනවාද කියන එක ලැයිස්තුවක් සභාගත කරලා තිබුණේ නැහැ. ඒ නිසා මේ පරිපූරක ඇස්තමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන්ට හදිසියේ කෙටියෙන් හිතාගන්න පුළුවන්. සෞඛ්‍ය අමාත්‍යාංශයට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. අනික් අමාත්‍යාංශවලටත් යම් යම් මූල්‍ය ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා. මේ කථා කරපු සමහර මන්ත්‍රීතුමන්ලාගේ සියලුම කථාවලින් අදහස් වන්නේ තමන්ගේ කොට්ඨාශයට තමන්ට නියෝජනය කරන්න පුළුවන් යෝජනා ඉදිරිපත් වෙලා නැහැයි කියලා. තවත් කණ්ඩායමක් කියනවා, ව්‍යූහ කමිටුවෙන් අර ගත්තා. ව්‍යූහ කමිටුවෙන් ගෙනැල්ලා යෝජනා ඉදිරිපත් කරපු ඒවායේ අඩුවක් තිබෙනවා කියලා. අපි ඒක පිළිගන්නවා.

හැබැයි, ගරු සභාපතිතුමනි මේ ඉදිරිපත් කරලා තිබෙන පරිපූරක ඇස්තමේන්තුවේ තිබෙන්නේ බිලියන 03 යි මිලියන 35 යි 55000 ක් තිබෙනවා. එහෙමනම් මේ මන්ත්‍රීවරු 104 දෙනාගේ අදහස් අරගෙන බැලුවාම අපට පෙනීගෙන යන කාරණයක් තමයි මේ පරිපූරක ඇස්තමේන්තුව මෙපමණ ඉක්මණට ඉදිරිපත් වෙන්නේ මේ පළාත් සභාවේ කාලය ලබන අප්‍රේල් මාසයේ ඉවර වෙනවා. තව අවුරුද්දයි. මේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් හැටියට අපි ඔක්කොටම වැඩ කරන්න අවස්ථාව තිබෙන්නේ තව අවුරුද්දයි. මේ අපි පාලනය කරපු කාලයේ මේ රටේ ජනතාවගෙන් බදු අය කරගෙන, නොයෙකුත් බඩු මිල වැඩි කරලා එකතු කරගත්ත මූල්‍ය ප්‍රතිපාදනයක් අද බැංකුවේ ස්ථාවර තැන්පත් හැටියට දාලා තිබෙනවා. මිලියන 7000 කට ආසන්න මුදල් ප්‍රමාණයක්.

අපට මතකයි, එදා මේ සභාවේ ඔය වාගේ ස්ථිර තැන්පත් තිබුණු මූල්‍ය ප්‍රතිපාදනයක් එදා සභාවේ අපේ හිටපු ප්‍රධාන අමාත්‍යවරයෙකු සහ අමාත්‍යවරයෙකු හැටියට ප්‍රසන්න රණතුංග අමාත්‍යතුමා ප්‍රමුඛ බැංකුවට ගිහිල්ලා දැම්මා, මිලියන 500 ක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

5000 ක්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔව්. මිලියන 5000 ක්. මේ ප්‍රමුඛ බැංකුව අපේ, පළාත් සභාවේ ජනතාවගේ සල්ලිවලට පොලු තියලා ගියා. එතකොට PRD එකේ සල්ලිත් දාලා තිබුණා. එහෙමනම් මේ පොලු තියලා ගිය වෙලාවේ අපි කවුරුත් කථා කරන්නේ නැහැ. මේ ජනතාවගේ සල්ලි. මේ විධියට -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, ඔය ප්‍රසන්න රණතුංග ඇමතිතුමාගේ කාල වකවාණුවේද කියලා පැහැදිලි කරගන්න අවශ්‍යයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අමාත්‍ය -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මේ කියන කාලවකවාණුව ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමාගේ කාලපරිච්ඡේදයේ ද කියලා පැහැදිලි කරගන්න අවශ්‍යයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

PRD එකේ සල්ලි දාලා තිබුණේ එතුමාගේ කාලපරිච්ඡේදය තුළ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කරන ප්‍රකාශය හරියට කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මම කියන ප්‍රකාශය හරියටම හරි. PRD එකේ සල්ලි දාලා තිබුණා, ප්‍රමුඛ බැංකුවට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉලක්කම් ටික හරියට කියන්න. මිලියන 500 ද? 5000 ද? හරියට කියන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඔබතුමා සඳහන් කර ප්‍රධාන ඇමතිතුමාගේ -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේක ඇත්තටම රෙජිනෝල්ඩ් කුරේ ගරු ප්‍රධාන ඇමතිතුමාගේ කාලයේ, ප්‍රසන්න රණතුංග මැතිතුමා ප්‍රවාහන ඇමති කාලයේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපට කථා කරන්න ඉඩ දෙන්න කෝ. ඒ වාගේ මූල්‍ය ප්‍රතිපාදනයක් දාලා තිබෙන කොට ඔබතුමාත් මම හිතන්නේ මේ සභාවේ සිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හිටියා. හිටියා. මම හිටියා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

නිවැරැදි කළේ නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපි කථා කළාද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔබතුමා ප්‍රසන්න මහ ඇමතිතුමාගේ කාලයේ කිව්වේ. ඒක නිවැරැදි කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

PRD එකේ සල්ලි දැම්මේ ප්‍රසන්න ඇමතිතුමා ඉන්නැද්දී.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒක මහ ඇමතිතුමා නේ දාන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

PRD එකේ සල්ලි දැම්මේ ප්‍රසන්න ඇමතිතුමා සිටිද්දී.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමති කාලයේ. එහෙම කියන්න එපා. නිවැරැදි කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙම ප්‍රතිපාදනයක් නාස්ති වෙන කොට කවුරුත් ඒවට කථා කළේ නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

නැහැ. නැහැ. මහ ඇමති කාලයේ නොවෙයි. එහෙම කියන්න එපා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කවුද කිව්වේ මහ ඇමති කාලයේ කියලා. කවුද කිව්වේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කිව්වා. කිව්වා. අපට ඇහුණා. කිව්වා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඇමති කාලයේ කියලා කිව්වේ. ප්‍රධාන අමාත්‍යවරුත් සිටියා. ඇමැතිවරුත් සිටියා කියලා කිව්වේ. තමුන්නාන්සේලාට තේරෙන්නේ නැත්නම් නිකන් ඉන්න. ඊට පස්සේ ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක සංශෝධනය කරන්නම්. ඒක හදලා දාන්නම්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මේ පරිපූරක ඇස්තමේන්තුව අද ඉදිරිපත් කරන කොට -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කොමිෂන් අරන් දැම්මා නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මිලියන 3000 ක පරිපූරකයක් ඉදිරිපත් කරන කොට, අපට පැමිණි යෝජනා දිහා අරගෙන බැලුවාම, මේ ස්ථාවර තැන්පත්වල තිබෙන මිලියන 7000 ගත්තත් මේ යෝජනාවලට ප්‍රමාණවත් වෙන්නේ නැහැ. අපේ ගරු විපක්ෂ නායකතුමා අවසානයේදී ඉදිරිපත් කරයි එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම සාකච්ඡා කරලා සංශෝධනයක් පිළිබඳව යෝජනාවක් අපි එතුමාට ඉදිරිපත් කළා. ඒ අනුව අපි දැක්කා, වලල්ලාවිට ප්‍රදේශය වාගේ දුෂ්කර ප්‍රදේශයක, අගලවත්ත වාගේ ආසනයක මේ අධ්‍යාපන ඇමතිතුමා හැටියට වැඩ කටයුතු කරන එතුමා, එතුමාගේ ආසනයට දාගෙන තිබෙනවා නම් උපරිම මූල්‍ය ප්‍රතිපාදනයක්. ඒක ඉතාමත් වටිනවා. කළුතර දිස්ත්‍රික්කයේ දුෂ්කර ආසනයක් හැටියට එතුමා එහෙම දාගෙන නැහැ. අනික් පැත්තෙන් සෞඛ්‍ය ඇමතිතුමා හැටියට කළුතර දිස්ත්‍රික්කයේ - ගරු සභාපතිතුමා, සෞඛ්‍ය ඇමතිතුමා හැටියට මේකේ කළුතර දිස්ත්‍රික්කයේ රෝහල් ගණනාවක් සංවර්ධනය කරන්න මූල්‍ය ප්‍රතිපාදන දීලා තිබෙනවා. ඒ එක රෝහලක්වත් අවශ්‍ය නැති රෝහලක් නොවෙයි. තවත් අනන්ත අප්‍රමාණ රෝහල් තිබෙනවා. පාසල් තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කය තුළ සංවර්ධනය කරන්න. එහෙමනම් අපි මොකක්ද කරන්න ඕනැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව ටිකක් කෙටි කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපේ සභා කාලයත් අවසන් වෙනවා. මන්ත්‍රීවරුන්ට ආපසු මහජනතාව ළඟට ගිහිල්ලා මැතිවරණයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ප්‍රධාන අමාත්‍යතුමා ඉතාමත් හොඳ බුද්ධිමත් තීරණයක් අරගෙන තිබෙනවා. පරිපූරකය මේ මාර්තු මාසයේ ගෙනෙන්න. ඒක ඉතාමත් වැදගත් බුද්ධිමත්, ක්‍රියාශීලී, එතුමාගේ ප්‍රධාන අමාත්‍ය ධූරයේ බලතල පාවිච්චි කරලා එතුමා ඒ පිළිබඳව කටයුතු කිරීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම නිලධාරීන්ට අපි ස්තූතිවන්ත වෙනවා. මේ වාගේ ලැයිස්තුවක් මේ පළාත් සභාවේ කවදාවක්වත් ඉදිරිපත් කරලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව නතර කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙමනම් ගරු සභාපතිතුමනි, මෙවැනි දෙයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව අපි ඉල්ලීම් ගණනාවක් මහජනතාව වෙනුවෙන් ඉල්ලලා තිබෙනවා. ඒ ටික මම සභාගත කරනවා. එහෙමනම් මේ වැඩ පිළිවෙළ, මේ පරිපූරකය ඉතාමත්ම සාර්ථකව සියලු ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගයෙන් අනුමත කරගන්න ශක්තිය ලැබෙන්නය කියලා ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, මම කාරණා කිහිපයක්ම කථා කරන්න සිටියේ. කථා කරන්නේ නැහැ. මොකද, හැම කෙනාම එක හා සමාන මාතෘකා කථා කළේ. මේ වෙලාවේ මම ස්තූතිවන්ත වෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. බස්නාහිර පළාත තුළ දීර්ඝ කාලයක් තිස්සේ ඇවුණු ප්‍රශ්නයක් තමයි මේ අධ්‍යාපන ප්‍රශ්නය. මම අධ්‍යාපනය ගැන විතරයි කථා කරන්නේ. මගේ විෂයයවත් කථා කරන්නේ නැහැ. අපි දීර්ඝ කාලයක් සෑම අවුරුද්දකම කථා

කළේ අපට ව්‍යූහ කමිටුවට මුදල් එන කොට ඒවාට නම් කරලා එවලා තිබුණේ, මේ මුදල් වෙන් කරන්න පුළුවන් හැකියාව තිබෙන්නේ, නිම කළ යුතු ගොඩනැගිලි සඳහා පමණයි. අලුත් ගොඩනැගිල්ලක් හදන්න, අවුරුදු ගණනාවකින් අපට කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. අලුත් ගොඩනැගිල්ලකට කවදාවක්වත් මුදල් ටිකක් ලැබුණේ නැහැ. දැන් තමුන්නාන්සේ දන්නවා. මේ බස්නාහිර පළාත කියන්නේ ලංකාවේ තිබෙන ලොකුම පළාත් සභාව. ලොකු මිනිස්සු ඉන්න තැනක්. ලොකු දේපළක් තිබෙන තැනක්. අපේ පාසල්වල තහඩු යට දරුවෝ ඉගෙන ගන්නේ. සමහර පාසල් තිබෙනවා, දෙමව්පියෙක්ට දරුවෙක් ගිහිල්ලා ගෙදර තියලා ඉන්න පුළුන්කමක් නැහැ. ඒ තරම්ම ඉතාමත් පහත් තත්ත්වයක තිබෙනවා.

දැන් මේ කථා කරන වෙලාවේ සමහර මන්ත්‍රීවරුන්ගේ කටින් කියැවුණා, ඉදිරියේ තිබෙන මේ දේශපාලනය, මේ පළාත් සභාව අවසාන වෙලා ඊළඟ පළාත් සභා මැතිවරණයට මුහුණ දෙන්න සිද්ධ වන නිසා මේ යෝජනා ටික ආගෙන අපි වැඩ කරනවයි කියලා. අද මේ රටේ මිනිස්සු වැඩ කළයි කියලා ගරු සභාපතිතුමනි, ඡන්දය දෙන්නේ නැහැ. එහෙමනම් අපේ ගරු මහ ඇමතිතුමා කරපු වැඩවලට, ඔක්කොම පාරවල් කාපට් කරපුවට, ඒ මනුස්සයා කරපු වැඩ වලට පොහොට්ටුවට නොවෙයි පැරදුණේ. බයිසිකලේට. මේ මිනිස්සු වැඩ කළයි කියලා ඡන්දය දෙන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

මට කථා කරන්න දෙන්න. ගෙවල් හැදුවයි කියලා, නිවාස ආධාර දුන්නයි කියලා, මොන මොන ගොඩනැගිලි හැදුවයි කියලා මොන දේ දුන්නත් මිනිස්සු ඡන්දය දෙන්නේ නැහැ. ඒ නිසා ඡන්දයක් බලාගෙන කරන වැඩක් නොවෙයි. අපේ ගරු විපක්ෂ නායකතුමා දන්නවා. හෝමගම අධ්‍යාපන කලාපය තුළ ගරු සභාපතිතුමනි, පාසල් 100 ක් තිබෙනවා. මම එකඟ වෙනවා. මම හැමදාම ව්‍යූහ කමිටුවට යනවා. මෙතුමා අසනීප නොවුණා නම් හැමදාම ව්‍යූහ කමිටුවට යනවා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා හැමදාම ව්‍යූහ කමිටුවට යනවා. සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමා යනවා. ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමන්ලා යනවා. මේ සියලුම යෝජනා එච්චේ කලාප කාර්යාල යෝජනා. අපි පෞද්ගලිකව දා ගත්තේ නැහැ. අලුත් යෝජනා තුනක් දැම්මා. අලුත් යෝජනා තුනක් කියන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ වැඩිම දරුවන් ප්‍රමාණයක් ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වන ඒ පාසලට අවශ්‍යතාවයක් තිබුණා. පසුගිය කාලයේ අධ්‍යාපන ඇමතිතුමන්ලා කිව්වා, අපි ශ්‍රවණාගාර සහිත තෙමහල් ගොඩනැගිලි හදලා දෙනවා කියලා මිනිස්සුන්ව මං මුලා කළා. ඒවා ඉෂ්ට කරලා දුන්නේ නැහැ. අවශ්‍යතාවයන් මත ගොඩනැගිලි කිහිපයකට ප්‍රතිපාදන ලබා දුන්නා. ඒ නිසා අපි දන්නවා, මේවායේ අඩුපාඩු තිබෙන්න පුළුවන්. ප්‍රශ්න තිබෙන්න පුළුවන්. අද ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගත්තා වූ මේ උත්සාහය අපි අගය කළ යුතුයි. එතුමා ලක්ෂ නොවෙයි, කෝටි ගණනක් දැම්මත් තමුන්නාන්සේ දන්නවා නේ වෙච්ච දේ මොකක්ද කියලා. අවශ්‍යතාවයට පිළියමක් යෙදීම හැරෙන්න දේශපාලන වාසියක් තකා නොවෙයි කියන එක මම මේ අවස්ථාවේදී පැහැදිලිව සඳහන් කරනවා. මෙතැනදී මේ යෝජනාවට විරුද්ධව අත උස්සලා ගමට යන්න පුළුවන්ද? යන්න බැහැ. අඩුපාඩු හදා ගමු. (බාධා කිරීම්) ඉතාමත් වැදගත් වැඩක් මෙතුමා කළේ. මිලියන හත් දහස් ගණන් මේකේ තියාගෙන වැඩක් නැහැ. මට මතකයි, පළාත් සභා මේ වර්ෂයේ පිහිටවපු වෙලාවේ හිටපු ලේකම්තුමිය කිව්වා. ජයන්ති විජේතුංග මැතිනිය මගෙත් එක්ක එදා කිව්වා. එතකොට ප්‍රසන්න රණතුංග මහ ඇමති වෙලා සිටියේ. මාත් ඇමතිවරයෙක්. හැබැයි, ප්‍රසන්න ඇමතිතුමා වැඩිකල් යන්න ඉස්සෙල්ලා, අපේ පළාත් සභාවේ තිබෙන සල්ලිවලටත් මධ්‍යම ආණ්ඩුව වැඩක් දෙනවා කියන එක මට කිව්වා. ඒ නිසා ඊට ඉස්සෙල්ලා මේ කටයුත්ත කිරීම පිළිබඳව ගරු මහ ඇමතිතුමාට මම ස්තූතිවන්ත වෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

එහෙම වෙන්නේ නැහැ, ඇමතිතුමා. යහපාලනය එහෙම කරන්නේ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, කාලයකට පස්සේ තමයි වචන කිහිපයක් හරි ප්‍රකාශ කරන්න තීන්දු කළේ. අපි දන්නවා, මේ පරිපූරක ඇස්තමේන්තුව වෙනුවෙන් අද මෙතැන තිබුණු සාකච්ඡා මම ඉතාමත් සාධාරණව අසාගෙන සිටියා. කොයි

[ ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා ]

මන්ත්‍රීවරයාවත් මේක එපැයි කියලා කිව්වේ නැහැ. හැබැයි කිහිප දෙනෙක් කිව්වා, මේක පස්සට දා ගමු. ලබන මාසයට දා ගමු. එහෙම නැත්නම් අනික් සියලුම ගරු මන්ත්‍රීවරු කිව්වේ, උත්සාහයක් අපි අර ගන්නවා. මේ වැඩේ ක්‍රියාත්මක කරන්නය කියලා. ඒ නිසා ගරු මහ ඇමතිතුමා මේ තත්ත්වය - මේකේ හෝමගමත් තිබෙනවා. නමුත් හෝමගම මම නොගියත් මම මේ පිළිබඳව ඉල්ලන්නෙත් නැහැ. නමුත් යම්කිසි මන්ත්‍රීවරයෙකුට අසාධාරණයක් වෙනවා නම්, ඒ ඔහුගේ දේශපාලන දිවියට යම්කිසි අකටයුත්තක් වෙනවා නම් ඒක නිවැරැදි කරගන්න ඕනෑ. මේ පිළිබඳව මම සහ අපි කිහිප දෙනෙක් ගිහිල්ලා මහ ඇමතිතුමාත් එක්ක කථා කළා. මහ ඇමැතිතුමා මේ කාරණයේ දී මතක් කළේ ව්‍යූහ කමිටුව හරහා තමයි මේ යෝජනා හුහක් ගත්තේ කියලා. ව්‍යූහ කමිටුවට අමතරවත් යම්කිසි යෝජනා ගණනාවක් ඇවිල්ලා තිබෙනවා.

ඒ නිසා මම ඉතාමත්ම කෙටියෙන් මතක් කරනවා නම් මතක් කරන්නේ වෙන මොකුත් නොවෙයි. මෙතැන තිබෙන අඩුපාඩු පිළිබඳව ගරු මන්ත්‍රීවරු මතක් කළා. ඒ අඩුපාඩු නිවැරැදි වෙන්නට ඕනෑ. එහෙම නිවැරැදි වුණොත් තමයි මේ තත්ත්වය නිවැරැදිවම ඉස්සරහාට ගලාගෙන යන්නේ. එහෙම නැතිව මෙච්චර මුදලක් දාලා මේක අවුරුද්ද අන්තිමට ගියාම අර මන්ත්‍රීවරු මතක් කළා වාගේ මේකෙත් වැඩේ කෙරුණේ නැහැයි කියලා තමයි අන්තිමට චෝදනාව එන්නේ. ඒ නිසා මම ඉතාම කෙටියෙන් මතක් කරනවා. මේ තිබෙන අඩුපාඩුකම් ටික සකස් කරගන්න. තවත් මිලියන 1000 ක් හෝ 750 ක් මේකට එකතු කරගනිමින් මේ ගරු මන්ත්‍රීවරුන්ගේ තිබෙන යෝජනා සියල්ල භාර අරගෙන කටයුතු කරන්නය කියන එක ඉල්ලා සිටිමින්, සියලු දෙනාටම මේ ලැබෙන්න මේ ලිපිය සභාගත කරමින්, සියලු දෙනාටම මේකෙන් ශක්තියක් ධෛර්යයක් තමුන්නාන්සේලාට ලබා ගන්න හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට පුළුවන් නම් යෝජනාව කියවන්න. පොඩ්ඩක් කියවලා සභාගත කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

*2018.03.20*

*ගරු සභාපතිතුමා,*
*බස්නාහිර පළාත් සභාව.*

*පරිපූරක ඇස්තමේන්තුව 01 – 2018*

*අද දින පළාත් සභා න්‍යාය පත්‍රය සමග ඉදිරිපත් කර ඇති පරිපූරක ඇස්තමේන්තුව සඳහා අතුරු යෝජනාවක් වශයෙන් පරිපූරක ඇස්තමේන්තුවේ දක්වා ඇති රුපියල් මිලියන 3035/- ක ප්‍රතිපාදන වලට අමතරව රුපියල් මිලියන 750 ක අමතර මුදලක් පරිපූරක ඇස්තමේන්තුවට අමතරව එකතු කර සම්මත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත්, එම ප්‍රතිපාදන සඳහා අමතර යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙමින් එම අමතර ප්‍රතිපාදන අනුමත කර දෙන ලෙසත් යෝජනා කරන අතර ඒ අනුව අවශ්‍ය කටයුතු කර දෙන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.*

*ස්තුතියි.*
*මීට - හිතවත්,*

*මංජු ශ්‍රී අරංගල.*
*විපක්ෂ නායක (බ.ප)*

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, පරිපූරක ඇස්තමේන්තුව වෙනුවෙන් අදහස් දක්වපු ගරු මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම කරුණු අවබෝධයක් නැතිව අපව, විශේෂයෙන්ම මාව විවේචනය කිරීම පිළිබඳව මම ඉතාමත්ම කනගාටුවට පත් වෙනවා. පළමුවෙන්ම ගරු විපක්ෂ නායකතුමා අද උදෑසන මේ විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම මාව මුණගැසිලා මේ කාරණාව සාකච්ඡා කළා. ඒ වාගේම අපේ සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාත් මේ කාරණාව සම්බන්ධයෙන් මාත් සමග සාකච්ඡා කළා. ඒ දෙගොල්ලන්ගේම අදහස වුණේ, මේ යම් අසාධාරණයක්

වෙලා තිබෙන අයට, කොට්ඨාශවලට සාධාරණයක් ඉෂ්ට කරන්න ඕනෑය කියලා. ඒ අනුව ගරු විපක්ෂ නායකතුමා ඇතුළු මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන් කරන යෝජනාව පළාතේ මුදල් ඇමතිවරයා හැටියට පළමුවෙන්ම පිළිගන්නා බව මම මේ සභාවට ප්‍රකාශ කරන්න කැමැතියි.

විශේෂයෙන්ම මම කනගාටු වෙනවා. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා සාමාන්‍යයෙන් මේ සභාවේ ප්‍රශ්නයක් ඇති වුණාම, එතුමාට අසාධාරණයක් වුණාම එතුමා මාත් එක්ක කථා කරලා ඒවා විසඳ ගන්නවා. නමුත් මෙතැන සිද්ධියේ - මම අවංකව කියන්න ඕනෑ. මම කුහක දේශපාලඥයෙක් නොවෙයි. මගේ ළඟට එන මිනිස්සුන්ට මම කුහක කම් කරන්නේ නැහැ. ඔබතුමන්ලාටත් මම කරලා නැහැ. මෙතුමන්ලාටත් මම කරලා නැහැ. මට දෙන්න පුළුවන් රුපියලක් හරි තිබෙනවා නම් මම දීලා තිබෙනවා. මම සිරිකමල් ගරු මන්ත්‍රීතුමාට කිව්වේ ඒකයි. අර අම්මා දරුවන්ට කිරි ටික දෙන කොට ඒක ලොකු එකාට වෙනයි. පොඩි එකාට වෙනයි කියලා බෙදුවේ නැහැ. තනෙන් එන කිරි ටික එනවා වාගේ මේ පළාත් සභාවේ තිබුණු හැම රුපියලක්ම මම මහ ඇමති වුණු දවසේ සිට බෙදපු එක තමයි කළේ. මම ඒක අවංකවම කළා. කාටවත් දොස් කියන්න බැහැ. හැබැයි, අද මම කනගාටු වෙනවා. මගෙන් උදව් අරගෙන, මගෙන් උපකාර අරගෙන පෝෂණය වුණු අය අද මේ සභාවේ හැසිරෙන ආකාරය පිළිබඳව මම කනගාටු වෙනවා. මම ඉතාමත්ම කනගාටු වෙනවා. මම ලැජ්ජාවට පත් වෙනවා. අද මේ පළාත් සභාවේ මට වඩා ලොකු මහ ඇමතිවරු සිටියා. මට වඩා ලොකු මහ ඇමතිවරු මේ පළාත් සභාවේ සිටියා.

හැබැයි ඒ කිසි කෙනෙක් ගැන මම විවේචන කරන්නේ නැහැ. ඒ අය මේවා කරන්නේ නැහැ. හැබැයි ඒ හැම කෙනෙක්ටම වඩා මම මේ සභාවේ මන්ත්‍රීවරුන්ට මුදල් බෙදලා දුන්නා. ඒක කාටවත් නැහැයි කියන්න පුළුවන්කමක් නැහැ. මේ පරිපූරකය මම ගෙදර ගෙනියන්න නොවෙයි. මම තමුන්නාන්සේලාගෙන් අහනවා. මාදිවෙල රාහුල ඉස්කෝලේ කියන්නේ, අක්කර හතක් තිබෙනවා. මීටර් 400 දුවන ධාවන පථයක් අපට තිබෙනවාද? මට කියන්න බස්නාහිර පළාතේ ඉස්කෝලයක් තිබෙනවාද කියලා. මට කවුරු හරි කියන්න. මට කියන්න බස්නාහිර පළාතට පිහිණුම් තාටාංගණයක් තිබෙනවාද? මට කියන්න, නැහැ. එතකොට අපේ පළාතට මේ රජයේ සේවකයෝ -

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

පිහිනුම් තටාකයක් තිබෙනවා. කිරිල්ලවල.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

එහෙම බැලුවොත් එහෙම තිබෙනවා. මම අහන්නේ මේ පළාතට. ඉස්කෝලවලට නේ තිබෙන්නේ. අපි මහ ලොකු පළාත් සභාව. අපි බස්නාහිර ප්‍රමුඛ පළාත් සභාව. Smart class room අපට තිබෙනවාද? ජාත්‍යන්තර මට්ටමේ පිහිනුම් තටාංගණ අපට තිබෙනවාද? පොල්වත්තේ ක්‍රීඩාංගණයට ගොඩනැගිල්ල හදන්නේ මටද? මට ගෙනියන්නද? රජයේ සේවකයෝ බස්නාහිර පළාතට මාරුවීම් ලබලා එනවා. ඒ ගොල්ලෝ එන්නේ එක්කෝ පොළොන්නරුවේ රාජකීය විද්‍යාලයේ, එහෙම නැත්නම් දකුණේ තිබෙන ඉතා උසස් පාසල්වලින්. මේ සතර දිග් බාගෙන්. මේ ළමයාට ඉගෙන ගන්න පාසලක් කොළඹ තිබෙනවාද? Moodle school එකක් කොළඹ තිබෙනවාද? කාටද මේ කුහකකම් කරන්නේ? මාදිවෙල රහුල විද්‍යාලය - මට එහෙම තිබුණේ නැහැ. ඇත්තටම අපේ ප්‍රධාන ඉංජිනේරු රණසිංහ මහත්මයා තමයි කිව්වේ, “ළඟම පාසල හොඳම පාසලෙන්” ඒක ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා. ඔන්න මහ ඇමතිතුමා කරනවා නම් වැඩේ කියලා. හත් දෙයියනේ මම කරපු වැඩක් නොවෙයි. එහෙමනම් ඒ ගෞරවය යන්න ඕනෑ, ප්‍රධාන ඉංජිනේරුට. මට කියන්න තිබුණා, මම කියලා. එතුමා තමයි මට කිව්වේ, මේක කරමු කියලා. එතුමා තමයි මට යෝජනා කළේ. එතුමා දේශපාලනය කරන්නේ නැහැ නේ. හෙට අනිද්දා විශ්‍රාම යන්න ඉන්නේ. ඉතින් මේ මිලියන ගණන් දාන්නේ මටද? දැන් ආණ්ඩුකාරතුමා අපට එවලා තිබුණා, ඒ සම්පූර්ණ මුදල බැලුවොත් එහෙම දෙමළ ඉස්කෝලෙට මිලියන 80 ක්. මේකේ තිබෙනවා. මිලියන 80 ක්. මුස්ලිම් ඉස්කෝලවලට මිලියන ගණන් සල්ලි හම්බ වුණාද? කවුරු හරි මෙතැන ඉන්න මුස්ලිම් මන්ත්‍රීවරුයෙක් මට කියන්න. කවුරුහරි මෙතැන මුස්ලිම් මන්ත්‍රීවරයෙක් නැඟිටලා කියන්න කෝ මේ පළාත් සභාවේ මුස්ලිම් මන්ත්‍රීවරයෙකුට ඉස්කෝල හදන්න සල්ලි හම්බ වුණාද කියලා. මට කියන්න කෝ. මිලියන 80 ක් දීලා තිබෙනවා. ඔබතුමාගේ ඉස්කෝලෙටත් මම දෙන්නම් කිව්වා නේ. අපි ජාතියක් බැලුවේ නැහැ. අපි භේදයක් බැලුවේ නැහැ, ගරු සභාපතිතුමා. කාගෙන්ද මේ පළිගන්නේ? අර අපේ සහන් ගරු මන්ත්‍රීතුමා ඉන්න,

[ ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා ]

සහන් මන්ත්‍රීතුමාගේ මහර කොට්ඨාශයේ විද්‍යුහල්පති ඇවිල්ලා මාව හම්බ වුණා. වැලිපිල්ලෑව ප්‍රාථමික විද්‍යාලය. ලංකාවේ දෙවැනියා වුණා. උළු මෝලක ඉස්කෝලය තිබෙන්නේ. දැන් මම මේක කිව්වා, මහර කලාපයට. ඒකත් ඇවිල්ලා නැහැ, මේ ලැයිස්තුවට. ඒක නැහැ. සුනිල් ජයමිණි ගරු මන්ත්‍රීතුමා මේ සභාවේ නැහැ. නැඟිටලා ගියා. එතුමා ඉන්න පිළියන්දල කොට්ඨාශයේ හිරු එකෙන් කියලා මම ගියා, දැල්තර කණිෂ්ට විද්‍යාලයට. අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා. තහඩු මඩුවක ඉන්නේ. පිළියන්දල කලාපයට ඉඩ හුවමාරු කරගෙන තිබෙනවා කරන්න. තහඩු මඩුවක. මම ලැජ්ජා වෙනවා. මම කිව්වා, සිරසෙන් තිබෙන අර වැඩ සටහනට. ගම්මැද්දට මම කථා කරලා කිව්වා. බස්නාහිර පළාතේ තමුන්නාන්සේලාට වාර්තා වුණොත් ඒක තමුන්නාන්සේලා කරන්න යන්න එපා. ඒක අපට දෙන්න. අපි කරන්නම්. ඕගොල්ලන්ටත් ගෞරවයක් වන විධියට කියලා මම කිව්වා. මොකද, මේ පළාත් සභාව, සල්ලි තිබෙන පළාත් සභාවක්.

ගරු සභාපතිතුමා ඔය කයිය ගැහුවාට මේකේ ඉන්න නිලධාරී, ඔය ලොකු මහ ඇමතිවරුන්ටත් සල්ලි පෙන්නුවේ නැහැ. තේරුණාද කියන කථාව. හැබැයි මම එන කොටම මේකේ තිබෙන සල්ලි ටික දැනගෙන ආවේ. මට තමුන්නාන්සේලා කියන්නේ මේ සල්ලි ටික තියාගෙන ගෙදර යන්නද? මේ Deposit එක තිබෙන්නේ කාටද? මම මහරගම නගර සභාවේ අට කෝටි හැත්තෑ පන් ලක්ෂයක් තියලා ආවේ. මම සල්ලි කා දමන එක්කෙනෙක් නොවෙයි. මම කිව්වේ, මේකේ මිලියන 3000 ක් තියලා, මේකේ මිලියන 15,000 ක් තිබුණා. අපට මේකේ මිලියන 3000 ක් තිබුණාම ඇති, අපේ හයියට. ඉතුරු මුදල් ටික අපි වියදම් කරන්න ඕනෑ. තේරුණාද? ඒ නිසා මේවා ගැන කථා කරලා වැඩක් නැහැ. ඒ නිසා මම තමුන්නාන්සේලාට කියන්නේ, මමත් තමුන්නාන්සේලා වාගේ ඉඳලා ආපු එකෙක් නිසා තමුන්නාන්සේලාට එන හිත් වේදනාව දන්නවා. දුක දන්නවා. දැන් බලන්න. මම මහරගම මධ්‍ය මහ විද්‍යාලයට - රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා, මහරගම මධ්‍ය මහ විද්‍යාලයේ තිබෙන රංග ශාලාව ලුම්බිණී එක වාගේ හදන්නේ මහරගම හින්දා නොවෙයි. ඒ වාගේ හදන්න ශාලාවක් වෙන මොකක්ද අපට තිබෙන්නේ? අපට හදන්න. දැන් ලුම්බිණිය අපේද? ලුම්බිණිය ජාතික පාසලක්. ඒ නිසා මේ වාගේ කියනවා නම් හුඟක් දේවල් තිබෙනවා කියන්න. වැඩක් නැහැ. තමුන්නාන්සේලා මේකට ඡන්දය ප්‍රකාශ කරන නිසා මම කථා කරලා වැඩකුත් නැහැ. ඒ නිසා මේ පරිපූරකය මම දැම්මේ ඡන්දය බලාගෙන නොවෙයි. එතකොට අපි ප්‍රාදේශීය සභා මැතිවරණය පරාජය වෙලා තිබුණේ නැහැ. අපි අයවැයේදී තමයි තමුන්නාන්සේලාගේ එකඟතාවය අනුව ප්‍රකාශ කළේ. ඒ නිසා ඒ ගැන වැරැදි අවබෝධයක් තිබෙනවා නම් ඒක වැරැදියි. අනික් එක අපේ ඉස්කෝලවල ළමයින් ඉන්නේ Partition කරපු පන්ති කාමරවල. අර මෙතුමා කිව්ව මුස්ලිම් ඉස්කෝලේ ළමයි ඉන්නේ කන්ටේනර්වල. මුස්ලිම් ඉස්කෝලේ. ඉතින් මේවා අපි හදාගන්න ඕනෑ.

මම නිලධාරීන්ව පාවලා දෙන්නේ නැහැ. මම නිලධාරීන්ව ආරක්ෂා කරන දේශපාලඥයෙක්. හැබැයි, මේ වැඩේදී නිලධාරීන්ගෙන් අපට ලැබුණු සහයෝගය ඉතාමත් කනගාටුදායකයි. ඒ නිසා තමයි අද තමුන්නාන්සේලාට මෙතැන වේදිකාවක් වුණේ. මම කිව්වා, මේක පැහැදිලිව ව්‍යූහ කමිටුවලට යන්න. අන්තිම දවසෙත් මමයි ප්‍රධාන ලේකම්තුමයි, කැබිනට් මණ්ඩලයමයි කිව්වා, ඉක්මණට උපදේශක කාරක සභාව තියලා මේකට අනුමැතියක් ගන්න කියලා. ඒක කළේ නැහැ. හරිද ඇමතිතුමා? ඇමතිතුමා හරිද? අපි කිව්වා. ඒක කළේ නැහැ. ඒක වුණේ නැහැ. ඒ නිසා තමයි තමුන්නාන්සේලා අද මෙතැන සිට අපට චෝදනා කළේ. අනික් එක කොළොන්නාව මේ කිඳෙල්පිටිය මන්ත්‍රීතුමාගේ විතරක් නොවෙයි. කොළොන්නාවේ අපටත් අයිතියක් තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැදැයෝ ඉන්නවාද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැදැයෝ ඉන්නවා කියන්නේ, මගේ අම්මාගේ ගම නේ. හරිද? දැන් මම එක රැයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හිරුණිකාත් ඉන්නවා නේ කොළොන්නාවේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමා මේකට විරුද්ධ වෙලා යන්න. මට කමක් නැහැ. සිද්ධාර්ථ විද්‍යාලයේ ground එක. මගේ නංගි අවුරුදු දෙකක් ගිය ඉස්කෝලේ. සිද්ධාර්ථ විද්‍යාලය කියන්නේ - මගේ නංගිගේ හින්දා කියනවා නොවෙයි. මොකද අපටත් සම්බන්ධකම් තියනවා කියලා කියන්න ඕනෑ නේ. මේකේ යන්න බැහැ. මේ සිද්ධාර්ථ විද්‍යාලයේ ක්‍රීඩා පිටියට පොඩි වැස්සක් වැස්සත් යන්න බැහැ. අපේ බස්නාහිර පළාතේ තිබෙන ප්‍රධාන එල්ලේ ක්‍රීඩා පිටිය. අනික් එක ධූරධාරීන්ගේ වාහනවලට එවලේම - දැන් මම කියන්න ඕනෑ, මේ පළාත් සභාව ඇද ඇද තිබුණා. මේ පළාත් සභාවේ වැඩ ටික ඇද ඇද තිබුණා. ඒ නිසා මම කල්පනා කරලා මම අවුරුදු දෙකක් ගියාට පස්සේ, අර අවුරුදු 30 ක් ගියාට පස්සේ තරුණකම ගිහිල්ලා එන්නේ වාගේ, අවුරුදු දෙකක් ගියාම මට මේ පළාත් සභාවේ පෙණුනා මේ පළාත් සභාවේ වැඩ ඇදෙනවා කියලා. මම හොඳ දක්ෂ ප්‍රධාන ලේකම්වරයෙක් ගත්තා. දැන් අපි ඔක්කොම වැඩ ටික ඇදලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ වාහන අපි එක තත්පරෙන් කළා. ඒක අපට කරන්න පුළුවන් උපරිම වේගයකින් අපි කරලා තිබෙන්නේ. සභා ලේකම් කාර්යාලයේ වගකීම තමයි තමුන්නාන්සේලාගේ වාහන ටික අරන් දෙන එක. සල්ලි ටික දැන් ලැහැස්තියි කියන එක ප්‍රධාන ලේකම්, අපි කියලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා සමාවෙන්න. වාහන හතරක් තිබෙනවා නේද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ධූරධාරීන්ට අවශ්‍ය නම් ඕනෑ තරම් ගන්න පුළුවන්. ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. කාරණාව පැහැදිලියි. මන්ත්‍රීවරුන්ට කාරණාව පැහැදිලියි. ඒ නිසා තමුන්නාන්සේලා අද මෙතැන - ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් අහගන්න. ගරු සභාපතිතුමනි, මෙතැන අධ්‍යාපන ලේකම්තුමා ඉන්නවා. අධ්‍යාපන විෂයය භාර ඇමතිතුමා ඉන්නවා. අදින් සති දෙකක් ඇතුළත ගරු සභාපතිතුමනි, අදින් සති දෙකක් ඇතුළත සියලු ව්‍යුහ කමිටු රැස් වෙලා, අඩුපාඩු සකස් කරලා, මේ අවුරුද්දට කරන්න පුළුවන් ලේඛනයක් සකස් කරලා එවන්න. අද අපි කැබිනට් තීන්දුවක් ගන්නවා. අපි මේ ඉතිරි මුදල සම්බන්ධයෙන් අද අපි කැබිනට් තීන්දුවක් ගන්නවා. එතකොට සති දෙකක් ඇතුළත ඔබතුමන්ලා ආවොත් අපේ දැන් මේ ඇස්තමේන්තුවේ තිබෙන යෝජනාවලට - දැන් අපි ඇස්තමේන්තු සකස් කරලා, හෙට උදේට ටෙන්ඩර් එකට යන්න ලැහැස්තියි. මේ ව්‍යාපෘති සියලු දේවල් handle කරන්නේ මගේ අමාත්‍යාංශය යටතේ. අපේ ඉංජිනේරු අමාත්‍යාංශයෙන් කරන්නේ. ඒකත් මේ සභාවේ මන්ත්‍රීවරු දැනගන්න ඕනෑය කියලා කිව්වා නේ. ඒකත් දැනගන්න ඕනෑය කියලා කිව්වා නේද? හරිද? මේවායේ පාසල් ඉදිකිරීම් සම්පූර්ණයෙන් අපේ ප්‍රධාන ඉංජිනේරුතුමාගේ අධීක්ෂණය යටතේ කරන්නේ. ඒ නිසා ඒ ගැන තමුන්නාන්සේලාට කිසිම ගැටලුවක් නැහැ. හැබැයි, මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා. තමුන්නාන්සේලා මේ ව්‍යාපෘතිවලට ගිහිල්ලා ඉක්මන් කරලා, පුළුවන්තරම් කොන්ත්‍රාත්කරුවන්ව ඉක්මන් කරලා, විදුහල්පතිවරු උනන්දු කරලා මේක කරන්න. මම කොහොමත් ගල් ගැහුවේ, මම ගහන කොට මහරගම ගැහුවේ කොඩිකාර ගරු මන්ත්‍රීතුමා මෙතැන ඉඳගත්ත වෙලාවේ සිට මට විරුද්ධ වුණාට මම මහරගම කරපු හැම වැඩකම කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ නම දාලා තිබෙනවා. කොඩිකාරලා අපේ නම් දැම්මේ නැහැ. කොඩිකාර ගරු මන්ත්‍රීතුමා අපේ නම් දැම්මේ නැහැ. නමුත් අපි දාලා තිබෙනවා. අපි දන්නවා, දැන් අපි අවිස්සාවෙල්ල -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා කටයුතු ගරු ඇමතිතුමා, කාලය දීර්ඝ කරලා දෙන්න.

# රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, *"මෙම සභාව අවසන් වනතුරු කාලය දීර්ඝ කළ යුතු යැයි"* මම ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අපි හැමදාම අපේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ නම් දැම්මා. මන්ත්‍රීවරුන්ගේ විතරක් නොවෙයි. ගරු සභාපතිතුමනි, මම කියනවා නිලධාරීන්ගෙත් නම දාන්න ඕනෑ. මොකද ඒ මිනිස්සුත් යම් දෙයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විදුහල්පතිවරුන්ගෙත් නම් දාන්න ඕනෑ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඇත්තටම විදුහල්පතිවරුන්ගෙත් නම් දාන්න ඕනෑ. ඇත්තටම ඒ මිනිස්සුත් යම් දෙයක් කරනවා. ඇත්තටම විදුහල්පතිවරුත්, නිලධාරිනුත් වැඩක් කරනවා. ඒ අයගේ සහයෝගය නැත්නම් අපට වැඩක් කරන්න පුළුවන්ද? මේක කවුරු හරි නිලධාරීන් ටිකක් එකතු වෙලා ගත්තු කුහක තීන්දුවක්. මම නම් කියන්නේ, මම කරන වැඩවල විදුහල්පතිගෙත්, නිලධාරීන්ගෙත් නම දාන්න ඕනෑ. එතකොට ඒ ගොල්ලොත් ආසයි. ඒ ගොල්ලෝ ඉන්න නිල කාලය තුළ වැඩක් කළා කියලා. මම හිතන්නේ, ඒ සම්බන්ධයෙන් මේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නැහැ. මම හිතන්නේ ඒකත් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ නිසා මම ගැන වරදවා හිතන්න එපා. අපි ඡන්ද දිනනන්නත් පුළුවන්. ඉන්නත් පුළුවන්. මට ඕනෑ වුණේ, මහ ඇමති හැටියට පත් වුණු දවසේ සිට වැඩක් කරන්න. මම වැඩක් කරලා තිබෙනවා. ඕගොල්ලොත් එක්ක. තනියෙන් නොවෙයි. තනියෙන් ෆොටෝ ගහගෙන, තනියෙන් ගල් ගහගෙන නොවෙයි මම වැඩක් කරලා තිබෙන්නේ. මේ 104 දෙනාත් එක්ක එකතු වෙලා තමයි මම වැඩක් කරලා තිබෙන්නේ. ඒ නිසා මම මේවා කියන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේලා දන්නවා. ගරු සභාපතිතුමනි, මම ඉන්න වෙලාවේ මහරගම මම මොනවා හරි ටිකක් කර ගත්තේ නැත්නම් මිනිස්සු කියයි, මේ ගොල්ලෝ කියන විදියට යහපාලනෙන් හරි, හම්බ වුණු මහුලෙන් මම වැඩක් කරන්න එපැයි ගරු සභාපතිතුමා. අපේ අර අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා කියනවා වාගේ යහපාලනයෙන් හම්බ වුණු මේ වැඩෙන් මම මොනවා හරි කරන්න එපැයි ගරු සභාපතිතුමා. හරිද? ඒ නිසා මම මගේ වැඩේ කරලා තිබෙනවා. වැරැද්දක් තිබෙනවා නම් අපි නිවැරැදි කර ගනිමු. අපි ඔක්කොම එකතු වෙලා ගමනක් යමුයි කියලා ආයාචනය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමනි, සමාවෙන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, 36(1).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නොවෙයි. පිටිපස්සේ එක්කෙනා. වාඩි වෙන්න.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමනි, අර 3035 ට කිව්ව මිලියන 750 ත් එකතු කරලාද දැන් මේ අනුමත කරන්නේ?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔව්. ඔව්.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඒ ගණන කියලම දාන්න. ගණන කියලා දැම්මාම හරි නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ගරු ප්‍රධාන ඇමතිතුමා පැහැදිලිව කිව්වා නේ?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

සභාවේ ඉල්ලීම පරිදි මම හිතනවා, ඒ මිලියන 750 ත් ඇතුළත් කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි සංශෝධනය කරමු.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක හැබැයි, විධිමත් විධියට යන්න ඕනෑ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම කියන්නේ මිලියන 750 කට සීමා වෙන්න එපා. අපි ව්‍යූහ කමිටුවලින් යෝජනා අරගෙන ඒ අනුව - මොකද, ඒකයි වෙන්න ඕනෑ. නැත්නම් අන්තිමට මිලියන 750 කිව්වාම, ඊට වැඩි වුණොත් එහෙම සහන් මන්ත්‍රීතුමා. දැනට අපි සීමාවකට නොගිහින් යමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙමයි -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, 36(1). අපේ ගරු මහ ඇමතිතුමා කිව්වා ධූරධාරීන්ට වාහන ගන්න උදව් කළා කියලා. මොකද, අපේ වරප්‍රසාදයක් කඩ වෙලා තිබෙනවා. සෑම මහ ඇමතිවරයෙක්ම තමන්ගේ කාලයේදී අවුරුදු තුනකට ඉස්සෙල්ලා අපේ පර්මිට් එක අරන් දුන්නා. අපේ මහ ඇමතිතුමා ධූරධාරීන් ගැන කථා කරනවා. අපේ පර්මිට් එක ගැන කථා කරන්නේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

පර්මිට් එක දෙන්න කියලා අපි, මහ ඇමතිවරු මේ ළඟදී රැස් වුණු වෙලාවේදී අතිගරු ජනාධිපතිතුමා දැනුවත් කරලා තිබෙන්නේ. එතුමා ඒකට එකඟ වුණා. ඒ හින්දා ඔබතුමන්ලා කළබල වෙන්න එපා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථා කරන්න දෙන්න බැහැ.

**ගරු පංචරත්නම් රාම්**
Hon. Pancharathnam Ram

මේක ගොඩනැගිලි දියුණුව සඳහා පමණක් නොවෙයි. සනීපරක්ෂක කටයුතු සඳහාත් අපි මේ මුදල් පාවිච්චි කිරීම සඳහා ගරු මහ ඇමතිතුමාට යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳව - ගරු ප්‍රධාන අමාත්‍යතුමා අර පස්සේ ලබාදෙන මිලියන 750 ත් අපි මෙතැනට ඇතුළත් කරන්න ඕනෑ. අධ්‍යාපන ඇමතිතුමා කිව්ව විධියට ඒක අපට පස්සේ තීන්දු කරන්න බැහැ. අදම අපි මේකට එකතු කරලා අපි යන්න ඕනෑ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම කිව්වේ 750 යේ රුඳෙන්නේ නැතුව ටිකක් ඉස්සරහාට යන් කියලා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමා, 750 එකතු කරලා ගන්න. පස්සේ වැඩි වුණොත් බලමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පස්සේ වැඩි කරන්න බැහැ. පස්සේ අපට ඒක කරන්න බැහැ. ගණන අපි තීරණය කරමු.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මුදල් ඇමතිවරයා හැටියට මම කියන්න කැමැතියි. මිලියන 750 යේ සීමාවේ ඉන්න එක අපට හොඳයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර ලද පරිපූරක යෝජනාවට මන්ත්‍රීවරු ගොඩාක් කථා කළා. මම හිතන්නේ 75% ක් වාගේ කථා කළා. මමත් පුංචි අවස්ථාවක් ගන්නවා. මොකද, මමත් ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක්. ගම්පහ

දිස්ත්‍රික්කයේ ජ්‍යෝෂ්ඨතම මන්ත්‍රීවරයෙක්. ඒ නිසා ඔබතුමාගේ සංකල්පය හොඳයි. කොළඹට swimming pool එකක් හදනවා. කොළඹට මීටර් 400 ධාවන පථයක් හදනවා. ඉස්කෝලයක් හදනවා. ගම්පහටත් ඒ වාගේ දෙයක් තවමත් නැහැ. ඒ නිසා මම යෝජනා කරනවා, ගම්පහ දිස්ත්‍රික්කයටත්. කළුතර දිස්ත්‍රික්කයටත්. ඔබතුමාට ලොකු ගෞරවයක් ලැබෙනවා. ඔබතුමා මහ ඇමතිවරයා වශයෙන්. කවුරුත් ඒක කරලා නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දිස්ත්‍රික්කයේ නම් කරලා එවන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගම්පහ දිස්ත්‍රික්කයේ හොඳ ඉස්කෝලයක අපට රැස්වීම් ශාලාවක් නැහැ. අපි යන්න ඕනැ ජාතික පාසලකට. එක්කෝ රත්නාවලියට. එක්කෝ බණ්ඩාරනායකයට. අපට නැහැ. ඒ නිසා කරුණාකරලා ගම්පහ දිස්ත්‍රික්කයට එකක් දෙන්න. swimming pool එකක් දෙන්න. කළුතරටත් දෙන්න. මගේ අදහසයි මම ප්‍රකාශ කළේ. නැත්නම් මට කථා කරන්න අයිතියක් නැහැ නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒක පස්සේ. මේක සම්මත කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කළා. මන්ත්‍රීවරු රාශියක් කථා කළා. සංශෝධන කිහිපයක් ගරු මන්ත්‍රීවරුත් යෝජනා කළා. ඒ නිසා මේ සංශෝධන සහිත පරිපූරක යෝජනාවට සභාවේ එකඟතාවය මට ලබා දෙන්න.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මිලියන ගණන කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා මට ලබා දුන්නා. එතුමාගේ ඉල්ලීමක් මට ලබා දුන්නා. විපක්ෂයේ සහ සියලු ගරු මන්ත්‍රීවරු වෙනුවෙන්. ඒකේ මිලියන 750 ක මුදලක් එතුමා ඉල්ලලා තිබෙනවා, පරිපූරක ඇස්තමේන්තුවට අමතරව දෙන්න කියලා. ඒ නිසා කලින් තුන් දහස් ගණනයි, මේ 750 ක් එකතු කරලා -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයෙන් තමයි ඒ මිලියන 750 ඉල්ලන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔක්කොටම. මන්ත්‍රීවරු ඔක්කෝටම.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ එකඟතාවය ආවේ මේ මන්ත්‍රීවරු හැම කෙනෙක්ටම. මේ දවස් කිහිපයේ සාකච්ඡා කළා. අපට හොරෙන් සාකච්ඡා කළා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔක්කොටම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟයිද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි ඔබතුමන්ලා වාගේ තනියම කන්නේ නැහැ. හය වෙන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2018 වර්ෂයට අදාළ පරිපූරක ඇස්තමේන්තුව සංශෝධිතාකාරයෙන් සභා සම්මත වූ බව මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා. ඊළඟට එතුමාට ආරාධනා කරනවා ඒ හා සම්බන්ධ විසර්ජන ප්‍රඥප්තිය ඉදිරිපත් කරන ලෙසට.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

තව එකක් කියන්න ඕනෑ. නැත්නම් හරි නැහැ. අර 750 අපි සභාවේ එකඟතාවය දුන්නාට ඒක නීත්‍යානුකූල වන්නේ, අපි කැබිනට් මණ්ඩලය රැස් කරලා ඒක ආණ්ඩුකාරයාගෙන් එක්හත්වය ගත්තාම. දැනුවත් වෙන්න ඕනෑ. නැත්නම් වැරැදි මතයක් යනවා. අපි මේ පරිපූරකයටත් එකඟතාවය ගත්තේ අයවැය වෙලාවේ සභාවෙන් නේ? ඔබතුමන්ලාගේ එකඟතාවය ඇවිල්ලා තිබෙනවා. දැන් අපට පුළුවන්කැබිනට් මණ්ඩලය හැටියට - අදම කැබිනට් මණ්ඩලය රැස් වෙනවා. එහිදී අපි මිලියන 750 ට තීන්දුව ගන්නවා. හරි නේ පැහැදිලියි නේද?

## 2018 පරිපූරක ඇස්තමේන්තුව - **0**1 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය
## APPROPRIATION STATUTE RELEVANT TO THE SUPPLEMENTARY ESTIMATE - 01 - 2018

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

*2018 පරිපූරක ඇස්තමේන්තුව - 01 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය සංශෝධිතාකාරයෙන් ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***
*Question, as amended was put and adopted*

## අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම : 2017 වර්ෂය
## AMENDING THE LIMITS OF ADVANCE ACCOUNTS : YEAR 2017

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි**,** *"අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2017 නැමැති උපලේඛනයේ දැක්වෙන පරිදි, අත්තිකාරම් සීමා සංශෝධනය කිරීමේදී, 2016 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තියේ 07 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇති හෙයින්ද,*

*එම සංශෝධනයන් සිදු කිරීම සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සභාවේ අනුමැතියට යටත්ව ලබා දී ඇති හෙයින් ද, එම උපලේඛනයේ දැක්වෙන පරිදි එක් එක් අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කරයි."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවේ එකඟතාවය?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව එම ගිණුම් සංශෝධන සභා සම්මත වූ බව ප්‍රකාශ කර සිටිනවා.

මම ඊළඟට ආරාධනා කරනවා ගරු සභා කටයුතු අමාත්‍යතුමාට නව කාර්යපටිපාටි රීති සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කිරීමට.

## නව කාර්යපටිපාටි රීති
NEW RULES OF PROCEDURE

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

,ගරු සභාපතිතුමනි*"2018 මාර්තු මස 20 වන දින එනම් අද දින, 2018 ජනවාරි මස 09 වන දින නිල වාර්තාව සමග ඇමුණුමක් ලෙස සභාගත කරනු ලබන - 1997 ඔක්තෝබර් 09 වන දින බලාත්මක වූ රීති මාලා පුස්තකයට ඉදිරිපත් කරන ලද සියලුම සංශෝධනයන් ඇතුළත්ව 2017 නොවැම්බර් මස 07 වන දින සභාවට ඉදිරිපත් කොට, 2017 නොවැම්බර් මස 14 වන දින සහ 2018 ජනවාරි මස 09 වන දින සාකච්ඡා කොට 2018 ජනවාරි මස 19 වන දින සභා සම්මත වූ නව කාර්ය පටිපාටි රීති මාලා පුස්තකයේ ඇතුළත් මෙම සියලු රීතීන් 2018 මැයි මස 08 වන දින සිට බලපැත්විය යුතුය."*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවේ එකඟතාවය?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව එම කාර්යපටිපාටි රීතිත් බොහෝ කාලයක් සිට මම හිතන්නේ අවුරුදු ගණනාවක් තිස්සේ අපි වරින් වර සාකච්ඡා කරලා බොහොම අමාරුවෙන් තමයි අවසාන තීරණයකට ආවේ. අපි බස්නාහිර පළාතේ රීති සංග්‍රහයක් හදලා තිබෙනවා. මම හිතන්නේ ගොඩක් අය සභාය දැක් වූවා. නම් කියන්න ගියොත් කාලය ප්‍රශ්නයක් වෙනවා. ඒ සඳහා නායකත්වය ලබා දුන්නු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට සභාපතිවරයා වශයෙන් මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ අවස්ථාවේ සභා සම්මත කිරීමටත් සහාය දැක් වූ ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු අමාත්‍යතුමන්ලා, විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාටත් මගේ ගෞරවය ස්තුතිය පුද කර සිටිනවා. අලුත් රීති පොත අපට එළි දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව. ඉදිරි කාලය තුළ දී අපි අංග සම්පූර්ණ රීති පොත අපි නියම ආකාරයෙන් සකස් කරලා සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට ලැබෙන්න සලස්වනවා.

න්‍යාය පත්‍රයානුකූලව අපේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු යටතේ යෝජනා දෙකක් තිබෙනවා. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ගන්න විධියක් නැහැ. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාවත්, එතුමිය නැහැ. යෝජනා දෙකම එතුමියගෙමයි. අපි ඊළඟ සභාවට යෝජනා දෙක ඉදිරිපත් කරනවා. න්‍යාය පත්‍රානුකූලව වැඩ අවසන් වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, -

## කල් තැබීම
ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.41 ට, 2018 අප්‍රේල් මස 03 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 01.41 p.m till 9.30 a.m. on 03.04.2018*